## 2018.10.02 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දූවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. **09.30**ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී ☸

**(01)**

**01:01 2018 – 09 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

**2018 – 09 – 04** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ ඒ අනුව **2018- 09- 04** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**01:02 2018 – 09 – 26** දින පවත්වන ලද විශේෂ සභා වාර්තාව සභා සම්මත කිරීම

**2018 – 09 – 26** දින පවත්වන ලද විශේෂ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී ජී .සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** නැත

**(03)** **ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**03:01** **" අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංකීර්ණය ඉදි කිරීම"** සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් 2018.09.05 දිනැතිව ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගතකරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා අප සභාව සතු හල්වතුර ව්‍යාපෘතියේ කැබලි අංක 61 සහ කැබලි අංක 41 සිට 46 දක්වා වූ ඉඩම් කැබලි වල පිඹුරුපත් නිවැරදි අනුපාත වලින් සකස් කර දිස්ත්‍රික් ඉංජිනේරු වෙත ලබා දීමට සිදුව ඇති බැවින් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් මැනීම් සිදුකර පිඹුරුපත් සකස් කර ගැනීමට අප සභාවේ එකගතාවය ලබාදෙන ලෙස ඉල්ලීමක් කර තිබුනි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ සඳහා හිලව් වෙන්න අපට ලබා දෙන්නේ කුමක්ද කියා දැනුම්දීමක් කර තිබෙනවාද? ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන් තීරණය කළේ අප සභාවෙන් ඉඩම් කොටස් දෙකක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දීමටයි. අප මීට පෙරත් ඉල්ලීමක් කළා ඒ සඳහා හිලව් කිරීමක් වශයෙන් අපට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ලබා දෙන ලෙසට.නමුත් ඒ සම්බන්ධව මෙම ලිපියේ කිසිදු සටහනක් වෙලා නෑ. ගරු සභාපතිතුමා දෙන්න හදන්නෙ අප සභාව සතු විශාල වත්කමක්.ඒ නිසා ඒ සඳහා හිලව් වන ඒ හා සමාන වටිනාකමක් ඇති භූමියක් අපට ලබා ගැනීමේ පොරොන්දුව මා ඔබතුමන්ට භාර දෙනවා.ඒ අනුව ඒ සම්බන්ධව හිලව් වන දෙයක් අපට ලබා ගැනීම සඳහා කටයුතු කරන ලෙස ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

නගර මධ්‍යයේ ඇති මෙම බිම් කොටස අපේ නගර සභාවේ අගනා සම්පතක්.උප සභාපතිතුමා කියූ පරිදි මෙම බිම් කොටස වෙනුවට හිලව් කිරීමක් තමයි කථිකා කළේ.නමුත් ප්‍රාදේශීය ලේකම්තුමිය හිලව් කිරීමක් සම්බන්ධයෙන් කිසිදු සඳහනක් කර නෑ.එතුමිය කියා සිටින්නේ මෙම යෝජනාව අමාත්‍යාශයට දැන්වීම පමණක් සිදු කරන බවයි.එම නිසා මෙම සම්පත පිළිබඳව මීට වඩා සිතා බලා හිලව් කිරීමකින් තොරව මෙය දීමට සුදුසු නැති බව තමයි අපගේ අදහස.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එම අදහස මාද තහවුරු කරනවා.මම හිතන විදියට එහි තිබෙන්නේ අපට ලැබෙන රජයේ තක්සේරුව. එසේ වුනොත් අපේ සභාවට විශාල පාඩුවක් සිදු වෙනවා.අප මූලික රැස්වීමේදී තීරණය කළේ අපට හිලව්වට දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවතින බිම්කොටස ලබාදීමේ පදනම මත තමයි මෙය ක්‍රියත්මක කරන්නේ කියා.ඒ නිසා හිලව්වට එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය නොලැබෙනම් අපට විශාල පාඩුවක් විඳීමට සිදුවන නිසා ඒ ගැන ඔබතුමන්ගේ කාරුණික අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

මේ නගර සභාව සතු ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කිරීමට ගැනීමේදී , ඒ සම්බන්ධව අපි ප්‍රාදේශීය ලේකම්තුමිය සමගත් ගරු වජිර අබේවර්ධන මැතිතුමා සමගත් සාකච්ඡා කළා.මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමියට තනි තීරණයක් ගත නොහැකියි.එහිදී රජයේ ඇස්තමේන්තුව අනුව නගර සභාව සතු ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දෙන්නේනම් එවිට රජයේ

ඇස්තමේන්තුවක් ලබා දෙනවා.ඒ අනුව උදාහරණයක් ලෙස හල්වතුර ඉඩම් සඳහා ඇස්තමේන්තුව ලක්ෂ 200ක් වුනොත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල බිම් කොටස ලක්ෂ 500ක් වුනොත් ,එවිට හිලව් වන ලක්ෂ 300ක් රජයේ ඇස්තමේන්තුව අනුව අපට ගෙවන්න සිදු වෙනවා.ඒ නිසා එවැනි ගැටලු කීපයක් පැන නගින නිසාත්, තවම අවසන් නිගමනයකට නොපැමිණි නිසාත් මේ කාර්යය ප්‍රමාද වීම මත අම්බලන්ගොඩ ජනතාවත් විශාල ගැටලු වලට මුහුණ පා සිටිනවා.එම නිසා මේ ඉඩම් හුවමාරුවේදී යම් යම් ගැටලු මතුවන නිසා යම් ප්‍රමාදයක් සිදුවනවා නම් මා ප්‍රාදේශීය ලේකම්තුමියට යෝජනාවක් ලෙස ඉදිරිපත් කළා ඊට ඉදිරිපස ඇති පරණ ගොඩනැගිල්ල කඩා එහි තට්ටු 6ක හෝ 7ක ගොඩනැගිල්ලක් ඉදි කිරීමටත්, පිටුපස ඇති පැරණි ගොඩනැගිල්ල තාවකාලිකව කාර්යාලය ලෙස භාවිතා කිරීම සුදුසු බවටත්.හේතුව මේ කාර්යය ප්‍රමාද වීමෙන් මේ සඳහා වෙන් කළ මුදල් නැවත මහා භාණ්ඩාගාරයට ගියොත් එය අපට ගැටලුවක් වනවා ලබන වසරේදී මුදල් වෙන් කර ගැනීම සඳහා.මේ හිලව් කිරීමේදී අපිට දරන්න වන වියදම ගැනත් හිතන්න වෙනවා.මම දරන මතය ඇත්තෙන්ම නගර සභාවට තමයි එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ගත යුත්තේ.මොකද ගාලු පාර අයිනේ නිසා අපට එහි විශාල වටිනාකමක් තිබෙනවා.නමුත් රජයේ දෙපාර්තමේන්තු වුනත් කවදාවත් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඕක නගර සභාවට නිකන් දෙන්නේ නෑ.පළාත් පාලන අමාත්‍යාංශය නගර සභාව සතු දේපලක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට නිකන් දෙන්නෙත් නෑ.රජයේ ඇස්තමේන්තු සමග යාමේදී මේ කටයුත්ත ප්‍රමාද වන බව මා ප්‍රාදේශීය ලේකම්තුමියට කිව්වා.ඒ නිසා අපි මේ අවුරුද්දේ මුල්ගල තබා හැකි ඉක්මනින් තට්ටු 6කට එම ගොඩනැගිල්ල ඉදි කරනවා.ලේකම් තුමියත් මාත් ගිය සතියේ කතා කරලා ගත්ත තීරණය වන්නේ, ලේකම්තුමාගෙන් හා ස්වදේශ කටයුතු ඇමතිවරයාගෙන් උපදෙස් අරන් ඉදිරියේ ඇති පරණ ගොඩනැගිල්ල කඩා ඉවත් කර පහතින් රථගාල සහිතව තට්ටු 6ක නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමටයි.එය අප එළඹෙන සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරනවා.මෙය ප්‍රමාද වුනොත් අපට මේ වෙන් කළ මුදල් වලින් මේ කාර්යය කර ගන්න නොහැකි වනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එසේනම් මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම අවශ්‍ය නොවන බව මා ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය අම්බලන්ගොඩ නගර සභාව සතු, කරිත්තකන්ද ග්‍රාම නිළධාරී කොට්ඨාශයට අයත් භූමි කොටසක්.එම කොට්ඨාශය අයත් මන්ත්‍රීවරයා වශයෙන් මා මේ සම්බන්ධව ප්‍රකාශයක් කළයුතු වනවා.මේ සම්බන්ධයෙන් ජනතාවගේ යම් යම් විරුද්ධතා තිබිය හැකියි.අපි ඒවා සමනය කර ගත්තත් රාජ්‍ය අවශ්‍යතාවය මත අප වගකීමකට බැදී තිබෙනවා රජය ඉල්ලන අවස්ථාවකදී ඒ අවශ්‍යතාවය අනුව කටයුතු කරන්න.එසේ නැතත් රජයට බලය තිබෙනවා එය පවරා ගැනීම හෝ සිදුකිරීමට.එසේ තිබියදීත් දැන් සුහද මට්ටමින් මෙය ඉල්ලීම තුළ ඩෙනට් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ පරිදි රාජ්‍ය ආයතන වලින් මෙය හුවමාරු වීමේදී තක්සේරු අතර වන වෙනස ගෙවීමට අප සභාවට හැකියාවක් නෑ.අපට ඒ ගැන කථා කිරීමේ අවශ්‍යතාවයක්ද නෑ.ඒ ප්‍රදේශයේ පර්චස් එකක් ලක්ෂ 40ක් පමණ වනවා.මම අදහස් කරනවා අම්බලන්ගොඩ හල්වතුර යෝජනා ක්‍රමයේ තක්සේරුව, රජයේ පැරණි තක්සේරු ක්‍රමයට කරන්නේනම් එය ලක්ෂ දෙක තුනකටවත් තක්සේරු කරන්නේ නෑ.නමුත් නව තක්සේරු ක්‍රමයට අනුව එහි මූල්‍ය වටිනාකම පර්චස් එකක් ලක්ෂ 10ක් වනවා.එම වටිනාකම ගෙවීම ප්‍රාදේශීය ලේකම්තුමිය, ඇමතිවරයා ඇතුලු අදාළ පාර්ශවයන්ගේ එකගතාවය පල කළ යුතුව තිබෙනවා..අපි දෙන්නෙත් වටිනා දේපළක්.මෙහි වර්තමාන වාණිජමය වටිනාකම පර්චස් එකක් ලක්ෂ 10ක් වනවා.ඒ අනුව ඒ හා සමාන ඉඩම් ප්‍රමාණයක් අප සභාව සතු කර ගැනීමේ හැකියාව තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමියට කළ හැක්කේ මේ සම්බන්ධයෙන් අප සභාවෙන් ඉල්ලීමක් කිරීම පමණයි.නමුත් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අප මෙහි අනුමැතිය දිය යුතුව තිබෙනවා.මන්ත්‍රීවරුන්ගෙන් ඔබතුමා ඉල්ලා සිටින්නේ මෙම ඉඩම ලබා දීම සඳහා ඔවුන්ගේ කැමැත්ත.නමුත් මේ සඳහා නොයෙකුත් කොන්දේසි තිබෙනවා.මොකද මන්ත්‍රීවරු නියෝජනය කරන්නේ මහජන දේපල.එහිදී තීරණ ගැනීමේදී සියලු මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා.මා දන්නා තරමින් එක් රාජ්‍ය ආයතනයකින් තවත් රාජ්‍ය ආයතනයකට ඉඩම් පැවරීමේ කිසිදු සුහදතාවයක් නෑ.මීට පෙර ගරු වජිර අබේවර්ධන මැතිතුමා රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා ලෙස කටයුතු කරන වකවානුවේ එතුමා යටතේ පැවති වාරිමාර්ගයට අයත් ඉඩමක්, ඒ වකවනුවේ සිටි සභාපතිතුමා අරගෙන එහි මහ ලේකම් කාර්යාල ගොඩනැල්ලක් (නගර සභාවේ සියලුම ආයතනද ඇතුලත්ව) ඉදි කිරීමට සැලසුම් කලා.නමුත් ඇමතිතුමාටත් හැකියාව ලැබුනේ නෑ ඒ අවස්ථාවේ එකී වාරිමාර්ග ඉඩම නිදහස් කර ගැනීමට.ඒ අනුව මේ කාරණාව අපි සරලව බැහැර කරන්නේ නෑ.රජයේ ඉල්ලීමක් වුනත් මේ ඉඩම පරිත්‍යාග කිරීමේදී අපිට සරල වෙන්න බෑ.ඒ නිසා රජයේ තක්සේරුව අනුව අපි පරිත්‍යාග කරන

ඉඩමේ වටිනාකම අප වෙත ලබා දෙන්නේනම් පමණක් මෙම ඉඩම ලබාදෙන ලෙස මා යෝජනා කර සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එසේනම් දැනට තිබෙන තත්වය අනුව මේ ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බැලීමේ අවශ්‍යතාවයක් නොමැති බවයි හැගෙන්නේ.මා මේ පිළිබදව සලකා බැලුවෙත් අම්බලන්ගොඩට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම අපගේත් වගකීමක් නිසා.මොකද එය අපේ නගර වැසියන් සේවාව ලබා ගන්නා ස්ථානයක් නිසා. නමුත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් වෙනත් පියවරක් ගන්නා නිසා මේ පිළිබද පසුව අවශ්‍ය වුවහොත් කථා කිරීමට මා තීන්දු කර සිටිනවා.

**තීරණය -**

**අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාල සංකිර්ණය ඉදිකිරිම මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් විසින් කර ඇති ඉල්ලිම සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව දැනට මේ සම්බන්ධව අමාත්‍යාංශය විසින් පියවරක් ගනු ලබන බැවින් මෙම ඉල්ලිම සලකා බැලීමේ අවශ්‍යතාවයක් නොමැති බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදි**

**03:02** **" 'දිගුකල් පවතින සොදුරු නිවහනක්' , ගොඩනැගිලි සායනය දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සදහා අනුමැතිය ලබා ගැනීම"** වෙනුවෙන් දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් 2018.09.10 දාතමින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගේ මග පෙන්වීම යටතේ 2018.09.18 දින ගාලු ක්‍රීඩා මණ්ඩපයේදී පැවැත්වීමට නියමිත ගොඩනැගිලි සායනයෙහි පූර්ව ප්‍රචාරක කටයුතු සදහා අම්බලන්ගොඩ බස් නැවතුම් පොළ ඉදිරිපිට දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.මෙය සභා අනුමැතියට යටත්ව අනුමත කර තිබෙනවා.ඒ අනුව ඒ සදහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර සිටිනවා.

**තීරණය -**

**දිගු කල් පවතින සොදුරු නිවහනක් ගොඩනැගිලි සායනයෙහි (Building Clinic) පූර්ව ප්‍රචාරක කටයුතු වෙනුවෙන් නොමිලේ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සදහා අවසර ලබාදෙන ලෙසට පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලිම සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**03:03** **"ආර්.ඊ. ද සිල්වා මාවත නගර සභාවට පවරා ගැනීම "** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද 2018.09.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ආර්.ඊ.ද සිල්වා මාවත කොන්ක්‍රීට් කිරීමට අදාළව රු.400000/= ක් වූ ඇස්තමේන්තුව 2018.07.03 සභාවෙන් අනුමත වී ඇති අතර මෙම මාර්ගය පවරා ගැනීම සදහා අනුමැතිය ඉල්ලා ඇත.

**තීරණය -**

**ආර්.ඊ.ද සිල්වා මාවත හරස් පාරට මුහුණලා ඇති පාර නගර සභා පාරක් වශයෙන් ප්‍රකාශයට පත් කිරිම සදහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාව් ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03:04 ‘ සුනඛ රැදවුම් මධ්‍යස්ථානයක් සඳහා අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් ඉඩමක් වෙන් කර ගැනීම’** මැයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ (දකුණු පළාත) විසින් 2018.09.04 දාතමින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අයාලේ යන සුනඛයින්ගෙන් මහජනතාවට වන පීඩාවන් අවම කිරීම සහ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා සුනඛ රැදවුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීමට අම්බලන්ගොඩ තල්ගස්ගොඩ ප්‍රදේශයෙන් අක්කරයක පමණ භූමියක් ලබා දීමට එකගතාවය පල කිරීම සම්බන්ධයෙන් අප හට ස්තූතිය පිරිනමා ඇති අතර, සුනඛ රැදවුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා ඉටු කළයුතු අවශ්‍යතා කීපයක්ද අදාළ ලිපියේ සඳහන්ව තිබුණි.

එමෙන්ම මීට පෙර මෙම භූමිය ආශ්‍රිතව කසළ කළමණාකරණ ව්‍යාපෘතියක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද මහජන විරෝධය මත එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් , මෙම කාර්යය සඳහාද නැවත එවැනි ප්‍රදේශවාසීන්ගේ විරෝධයක් ඇති නොවන ආකාරයට ඔවුන් දැනුවත් කිරීම සඳහා අප සභාවේත් මහජන නියෝජිතයන්ගේත් සහාය බලාපොරොත්තු වන බවත් දන්වා ඇති අතර , මෙම වැඩසටහන නගර සභාව හා දකුණු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කිරීමට යෝජනා කර ඇති බවද දන්වා තිබුණි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මෙම සුනඛ මධ්‍යස්ථානය සකස් කිරීම පිළිබඳව මගේ දැඩි විරුද්ධතාවය ප්‍රකාශ කර සිටිනවා.මෙම භූමිය තිබෙන්නේ සුනාමි නිවාස 125ක් පමණ මධ්‍යයේ.අනෙක් පැත්තේ තල්ගස්ගොඩ පැරණි ගම්මානය තිබෙනවා.එය හරියටම මැද්දේ පිහිටා තිබෙන භූමියක්.ඒ නිසා මීට පෙර කුණු දැමීමටත් (කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා) ගම්වාසීන් විරුද්ධ වුනා.ඒ ප්‍රදේශයේ සිටින්නේ සුනාමි ව්‍යවසනයට ලක්වුන මිනිසුන්.ඒ නිසා සුනඛයින් 5000ක් , 6000ක් දමනවා කියන්නේ ඒ ජනතාවට විශාල කරදරයක්.එදා සමිතිය පිහිටුවන ලද අවස්ථාවේ මේ ගැන කථා කළ නිසා මිනිස්සු බයවෙලා අපේ නිවසටත් පැමිණ මගෙන් මේ ගැන ප්‍රශ්න කළා.ඒ නිසා මෙම කාර්යය සඳහා මගේ විරුද්ධතාවය ප්‍රකාශ කර සිටින අතර ඒ ප්‍රදේශයේ එය ඉදි කරන්න එපා කියා මා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.අම්බලන්ගොඩ කියන්නේ සීමිත ඉඩ ප්‍රමාණයක් තිබෙන ජනාකීර්ණ නගරයක්.මීට වඩා විශාල බිම් ප්‍රමාණ තිබෙන ඉඩම් තිබෙනවා.උදාහරණයක් ලෙස රත්ගම, මොන්රෝවියාවත්ත ඒ කැළි කසළ දමන භූමියේ විශාල බිම් කොටස් ප්‍රමාණයක් තිබෙනවා.සුනඛ මධ්‍යස්ථානය අම්බලන්ගොඩ නගරයට පමණක් ඉදිකරත් මුලු දකුණු පළාතෙම සුනඛයන් ගෙනැවිත් දමන එක වළක්වන්න බැරි වේවි.සුනඛයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් තල්ගස්ගොඩ ජනතාවගේ සෞඛ්‍ය තත්වයට, ජීවන රටාවට හිරිහැරයක් වනවාට මා කැමති නෑ.ඒ නිසා මේ සම්බන්ධයෙන් මගේ දැඩි විරෝධතාවය පළ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රෙෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, සුනඛයා විටෙක සම්පතක් වනවා.නමුත් තවත් විටෙක ජලභීතිකාව නිසා උවදුරක් බවට හැරෙනවා.පසුගිය දවසක සුනඛයකු නිසා දරුවකුගේ අන්තිම මොහොතද මා බලපිටිය මහ රෝහලේදී දුටුවා.මේ පිළිබඳව පළාත් සෞඛ්‍ය ප්‍රධානියාට හැඟීමක් ඇතිවන ආකාරයට මේ සතුන්ගෙන් අපේ ජනතාවට වන හානිය වළක්වා ගැනීමට ඔබතුමාට යම් පියවරක් තබන ලෙස ඉල්ලා සිටිනවා.මේ කාරණයේදී අපි ගරු උප සභාපති කමල් මහතාට දොස් පවරන්නේ නෑ.මොකද ජන නායකයෙක් හැටියට ඔහු ජනතාවට ඇහුම්කන් දිය යුතුයි.මේ නගර සීමාවේ සුනඛයින් එමටයි. ඒ නිසා මේ පිළිබඳ අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවූ අවස්ථාවේ ඉන් ප්‍රයෝජනය අරගෙන ,සුනඛ රැදවුම් මධ්‍යස්ථානයක් කෙසේ හෝ ඉදිකළ යුතුයි.මේ බෞද්ධ රටේ සත්ව අවිහිංසාව පිළිබඳ පණිවිඩය මතු කිරීමත් වැදගත් වනවා.ඔබතුමන් ප්‍රඥාවන්ත නගරාධිපතිවරයකු හැටියට මේ යෝජනාව පිළිබඳ මතු කිරීම ගැන අපගේ ප්‍රණාමය පළ කර සිටින අතර මේ එලදායී යෝජනාවට කෙසේ හෝ භූමියක් සොයා ගැනීමටත්,හල්වතුර ව්‍යාපෘතියේ හෝ වේදිකාවක් ලෙස යම් තැනක් ඉදි කිරීමට හැකිනම් ඒ ගැන සොයා බලන ලෙසත් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් අපි යෝජනා කළ හේතුව වන්නේ, සාමාන්‍යයෙන් ගණනය කර තිබෙනවා ජනතාවගෙන් 08 දෙනෙකුට එක් සුනඛයෙක් සිටින බව.ඒ අනුව අම්බලන්ගොඩ නගරයේ අයාලේ

යන සුනඛයින් 2000ක් පමණ සිටින බව සෞඛ්‍ය අංශයෙන් මා හට දැනුම් දී තිබෙනවා.ඒ අනුව ජල භීතිකා රෝගය වැළැක්වීම සඳහා නගර සභා ආඥා පනතින් මූලික නීත්‍යානුකූල පසුබිම ලබා දී තිබෙන්නේ නගර සභාවටයි.ඒ අනුව සෑම වර්ෂයකම අපි ජල භීතිකා රෝගය වැළැක්වීම සඳහා අයවැය මගින්ද මුදල් වෙන්කොට තිබෙනවා.පසුගිය වර්ෂයේත් ඊට පෙර වර්ෂයේත් ජල භීතිකා රෝගය සඳහා අම්බලන්ගොඩ නගර සභාවෙන් වියදම් කර තිබෙන්නේ රු.8000 ක් පමණයි. ඒ මුදල් වියදම් කර තිබෙන්නේත් එන්නත් විදීමට පැමිණි වෛද්‍යවරුන්ගේත් හෙදියන්ගේත් සංග්‍රහ කටයුතු සඳහා.ඒ නිසා අපගේ වගකීමක් වනවා අයාලේ යන සුනඛයින් එක් තැනකට අල්ලාගෙන ගොස් ඔවුන් වන්දි කරන ක්‍රමවේදයක් අනුගමනය කොට ඔවුන් මැරෙන තුරුම රැකබලා ගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම.සෞඛ්‍ය කමිටුවේදී කථිකා කළ පරිදි සුනඛයින් මැරීමේ ප්‍රතිපත්තියෙන් ඉවත් වී ජල භීතිකා රෝගය තුරන් කිරීමේ එකම පිළියම වන්නේ මෙවැනි සුනඛ සුරැකුම් මධ්‍යස්ථානයක් ඇති කිරීමයි.හල්වතුර ව්‍යාපෘතියේ අක්කරයක පමණ ප්‍රමාණයක් තිබෙනවා කිසිම කාර්ය භාරයක් නොකර.

එය පරීක්ෂා කිරීම සඳහා එදිනම මා පශු වෛද්‍යතුමිය සමග එම ස්ථානයට ගියා.ඉන්පසු සති දෙකක් ඇතුළත පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා ඇතුලු එම වෛද්‍යවරුන් පැමිණ මෙය නිරීක්ෂණය කළා.අද වනවිට ලංකාවේ කිසිම තැනක මෙවැනි සුරැකුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වී නෑ.එමනිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට රජය සහ පළාත් පාලන ආයතනයක් එක්ව සුනඛයින් මැරීමේ ප්‍රතිපත්තියෙන් ඉවත්ව මෙවැනි සුරැකුම් මධ්‍යස්ථානයක් ඇති කිරීමට තීරණය කොට තිබෙනවා.සුනාමියෙන් පසු දැන් තල්ගස්ගොඩ ප්‍රදේශයේ ජීවත් වුනත් ඒ ඉන්නේ මගෙත් හිතවත් පිරිස.ඒ නිසා මාත් මුල සිටම මෙමගින් ජනතාවට සිදුවන අවහිරතාවය පිළිබඳව සොයා බැලුවා.ජල භීතිකාව වැළැක්වීමේ වගකීම පනත මගින් පැවරී තිබෙන්නේ අදාළ පළාත් පාලන ආයතනයට.එම නිසා මෙම නගර සභා සීමාව ඇතුළත යම් පුද්ගලයකුට හෝ ජල භීතිකාව මත අනතුරක් සිදුවුනොත් එහි වගකීම පැවරෙන්නේ නගර සභාවටයි.කසළ කළමණාකරණ ව්‍යාපෘතියක් සඳහා අක්කර හතරහමාරක් වූ මෙම ඉඩම රු.දහනවලක්ෂ තිස්දහසක් ගෙවා මම සභාවට මිලදී ගත්තේ 1998 වර්ෂයේදී.ඉන්පසු සුනාමි ව්‍යවසනයේදී එනම් මා විපක්ෂ නායක ලෙස කටයුතු කරන වකවානුවේ නගර සභාව මගින් එම සුනාමි නිවාස ඉදිකිරීම සඳහා මෙම ඉඩම පැවරුවා.ඒ අවස්ථාවේදී මා අසා සිටියේ **7500 කට කුණුද, 50 කට ගෙවල්ද** කියා.ඒ අවස්ථාවේ කසළ කළමණාකරණය සඳහා ලබාගත් ඒ භූමිය අපට අහිමි වුනා.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒ වෙනුවට අපට ඉඩමක් ලබාදෙන බව ප්‍රකාශ කළත් අද වන තුරු අපට ලැබුනේ නෑ.මම අවුරුදු 21ක් නගරාධිපතිධූරය දැරුවා.ඒ කාලය තුළ සභාව විසින් මුදල් ගෙවා සුනඛයින් 1000 කට වඩා මරලා තිබෙනවා.ඒ අනුව කරපු වරද නිවැරදි කර ගැනීමේ අදහසින් හෝ මෙම කාර්යයක් ඉටු කළ යුතුයි.ඒ නිසා මේ යෝජනාව සඵල කර කර ගැනීම සඳහා සුභවාදීව කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමා කියූ පරිදි සතුන් මරන එක බෞද්ධයෝ හැටියට අපි විරුද්ධ දෙයක්.කමල් වැල්ලගේ මහතා කියූ පරිදි මෙතැනට ගාලු දිස්ත්‍රික්කයේම සුනඛයන් ගෙනැවිත් දාන එක විශාල ගැටලුවක් වනවා.අපි කවුරුත් එයට කැමති වෙන්නේ නෑ.නමුත් අම්බලන්ගොඩ ප්‍රදේශයේ සුනඛයන් පමණක් ගෙනැවිත් දමා, ලිපියේ පරිදි ඒ සතුන්ගේ අපද්‍රව්‍ය විධිමත්ව කළමණාකරණය කරන්නේනම් (ජීවවායු ජනකයක් ස්ථාපිත කිරීම මගින් හෝ) එය අවට ජනතාවට අහිතක් නොවන ආකාරයට කළ හැකියි.නමුත් එය කරන එක ගැටලුවක් වනවා.තාප්ප නැතුව වැටවල් සවි කිරීමෙන් අඩු වියදමෙන් කළ හැකියි.නමුත් මෙයට මුලු දිස්ත්‍රික්කයේම සුනඛයන් ගෙනැවිත් දැම්මොත් ඒ පැත්තේ ජනතාවට ගැටලුවක් වනවා.නමුත් සමස්ථයක් ලෙස ගත්විට අයාලේ යන සතෙක් වුනත් මරනවාට වඩා ඔවුන් සුරක්ෂිත කිරීම පින් අතේ වැඩක්.මේ සඳහා උදවු දෙන්න බොහෝ ආයතන ඉදිරිපත් වේවි.ඒ අනුව මුලු දිස්ත්‍රික්කයේම සුනඛයින් ගෙනැවිත් දමන්නේ නැතිව ඒ ප්‍රදේශයේ ජනතාවට අවහිරයක් නොවන පරිදි වගකීමෙන් යුතුව මේ කාර්යය කරන්නේනම් ඇත්තෙන්ම මෙය ගොඩක් හොඳ දෙයක් බව මා ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මගේ පෞද්ගලික අදහස වන්නේ, සුනඛ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම වැදගත් දෙයක්.පාරේ සෑම තැනම සිටින අයාලේ යන සුනඛයින් පෙර පාසල් යන ළමයි ඇතුලු අපේ ළමා පරපුරටම බාධාවක්.අනාගත පරපුර රැක ගැනීම අපේ වගකීමක්.උප සභාපතිතුමන් කියා සිටියේ මේ සඳහා ඒ ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතාවය ඇති බවයි.නමුත් ඒ ජනතාවගේම දරුවන්ද ඇතුලුව අම්බලන්ගොඩ නගරයේ දරුවන් ජල භීතිකාව නිසා මිය ගියොත් එය නගර සභාවටත් විශාල

අපහසුතාවක් වේවි.ඒ නිසා මගේ අදහස වන්නේ ඒ ප්‍රදේශයේ ජනතාවට අවහිරයක් නොවන ආකාරයට ක්‍රමවත් සැලසුමක් යටතේ මේ කාර්යය සිදු කළ යුතු බවයි.උප සභාපතිතුමාට වුනත් ජනතාවගෙන් විරෝධයක් එල්ල වන්නේ සුනඛයන්ගෙන් පරිසරයට බාධාවක් වුනොත්,එම නිසා මාගේ මතය වන්නේ නිසි පරිදි සැලසුම් කොට මෙය සිදු කිරීම සඳහා මේ භූමිය ලබා දීම සුදුසු බවයි.ඒ සඳහා මාගේ සම්පූර්ණ සහයෝගය මා ඔබතුමන්ට ලබා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,පසුගිය වකවානුව තුළ නගර සභාව මගින් සුනඛයන් මැරීම (බෙල්ල කපා ඉවත් කොට) වෙනුවෙන් මුදල් වැය කොට ඒ සඳහා විශාල කාර්යය භාරයක් කළා.නමුත් නොයෙකුත් සමිති ආරම්භ වීම නිසා මේ කර්තව්‍ය නතර වී තිබෙනවා.මා හිතන විදියට මේ කාර්යය සිදුකළ යුතු දෙයක්.රාත්‍රියට පාරක ගමන් කරන්න අපහසුයි.කුලරත්න විදුහල ඇතුලේ සුනඛයින් විශාල ප්‍රමාණයක් සිටිනවා.මෙය ළමුන්ට විශාල අවධානමක්.ඒ නිසා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථානයක් තෝරාගෙන එය ඉටු කරන ලෙස ඉල්ලා සිටින අතර ඒ සඳහා අපගේ සහයෝගය ලබා දෙන බවද ප්‍රකාශ කර සිටිනවා.උප සභාපතිතුමන්ට ප්‍රදේශයේ විරෝධතා එල්ල විය හැකියි.කුමන කාර්යයක් කිරීමට ගියත් එසේ වනවා.නමුත් මිනිසුන් මෙය තේරුම් ගත් පසුව ඒ තත්වය වෙනස් වේවි.පසුගිය වකවානුවේ තිබූ කසළ ප්‍රශ්නයේදීත් සිදුවුනේ කොම්පෝස්ට් සාදන භාජන විනාශ වෙලා ඉන් නිසි ප්‍රයෝජනයක් ගත නොහැකි වීමයි.ඒ නිසා තීරණ ගන්නා විට හොඳින් සිතාබලා සුදුසු ලෙස මෙම කාර්යය ඉටු කරන ලෙස ඉල්ලා සිටින අතර, ඒ සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවද ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ප්‍රදේශයේ අනතුරුදායක සුනඛයන්ගේ වැඩිවීමක් දක්නට ලැබෙනවා.ඒ නිසා මෙය ඉතාම කාලෝචිත හොඳ යෝජනාවක්.මෙවැනි අලුත් දෙයක් ආරම්භ කරනවිට ජනතාව බියක් දක්වනවා.එයට සාධාරණ හේතු තිබෙනවා.මොකද කල්ගත වනවිට ආරම්භ කළ විලාසය වෙනස් වනවා.ඒවා නිවැරදිව ක්‍රියාත්මක වන්නේ නෑ.ඒ නිසා උප සභාපතිතුමා කියූ පරිදි එහි සාධාරණ සැකයකුත් තිබෙනවා.ඒ නිසා එවැනි බාධා ඇති නොවන පරිදි මෙය සිදුකළ යුතුයි.ඒ අනුව මේ සඳහා මාගේ කැමැත්ත ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සුනඛ රැඳවුම් මධ්‍යස්ථානයක් පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ මගින් යොමු කරන ලද ලිපිය අනුව මෙහි දෙපැත්තක් තිබෙනවා.පළමුව උප සභාපතිතුමාට ඇතිවන ගැටලු පිළිබඳ කතා කළ යුතුයි.මම මුලින්ම අහන්න කැමතියි,මෙම නගර සභාව නියෝජනය කරන වෙනත් කුමන හෝ මන්ත්‍රීවරයකුගේ බල ප්‍රදේශයේ මෙම කාර්යය කළානම් ඔවුන් මේ සඳහා කැමැත්ත පළ කරනවාද කියා.කිසිම මන්ත්‍රීවරයකුට ඒ සඳහා එකගතාවය දිය නොහැකියි.මම පසුගිය දිනක රූපවාහිනී වැඩසටහනක දුටුවා, කිසිවෙකුට කිසිදු හානියක් නැතිව, සියලු උපාංගයන්ගෙන් යුක්තව විදේශ ස්වේච්ඡා සංවිධානයක් මගින් පවත්වාගෙන යනු ලබන සුනඛ මධ්‍යස්ථානයක්.නමුත් කිසිදු හේතුවක් නැතිව ජනතාව එයටත් විරුද්ධයි.උප සභාපතිතුමා මෙයට විරුද්ධ වුනත් නැතත් මුලු තල්ගස්ගොඩ ප්‍රදේශයේම ජනතාව විරුද්ධ වනවා.ඒක සාමාන්‍ය දෙයක්.අපි මේ විරෝධය පිළිබඳ දැන දැන මේ ඉඩමට යනවද, එසේ නැතිනම් මේ බැරෑරුම් කරුණ පිළිබඳ මීට වඩා සිතා මෙය ස්ථාපනය කිරීම සඳහා වෙනත් භූමියක් තෝරා ගන්නවාද යන්න තීරණය කළ යුතුයි. දෙවැනි ගැටලුව වන්නේ , මේ සුනඛයන් වන්ධ්‍යා කිරීමේ වගකීම පැවරී තිබුනේ සෞඛ්‍ය අමාත්‍යාංශයට.මීට වසර පහකට හයකට ප්‍රථම මාතර ප්‍රදේශයේ ගරු අධිකරණයකින් නඩු තීන්දුවක් දෙනු ලැබුවා,තවදුරටත් සුනඛයන් මැරීමේ අයිතියක් මහජන සෞඛ්‍ය නිළධාරීන්ට නොමැති බවට.එදින සිට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මේ කර්තව්‍යයෙන් ඉවත් වූවා.ඒ නිසා වසර පහක කාලයක් තුළ සුනඛයන් විනාශ කිරීම හෝ බෝවීම පාලනය සිදුවුනේ ඉතාමත්ම සෙමින්.නමුත් අද වනවිට මේ වගකීම පශු වෛද්‍ය කාර්යාල සම්බන්ධ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා.නමුත් ඒ කාර්යාල වල වගකීම කියා ජනතාවගෙන් පැන නගින ගැටලු අපට මග හරින්න බෑ.ජනතාවට හා සමානව අපි සියලු දෙනාටම මේ ගැටලුව බලපානවා.රාත්‍රියට නින්දට ගියත් සුනඛයන්ගේ ඝෝෂාව ගැටලුවක්.පාසල් ,පන්සල් , බස් නැවතුම් පොළ, මාර්ග ආදී සියලු ස්ථාන වලට මේ අයාලේ යන සුනඛයන් විශාල ගැටලුවක්.නිවසේ ඇති කරන සුනඛයනවත් වන්දි කර ගැනීමට නොහැකිව අයාලේ යන සුනඛයන් වන්දි කරන්නේ කෙසේද?සභාපතිතුමා සඳහන් කළ පරිදි නගර සභා ආඥා පනත අනුව

අපේ බල ප්‍රදේශය තුළ කවරෙකුට හෝ ජල භීතිකාව සෑදුනහොත් එහි වගකීම අප සභාව විසින් දැරිය යුතුයි.ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි සහයෝගය දැක්විය යුතුයි.නමුත් මීට අදාළ වියදම් දැරීමේදී රාජ්‍ය ආයතන වල ක්‍රියාකලාපය අනුව මේ සඳහා කුමන ආකාරයකින් ක්‍රියා කරාවිද යන්න ගැටලුවක්.එවිට ඒ ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරයා හැටියට නොයෙකුත් ගැටලු ඇතිවිය හැකියි.ඒ නිසා අපිත් ඊට එකග විය යුතුයි.එය එසේ වුවත් සියලුම මන්ත්‍රීවරු අදහස් කළ පරිදි මේ සුනඛ උවදුර අපෙන් ඈත් කිරීමේ කර්තව්‍යයෙන් අපට බැහැර විය නොහැකියි. සෞඛ්‍ය කමිටුවේදීත් යෝජනා කළේ හල්වතුර ව්‍යාපෘතියේ තිබෙන අපට අයිති අක්කර දෙකක භූමි ප්‍රමාණය අවශ්‍යනම් අපට පශු වෛද්‍ය කාර්යාලයට පවරා දිය හැකිය යන්නයි.එක් පැත්තකින් අප මේ පවරන්නේ අප සතු වටිනා භූමි භාගයක්.අනෙක් පැත්තෙන් ප්‍රදේශයේ ජනතාවගේ විරෝධය කලින් කලට එල්ල විය හැකියි.තුනවැනි කාරණය වන්නේ මේ මධ්‍යස්ථානය විවෘත කළ පසු මේ ප්‍රදේශයේම සුනඛයින් පමණක් දමන්න කියා අපට මැදිහත් විය නොහැකියි.එය රජයේ අයිතිය.මේ ස්ථානයේ උපරිම වශයෙන් රැදවිය හැකි වන්නේ සුනඛයන් 400ක් 500ක් පමණයි.නමුත් ඔබතුමන් සඳහන් කළ පරිදි අම්බලන්ගොඩ නගරයේ පමණක් සුනඛයන් 1500 කට වඩා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදී අපි අවධානය යොමු කළේ,අම්බලන්ගොඩ සිටින ජනගහනය සමග සුනඛයින් 2000ක් පමණ සිටින බව වාර්තා වී තිබෙනවා.ඒ නිසා මේ 2000 රදවන්න ස්ථානයක් අපි සෑදියයුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මගේ අදහස වන්නේත් ඒ සුනඛයින් රදවන්න ස්ථානයක් අපි සෑදිය යුතුයි.හල්වතුර ව්‍යාපෘතියේ ඇති අක්කර දෙකක භූමිය අපට කෙසේ හෝ පශු වෛද්‍ය කාර්යාලයට පැවරිය හැකිනම් එය සියලු යෝජනා වලට වඩා කාලෝචිත වන බව මා ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,හල්වතුර ප්‍රදේශයේ කසළ බැහැර කිරීම නිසා ඒ ප්‍රදේශයේ වාසය කරන ජනතාවට එය විශාල ගැටලුවක් වී තිබෙනවා.ඒ නිසා එහි සුනඛ රැදවුම් මධ්‍යස්ථානයක් ඉදි කළහොත් එය තවත් විශාල ගැටලුවක් වන නිසා මේ සම්බන්ධයෙන් මාගේ දැඩි විරෝධය පළ කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නාගරික මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා විසින් යෝජනා කරනු ලැබුවා මේ කර්තව්‍ය සඳහා හල්වතුර ප්‍රදේශය සුදුසු බවට.තල්ගස්ගොඩ ප්‍රදේශයේ මෙය සිදු කිරීම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා විරුද්ධ වුවා.ඒ වගේම ලසන්ත මන්ත්‍රීතුමන් කියූ පරිදි හල්වතුර ප්‍රදේශයේ සිටින්නේත් ජනතාව.කසළ දැමීම සම්බන්ධයෙන්ද පසුගිය වකවානුවේ හල්වතුර ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධය එල්ල වුවා.එසේ තිබියදී සුනඛයින්ද ගෙනැවිත් දැම්මොත් ඒ සඳහා ඔවුන්ගේ දැඩි විරෝධය එල්ල වේවි.අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද හල්වතුර ප්‍රදේශයේ ස්ථාපනය කිරීමට සූදානම් වී සිටින අවස්ථාවක මේ සුනඛ රැදවුම් මධ්‍යස්ථානය හල්වතුර ප්‍රදේශයේ ඉදිකිරීම සම්බන්ධයෙන් මාගේ දැඩි විරෝධය පළකර සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් අදහස් දෙකක් තිබෙනවා.ඒ නිසා මේ පිළඹද මහජන විරෝධයක් තිබේද නැද්ද යන්න මහජනතාව මාර්ගයෙන්ම දැනගැනීමෙන් අනතුරුව ඒ පිළබඳ සභාවට වාර්තා කරන ලෙස මා ප්‍රජා සංවර්ධන නිළධාරීතුමියටත් පශු වෛද්‍ය නිළධාරීතුමන්ටත් බලය පවරා සිටිනවා.ඉන් අනතුරුව මේ පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු යැයි මා ප්‍රකාශ කර සිටිනවා.මා පෞද්ගලිකව හඳුනන එන්.ජී.ඕ.පුද්ගලයන් මාර්ගයෙන් මා හට අයත් පටබැදිමුල්ල කොට්ඨාශයේ සුනඛයින් සඳහා පමණක් ක්‍රියා කිරීමට හැකියාව මා සතුව තිබෙනවා.නමුත් මෙය මුලු නගරයටම අදාළ කරුණක් බව තේරුම්ගත යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, උදාහරණයක් ලෙස පොල්වත්තේ ආදාහනාගාරය ඉදිකරන අවස්ථාවේද මෙවැනි මහජන විරෝධයක් ඇතිවුනා.නමුත් එය කෙසේ හෝ සිදුකළා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අප කොපමණ හොඳ දෙයක් කළත් එය මහජනතාවට අවශ්‍යතාවයක් නොමැතිව සිදුකිරීමෙන් ඵලක් වන්නේ නැ.ඒ නිසා අදාළ නිළධාරීන් විසින් මෙහි අවශ්‍යතාවය පිළිබඳ ජනතාවගෙන්ම විමසා වාර්තා කිරීමෙන් අනතුරුව මේ පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බව මා ප්‍රකාශ කර සිටිනවා.

**තීරණය -**

**සුනඛ රැඳවුම් මධ්‍යස්ථානයක් සඳහා අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් ඉඩමක් වෙන් කරවා ගැනිම සම්බන්ධයෙන් දකුණු පළාත, සත්තව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව තුළ අදහස් දෙකක් ඉදිරිපත් වූ බැවින් මේ සම්බන්ධයෙන් මහජනතාවගේ විරෝධතා තිබේද යන්න සම්බන්ධයෙන් විමසා බැලීමේ කටයුත්ත සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරි සහ පශු වෛද්‍ය නිලධාරියාට බලය පැවරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**03:05** ‘ **ජංගම සේවයක් පැවැත්වීම** ’ සම්බන්ධයෙන් බටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා විසින් ඉදිරිපත් කර තිබූ 2018.08.31 දිනැති ලිපිය සභාගතකරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2018.09.20 දින තිලකපුර ප්‍රජා ශාලාවේ පැවැත්වීමට නියමිත ජංගම සේවය සඳහා අවශ්‍ය උපකරණ හා භාණ්ඩ (ප්ලාස්ටික් පුටු 200, පාට කොඩි 40, විදුලි අංශයේ වාහන,විදුලි කාර්මික මහතා හා සහායක මහතා, කැනපි 10 ) නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම ඉල්ලීම සභා අනුමැතියට යටත්ව ඉටු කර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මෙහිදී අපි සභාව දැනුවත් කළ යුතුයි.හේතුව, ඒ භාණ්ඩ වල යම්කිසි වටිනාකමක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවෙන් පමණක් නොව සියලු සභා වලින් අපට උදවු කර තිබෙනවා.උදාහරණයක් ලෙස සුනාමි ව්‍යවසනය අවස්ථාවේදී බොහෝ සභා වල වාහන අප වෙත ලබා දුන්නා.ඒ නිසා මෙවැනි අවස්ථාවකට ප්ලාස්ටික් පුටු, විදුලි අංශයේ වාහන දීම ගැටලුවක් නොවේ.එය සාමාන්‍ය දෙයක්.

**ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

එය සාමාන්‍ය දෙයක් වුනත් සභාපතිතුමනි, කොපමණ වටිනාකමකින් යුත් කුමන භාණ්ඩ මේ සඳහා ලබා ගන්නවාද යන්න සභාව දැනුවත් විය යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සඳහා අවශ්‍ය වන්නේ කුමන භාණ්ඩද යන්න අදාළ ලිපියේ සඳහන් කළා.ඒ අනුව සභා අනුමැතියට යටත්ව, මේ භාණ්ඩ ලබාදුන් නිසා මේ සඳහා සභා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2018.09.20 දින පවත්වන ලද ජංගම සේවය සඳහා ප්ලාස්ටික් පුටු 200, පාට කොඩි 40, කැනපි 10 සහ විදිපහන් නඩත්තු අංශයේ රථවාහන සහ විදුලි කාර්මික මහතා සහ සහායක මහතා යන සේවාවන් සහ භාණ්ඩ දහා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

- පෙරවරු 10.25 ට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවෙන් ඉවත්ව යන ලදී.

**03:06** **' වෘත්තීය සමිති නිළධාරීන්ගේ නාම පුවරු ප්‍රදර්ශනය කිරීම'** සම්බන්ධයෙන් රාජ්‍ය සේවා වෘත්තිය සමිති සම්මේලනයට අනුබද්ධ දකුණු පළාත් කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන සංගමයේ ගරු සභාපතිතුමන් හා ලේකම්තුමිය විසින් එවන ලද 2018.09.12 දිනැති ලිපිය සභාගතකරන ලදී.

ඉහත සඳහන් කරන ලද වෘත්තීය සමිතියේ නිළධාරී මණ්ඩලයේ ලේකම්ධූරය (එච්.එම්.අනීෂා සංජී කුමාරි මහත්මිය) සහ කාරක සභිකත්වය (හිමාල් ගුණවර්ධණ මහතා) සඳහා අප කාර්ය මණඩලයේ නිළධාරීන් දෙපළක් පත් වී ඇති බව දන්වා ඇති අතර, අදාළ සංගමයේ නිළධාරීන්ට අදාළ නගර සභා බල ප්‍රදේශය තුළ ඔවුන්ගේ ඡායාරූප සමග නිල නාමයන් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.

**තීරණය**

**රාජ්‍ය සේවා වෘත්තිය සමිති සම්මේලනයට අනුබද්ධ දකුණු පළාත් කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන (බාණ්ඩ 11) මගින් වෘත්තිය සමිති නිලධාරින්ගේ නාම පුවරුව නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා සභා අනුමැතියට යටත්ව අවසර ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

**03:07** **' දෙරණ ලිට්ල් ස්ටාර් තරගයේ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම'** සම්බන්ධයෙන් එම්.වී.බුද්ධසිරි මයා විසින් ඉදිරිපත් කරන ලද 2018.09.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එම්.වී.බුද්ධසිරි මහතාගේ දියණියගේ පුතා වන ඩී.ඩී.දෙහාන් අක්නුල දෙරණ ලිට්ල් ස්ටාර් තරගයේ අවසන් පස්දෙනා අතරට තේරී පත්ව ඇති බැවින් ඒ පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පුවරුවක් නගර මධ්‍යයේ ප්‍රචාරය කිරීම සඳහා අවසරය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.

**තීරණය**

**නො.18, ධීවර නිවාස,පටබැඳිමුල්ල පදිංචි එම්.වී.බුද්ධසිරි මහතාගේ දියණියගේ පුතා වන දෙහාන් අක්නුලදෙරුවා දෙරණ ලිට්ල් ස්ටාර් තරගයේ අවසන් පස් දෙනා අතරට පැමිණ ඇති අතර ඒ පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පුවරුවක් නගර මධ්‍යයහි නොමිලේ පල කිරිමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

**03:08** **'තණකොළ කපන යන්ත්‍රයක් මිලදී ගැනීම '** සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ වැඩ පරිපාලක ඒ.ඩබ්.හිමාල් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018.09.13 දිනැති ලිපිය සභාගත කරන ලදි.

සභාව සතු තණකොළ කපන යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බවත් අලුත්වැඩියා කළ නොහැකි මට්ටමේ පවතින බවත් දනිවා ඇති අතර දැඩිව එහි සේවයේ අවශ්‍යතාවය පවතින බැවින් නව තණකොළ කපන යන්ත්‍ර දෙකක් ලබා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,අපේ කලින් තිබූ යන්ත්‍රයත් ඉක්මනින් විනාශ වුනේ එය අයාලේ යවන නිසා.උදාහරණයක් විදියට එය වැඩිපුරම භාවිතයට ගනු ලැබුවේ පොලිසියේ තණකොළ කැපීම සඳහා.ඒ නිසා අලුතින් ගනු ලබන යන්ත්‍රය පරිහරණයේදී සැලකිලිමත් වන ලෙස ප්‍රකාශ කර සිටිනවා.

**තීරණය -**

**නගර සභාවට තණකොළ කපන යන්ත්‍ර දෙකක් මිලදී ගැනිම ගැනිම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලිමට අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුනගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**3:9** "මෝදර දේවාල භූමිය වටා ගල් බැම්ම ඉවත් කොට දැල් වැටක් ඉදිකිරිම" සම්බන්ධයෙන් ආර්.එම්.ඥානසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018.09.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සුනාමි ව්‍යවසනයෙන් දේපළ විනාශ වූ ජනතාව රාජ්‍ය උපකාර හා අවසරය ඇතුව නැවතත් මී.10 සීමාව තුළ නිවාස සාදා ගත්තද ,මෝදර දේවාල භූමිය වටා ඉදි කර ඇති ගල් බැම්ම ඔවුන්ට බාධාවක්ව පවතී.මෙම වෙරළ තීරුව සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශක්තිමත් ගල් වැටියක් ඉදිකළද , මෝදර දේවාල බැම්ම නිසා වේගවත් රළ පහරට යෑමට තැනක් නොමැතිකමෙන් නිවෙස් හානිවන බැවින් මෙම බැම්ම ඉවත් කොට දැල් වැටක් ඉදිකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,මෝදර දේවාල භූමිය අවට ඉඩම් වල ජනතාව හල්වතුරට රැගෙන ඒමට ඔබතුමන් මීට පෙර යෝජනා කළා.මෝදර දේවාලයේ ඇති දොරටු දෙක වසා දැමීමටත් සභාවෙන් යෝජනා වුනා.නමුත් මෝදර දේවාල කොමිටිය කැමැත්තක් දක්වන්නේ නෑ ගමේ ජනතාව අමනාප කරගෙන එම කටයුත්ත සිදු කිරීමට.ඒ නිසා ඒ සඳහා නැවත සභාවෙන් තීරණයක් ගතයුතුයි.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එය මන්ත්‍රීතුමාගේ කොට්ඨාශය.ඒ නිසා ජනතාවගේ අවශ්‍යතාවය අනුව ඔබතුමන්ට තීරණයක් ගත හැකියි.

ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්

එසේනම් මුහුදු රළ පහරින් එම ප්‍රදේශය ආරක්ෂා කර ගැනීම සඳහා තාප්පයක් ඉදි නොකොට දැල් වැටක් ඉදි කිරීම සුදුසු යැයි මා යෝජනා කර සිටිනවා.දේවාලයේ ආරක්ෂාවත් සැලකිල්ලට ගත යුතුයි.කොමිටිය මගින් මෙය සිදුකර ගත නොහැකි නිසා සභාවෙන් මේ සඳහා පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

- පෙරවරු 10.30 ට ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා සභාවට පැමිණියා

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,මීට මාස තුන හතරකට පෙර පැමිණි විශාල රළ පහරින් නිවාස රාශියක් යට වුනා.තවද දේවාල භූමිය ඇතුළද යට වී තිබුනා.මාද ඒ අවස්ථාව නිරීක්ෂණය කළා.දේවාලයේ ගලට එක් පසෙකින් ඉදිකර ඇති තාප්පය වෙනුවට දැලක් ඉදි කරන්නේනම් මේ ගැටලුව නිරාකරණය කර ගත හැකියි.

ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්

දේවාල කොමිටියට භාර නොදී සභාව මැදිහත් වීමෙන් මෙම කවුලු දෙක සඳහා ගේට්ටු දෙකක් දමන ලෙස මා යෝජනා කර සිටිනවා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එසේනම් එම කවුලු දෙක සඳහා ගේට්ටු දෙකක් දැමීමට තීන්දු කරනවා.

**තීරණය**

**නො.53,හිරේවත්ත, අම්බලන්ගොඩ පදිංචි ආර්.එම්.ඥානසිරි මහතා විසින් මෝදර දේවාල බැම්ම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමට අනුව සභාව මගින් එම කවුලු දෙක සඳහා ගේට්ටු දෙකක් සවිකර දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

**3:10** **"අම්බලන්ගොඩ - පටබැදිමුල්ල ආදාහනාගාරය අලුත්වැඩියා කිරීමේ ගිවිසුම් පත්‍රයේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම"** මැයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද 2018.09.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ වන විට නර්ඩ් ආයතනය මගින් පටබැදිමුල්ල ආදාහනාගාරයේ අලුත්වැඩියා කටයුතු වලින් 75% ක් පමණ අවසන් බව දන්වා ඇති අතර ඉතිරි වැඩ කටයුතු නිම කිරීම සඳහා ගිවිසුම් කාලය (2018.09.30 දක්වා) දීර්ඝ කරගැනීම සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ වනවිට මෙහි වැඩ කටයුතු අවසන්ද? මෙහි වැඩ අවසන් කිරීම සඳහා නිර්දේශ කර ඇත්තේ සැප්තැම්බර් මස 30 වැනිදාට.වැඩ අවසන් නැතිනම් මේ සඳහා බිල් දමන්නේ කෙසේද?(තා.සේ.නි. මහතාගෙන් විමසන ලදී.) අද ඔක්තෝම්බර් 02 වැනිදා. තවමත් බිල් ගෙවා නෑ.මෙහිදී බිල් ගෙවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ගැටලුවක් මතු වනවා.

ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් ජනතාව වගේම මන්ත්‍රීවරුන් වන අපද දැනුවත් නෑ.අප දන්නේ මෙම ආදාහනාගාරය දැනට ප්‍රතිසංස්කරණ තත්වයේ පවතින බව.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මෙහිදී යකඩ පයිප්ප ඉවත් කොට චිමිනිය ඇතුලු සියල්ල සඳහා සුදු යකඩ පයිප්ප දමනවා.මේ සඳහා ලක්ෂ 30ක මුදලක් වැය වනවා.ඒ නිසා ඉදිරියට ප්‍රතිසංස්කරණ තත්වයන් ඇතිවීම වළකී යන බලාපොරොත්තුවෙන් ඉංජිනේරු මහතුන් විසින් මෙසේ සිදු කිරීමට තීරණය කළා.

ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්

මා ඔබතුමා සමග එකග වනවා.නමුත් මෘතදේහ වැළලීමට හෝ මේ ස්ථානයට පැමිණෙන ජනතාව දැනුවත් කිරීම සඳහා යථා කාලයේදී මෙය ප්‍රතිසංස්කරණය කරන බව දන්වා දැන්වීම් පුවරුවක් හෝ පළකරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ වනවිට මෙහි වැඩ අවසන් වී ඇති බව මා ප්‍රකාශ කර සිටිනවා.

**තීරණය -**

**NERD ආයතනය විසින් සිදුකරනු ලබන පටබැඳිමුල්ල ආදාහනාගාරයේ සුදු යකඩ චිමිනිය ඉදිකිරිම කර්මාන්තයේ ගිවිසුම් කාලය 2018.09.30 දක්වා දිර්ඝ කිරිම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.11 "කෙරමිණිය පින්නදූව පුස්තකාලය 'මගගේ පුස්තකාලය' නමින් නම් කිරීම "**සම්බන්ධයෙන් උත්තමාවඩු ධනසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018.09.14 දනැති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා මින්පසු ඒ ඒ කොට්ඨාශ වලින් ලැබෙන ලිපි සභාවට දැමීමට පෙර ඒ කොට්ඨාශ වලට අදාළ මන්ත්‍රීවරුන්ට පෙන්වන ලෙසට.මෙය අපේ ප්‍රදේශයේ වෙසෙන මානසික ස්වභාවය මදක් විකෘති වුනු තැනැත්තකුගේ ලියමනක්.අප මෙම පුස්තකාලය සඳහා යොදා ගත්තේ මෙම ඉඩම පරිත්‍යාග කළ පුද්ගලයාගේ නාමය.නමුත් ඔහු කියා සිටින්නේ ඔහුගේ මුත්තාගේ නම මේ සඳහා දමන ලෙසට.ඒ අනුව මෙය සැලකිය යුතු ලිපියක් නොවෙයි.එමනිසා මෙවැනි ලිපි සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රථම මන්ත්‍රීවරුන්ගෙන් මදක් විමසන ලෙස මා නැවතත් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා විරෝධතා කැදෙව්වත් එකක්වත් ආවේ නෑ.නමුත් මෙවැනි ලිඛිත විරෝධතාවයකදී විරෝධතා පරීක්ෂණයක් පැවැත්විය යුතුයි.මේ සඳහා පීටර් සිල්වා මහතාගේ නම දමනවාද මගගේ මහතාගේ නම දමනවාද යන්න තීරණය කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

මේ සඳහා පරීක්ෂණයක් තැබීම සම්බන්ධයෙන් මගේ විරුද්ධතාවයක් නෑ.නමුත් පරීක්ෂණයට කැඳවූ විට පරීක්ෂණ මණ්ඩලයට පෙනේවි පුද්ගලයාගේ තත්වය.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ස්වාධීනව සිදුකළ යුතු නිසා මීට අදාළ පරීක්ෂණය පළාත් පාලන විමර්ශන නිළධාරීතුමන් ලවා සිදුකොට එහි වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලෙස ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය -**

**කෙරමිණිය පින්නදූව පුස්තකාලය " කේ.ජී.පිටර් ද සිල්වා නමින් "නම් කිරිමට අදාළව උත්තමාවඩු ධනසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත විරෝධතාව සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයේ විමර්ෂණ නිලධාරි යොදවා පරීක්ෂණයක් සිදු කොට මේ සම්බන්ධ වාර්තාව සභාවට යොමු කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ඉදිරිපත් කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**03.12 " කොඩි කණු සඳහා අවම මිල ඉදිරිපත් කරන ලද පූර්ණා ආයතනයෙන් රු.2600/= බැගින් කොඩි කණු මිලට ගැනීම"** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද 2018.09.26 දිනැත් ලිපිය සභාගත කරන ලදී.

2018.09.11 දින පැවති ටෙන්ඩර් කමිටුවේදී කොඩි කණුවක් රු.2500/= බැගින් කොඩි කණු 100ක් පූර්ණ ආයතනයෙන් මිලට ගැනීම අනුමත වූ අතර භාණ්ඩ ලබා ගැනීමට යාමේදී එහි මිල

රු.2600/= දක්වා ඉහල ගොස් තිබෙනවා. ඊළග අවම මිල වන රු.2600/= ඉදිරිපත් කල බී.කේ.හාඩ්වෙයාර් ආයතනයෙන් භාණ්ඩ මිලට ගැනීම සම්බන්ධයෙන් දැන ගැනීමට දුරකථනය සම්බන්ධ කර ගැනීමට නොහැකි වී ඇති බැවින් හා ළමා දිනය වෙනුවෙන් කඩිනමින් මේවා අවශ්‍ය බැවින් පූර්ණා ආයතනයෙන් රු.2600/= බැගින් කොඩිකණු 100 මිලට ගැනීම සඳහා සභා අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

බඩු මිල වැඩිවීමත් සමග මිල ගණන් කැඳවා කාලයක් ගතවන විට කලින් කී මුදලට ලබාදීමේ අපහසුතාවයක් ඇති වනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ මිල ගණන් වෙනස් වීමේදී අපි කොළඹින්ද මිල ගණන් විමසා සිටියා.නමුත් මෙහි තොග මිල වුවෙත් රු.2600/= ක මුදලමයි. ඒ නිසා මෙම මුදලට පූර්ණා ආයතනයෙන් කොඩි කණු මිලට ගැනීම අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

**පූර්ණා ආයතනයෙන් කොඩිකණු ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව රු.2600/= බැගින් කොඩි කණු ලබා ගැනීම සඳහා සභා අනුමැතියට යටත්ව අවසර ලබාදීම වෙනුවෙන් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**05:01** **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා (නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**05.01.01** <u>**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු ලේකම් බී.ඒ.ධම්මිකා මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනාව.**</u>

තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා සිටීම.

2018.08.07 මාසික සභාවේ 12.10 අනුව අම්බලනගොඩ නගර සභාවේ සභා කටයුතු හා මාසික වාර්තා නිසි පරිදි කරගෙන යාමේ අවශ්‍යතාවය මත ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම/කැලි ක්‍රමයට සේවකයෙක් බඳවා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කිරීම සඳහසභා අනුමැතිය ලබාගෙන ඇත.

ඒ අනුව සභා තීරණය පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් පසු පී.එල්.වැටුප් කාණ්ඩය යටතේ සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයකු සේවා අවශ්‍යතාවය මත වර්ෂයක කාලයක් සඳහා යොදවා ගැනීමට පළාත් පාලන කොමසාරිස්තුමාගේ 2018.09.20 හා අංක 01/06/06/11 ලිපිය මගින් අනුමැතිය ලබා දීඇත.

එමෙන්ම එම ලිපිය මගින් ඉහත 12.10 සභා තීරණය දෛනික වැටුප් ගෙවීමේ පදනම ලෙස සංශෝධනය කර ගන්නා මෙන් වැඩිදුරටත් සදහන් කර ඇති බැවින් එම සභා තීරණය සංශෝධනය කිරීම සඳහා නැවත සභා තීරණයක් ගැනීම සුදුසු බව යෝජනා කර තිබෙනවා.

**තීරණය -**

**නගර සභාවේ සභා කටයුතු හා මාසික සභා වාර්තා නිසි පරිදි කරගෙනයාමේ අවශ්‍යතාවය මත සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයෙකු බඳවා ගැනිමට අනුමැතිය ලබා දි ඇති අතර එම ලිපිය මගින් 2018.08.07 දින සභා තිරණ අංක 12.10 සභා තිරණය දෛනික වැටුප් ගෙවිමේ පදනම ලෙස සංශෝධනය කර ගැනිමට කටයතු කරන ලෙසට පාලන කොමසාරිස්තුමාගේ 2018.09.20 හා අංත 01/06/06/01 ලිපිය මගින් දන්වා ඇති පරිදි එම සභා තිරණය දෛනික වැටුප් ගෙවිමේ පදනම ලෙස සංශෝධනය කර ගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**5:2** ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා

**05.02.01** <u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

1. පටබැදිමුල්ල ආදාහනාගාරය
2. පොල්වත්ත ආදාහනාගාරය

**ඉහත සඳහන් ආදාහනාගාර අලුත්වැඩියා කටයුතු සහ එහි පරිශ්‍රය අලංකාර කිරීම සඳහා යෝජනා කරමි.**

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ,ඇත්තෙන්ම මා මෙය යෝජනා කළ හේතුව වන්නේ, මේ අපි සේවා සපයා ආදායම් උපයන ස්ථාන දෙකක්.සියලුම නගර වැසියන් මුණගැසෙන ස්ථාන දෙකක්.මේ නගර සභාව විදහා දක්වන ස්ථාන දෙකක්.මොකද අම්බලන්ගොඩ නගර වැසියන්ට ආදාහන කටයුතු සඳහා තිබෙන්නේ මේ ස්ථාන දෙක පමණයි.නමුත් ඕකන්ද හා පටබැදිමුල්ල ආහනාගාර පවතින්නේ ඉතාම අඩු මට්ටමකයි.

දෙහිවල , ගල්කිස්ස වැනි ලංකාවේ අනෙකුත් ආදාහනාගාර හා සසඳන විට,අපට සේවකයන් සිටිද්දීත් අපේ ආදාහනාගාර ගැන පුදුම හිතෙනවා.මේවා මල් වවා, බුදු පිළිමයක් තබා අලංකාරවත් ලෙස සැකසිය හැකියි.මා මෑතකදී 'නිසල උයන' කියන ආදාහනාගාරයට ගිය අවස්ථාවේ මන්ත්‍රීවරියක ලෙස මට සිතුනේ, ඇයි අපේ සභාවටත් මීට වඩා අලංකාරවත්ව ආදාහනාගාරය ගොඩනගන්න බැරි කියා.අද ආදාහනාගාරයට ගොස් එය හෙට කැඩී ඇත්නම් එය අපේ දුර්වලකමක්.පටබැදිමුල්ල ආදාහනාගාරයේත් අලුත්වැඩියාවන් සිදු කළයුතුනම් එය ඉක්මනින්ම කළ යුතුයි.මා වරින් වරම යෝජනා කළා, මාගේ වසමේ තිබෙන ආදාහනාගාරය වන ඕකන්ද ආදාහනාගාරයේ ගොඩනැගිලි කොටස් කඩාවැටී,ගස්වල අතු කඩා වැටී,එය බොහොම අපවිත්‍ර වී තිබෙන බව. මෙහි බොහෝ ඉඩකඩ තිබෙන නිසා අලංකාරවත් ලෙස තබාගත හැකියි.වාහන නැවැත්වීම සඳහා හොඳින් ඉඩ තිබෙනවා.මෙහි සිටින සේවකයන්ට අපි පඩි ගෙවනවා.ඒ නිසා මෙය අලංකාරවත් ලෙස සාදමු කියා මා නැවතත් යෝජනා කර සිටිනවා.අප සහභාගී වූ පළාත් පාලන වැඩසටහනේදී කියා සිටියේත් , භූමිදාන කටයුතු වලදී ලේඛනගත සැලැස්මක් තිබිය යුතු බවයි.එතැනදී උදාහරණයක් ලෙස පෙන්වූයේ, ගෙල වැලලාගත් පුද්ගලයකුගේ ආදාහන කටයුත්තකදී උසාවි නියෝගයක් දෙනු ලබනවා,අවශ්‍ය විටෙක එය නැවත ගොඩ ගැනීමට.එවැනි අවස්ථාවකදී ලේඛනගත මිනින්දෝරු සැලැස්මක් නොමැති වුවොත් දේහ ගොඩගැනීමේදී එය විශාල ගැටලුවක් වනවා.ඒ අනුව අප සභාවේ ආදාහනාගාර සඳහාත් එවැනි මිනින්දෝරු සැලැස්මක් සකස් කරන ලෙස මා යෝජනා කර සිටිනවා.ආදාහනාගාරයේ සේවකයන්ට වුනත් පුලුවන් මෙලෙස වර්ගීකරණය කොට ලේඛනයක් පවත්වාගෙන යාමට.ඒ නිසා නගර සභාවේ සේවය මැනවින් විදහා දක්වන ශක්තිමත් සේවයක් සපයන ස්ථානයක් ලෙස මෙම ආදාහනාගාර ගොඩනගන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ද මේ පිළිබඳ කතා කළයුතු වනවා. ගල්කිස්ස සුසාන භූමිය වැනි ස්ථානයකට ගිය විට අපේ සුසාන භූමි මොනවාදැයි සිතෙනවා.ඒ අනුව ආදාහනාගාරය පමණක් නොවෙයි ඒ අවට භූමියද අලංකාරවත් ලෙස සකසුරුවම් කරන ලෙස ඉල්ලා සිටිනවා.ඕකන්ද ආදාහනාගාරයේත් කිසිම පිළිවෙලක් නෑ.ඒ නිසා නිසි සැලසුමකට අනුව ආදාහනාගාර දෙකම පිළිසකර කරන ලෙස ඉල්ලා සිටින අතර මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී අයිරාගනී මහත්මියට ස්තූතිවන්ත වනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ආදාහනාගාර සම්බන්ධයෙන් මීට පෙර සභාවකදී ධනසේන මාදුවගේ මැතිදුන්ගේ සාර්ථක යෝජනාවක් ඉදිරිපත් වුනා.එතුමා යෝජනාව ඉදිරිපත් කළා පමණක් නොවෙයි තම පළාත් නායකතුමන්ගෙන් මුදල් රැගෙන ඒමටද මේ වන විට ඇස්තමේන්තු සකස් කර තිබෙනවා.මා පසුගිය දා සහභාගී වූවා කලුවඩුමුල්ලේ ආදාහනයකට.ඔවුනට තමන්ගේ ඒ දේහය තබා ගැනීමට නිසි ස්ථානයක් තිබුනේ නෑ.ඔවුන් ඒ සඳහා බලපිටියේ පාලර් එක භාවිතා කොට තිබුණා.එතැන සිටි පිරිස කියා සිටියේ අම්බලන්ගොඩ නගරයේ ආදාහනාගාර ආශ්‍රිතව එවැනි ඉදිකිරීමක් සිදුකළ නොහැක්කේ මන්ද කියා.
ධනසේන මැතිතුමාගේ සංවර්ධන යෝජනාවටම සමගාමීව, එවැනි මිනිසුන් විපතට පත් වූ මොහොතක භාවිතා කළ හැකි ස්ථානයක්ද නිර්මාණය වනවානම් මෙතුමියගේ යෝජනාවට තවත් ඌනපූරණයක් වේවි.කරන්දෙණිය මල් ශාලාව, බලපිටිය පාලර් එක සඳහා දිනකට රු.18000/- ක් අය කරනවා.නමුත් එහි මූලික පහසුකම්වත් නෑ.මෙම ආදාහනාගාර යෝජනාව පිළිබඳ කතා කරන විට ඒ ධනසේන මැතිතුමාගේ මූල්‍ය ප්‍රතිපාදනද හරහා එය ඉටුකිරීම සුදුසු යැයි මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

ගරු නගරික මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කියූ පරිදි පොල්වත්ත ආදාහනාගාර භූමියේ පහළ කොටස සඳහා අවශ්‍ය මුදල් ප්‍රධාන අමාත්‍යතුමන් විසින් නුදුරේදී නගර සභාවට එවන බව මා ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු නාගරික මන්ත්‍රිනී ඊ.ඇම්.අයිරංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද මෙම ආදාහනාගාර දෙක සම්බන්ධ යෝජනාව ඉතාමත් වැදගත් වනවා.මොකද පිට ආදාහනාගාර වලට ගියවිට එය හොඳින්ම දැනෙනවා.පොල්වත්ත ආදාහනාගාරය රාත්‍රියට අඳුරුයි.මෙතැන මහජනතාව හතර පැත්තකට යන තැනක්.ධනසේන මහතා කළ යෝජනාව තුළ එහි (පහළ කොටසේ බල්බ දමා) කොටසක් හැදෙනවා.ඒ වගේම ඉහළ කොටසේ බල්බයක් දැවී ගියත් එයට බල්බයක් දමන්නේ නෑ.මා හිතන විදියට රාත්‍රියට එහි මුරකරුවකු නෑ.ඒ තත්වය තුළ යම් යම් ප්‍රශ්න වලට ඉදිරියේදී මුහුණ පෑමට සිදුවේවි.ඒ නිසා ඉදිරියේදී එයට මුරකරුවකු යොදන්න වේවි.මීට පෙරද වැසිකිළිද සහිතව කාමර සාදා දුන්නද ඒවා නිසි පරිදි නඩත්තු කර නෑ.ඒ නිසා මේ සඳහා නිසි වැඩපිළවෙලක් යොදන ලෙස ඉල්ලා සිටිනවා.හේතුව පොල්වත්ත ආදාහනාගාරය සඳහාද දැන් විශාල වශයෙන් ජනතාව පැමිණෙනවා.ඒ නිසා ආදාහනාගාර දෙකම නිසි ආරක්ෂක වැඩපිළිවෙලක් යටතේ සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,නාගරික මන්ත්‍රිනී අයිරාංගනී මහත්මිය ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ සලකා බැලීමේදී , ඕකන්ද ආදාහනාගාරය එහි තිබෙන පරිසරය අනුව මල් වවා අලංකාරවත් ලෙස සකස් කළ හැකියි.රාහුල මන්ත්‍රීතුමන් කියූ පරිදි සමහර විටෙක බල්බයක් නැතිවන තත්වයක් හැර ආදාහනාගාරය තුළ පවිත්‍රතාවය පවත්වාගෙන යනු ලබනවා. අම්බලන්ගොඩ තිබෙන ආදාහනාගාර භූමිය දෙහිවල හෝ ගල්කිස්සේ තිබෙන 'නිසල සෙවන' සමග සමාන කල නොහැකියි.ඊට හේතුව ඒවායේ තිබෙන්නේ අදාළ ඥාතීන් විසින් නඩත්තු කරනු ලබන කොන්ක්‍රීට් කරන ලද සුසාන භූමි.අපේ නගර සභාවේ ආදාහනාගාරයේ තිබෙන්නේ කොන්ක්‍රීට් වැළලීම් වලින් තොර තනි භූමියක්.මේ භූමිය විශේෂයෙන් අලංකාර කිරීමේ හැකියාවක් නෑ.ගිය වකවානුවේ ඔබතුමන් එහි ඉන්ටලොක්ස් අල්ලා භූමියට කළ හැකි අලංකරණය කළා.ඒ වගේම පසුගිය දිනවල පැවති තද සුළං තත්වය හේතුවෙන් විශාල ගස් සියල්ල පොළවට කඩා වැටුනා.මේ කාරණා නිසා මදක් හුදකලා වී තිබෙනවා.ඒ හැර අපේ සේවකයන් විසින් කැලෑ සුද්ද කොට එය නිවැරදි ආකාරයෙන් පවත්වාගෙන යාමේ ප්‍රවණතාවයක්

තිබෙනවා.ආදාහනාගාරයට ඇතුල්වන ස්ථානය දෙපස මල් වැටිය වෙනුවට කුමක් හෝ අලංකාරවත් විකල්පයක් යොදන ලෙස මා එතුමියගේ යෝජනාවට අනුව කියා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එම යෝජනාව සම්මත වනවා.

**තීරණය -**

**පටබැඳිමුල්ල ආදාහනාගාරය සහ පොල්වත්ත ආදාහනාගාරය යන ආදාහනාගාර අලුත්වැඩියා කිරිමේ කටයුතු සහ එහි පරිශ්‍රය අලංකාර කිරිම සුදුසු බවටත් සුසාන භූමියේ භූමදාන සඳහා මිනින්දෝරු සැලැස්මක් සකස් කරගැනිමටත් ඒ අනුව වර්ගීකරණය කරන ලද විධිමත් ලේඛණයක් පවත්වා ගැනිමටත් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනි මිය ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රි ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.02.02** <u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

**අම්බලන්ගොඩ නගර සභාව සතු පැරණි පොදු වෙළඳ පොළ කඩා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම**

**අම්බලන්ගොඩ නගර සභාව සතු පැරණි පොදු වෙළඳ පොළ හා සාප්පු සංකීර්ණය අබලන් තත්ත්වයේ පවතින බැවින් එය කඩා ඉවත්කොට වර්තමානයට ගැලපෙන පරිදි නව ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමට මූල්‍ය ප්‍රතිපාදන හා අනුමැතිය ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතු යැයි මම සභාවට යෝජනා කරමි.**

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,අම්බලන්ගොඩ නගරය කියන්නේ වෙළඳ නගරයක්. විශාල වශයෙන් ජනතාව පැමිණ භාණ්ඩ මිලදී ගන්නා, තම කර්තව්‍යයන් ඉටු කරගන්නා නගරයක්.එම නිසා අප සභාව සතුව මේ සඳහා ප්‍රතිපාදන නොමැති වුවත් ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගෙන්ද, මධ්‍යයම රජයෙන්ද සහයෝගය ලබාගෙන වර්තමානයට සරිලන පරිදි පොදු වෙළඳ පොළත්, සාප්පු සංකීර්ණයත් සකස් කළ යුතුයි.මොකද අම්බලන්ගොඩ නගරයේ විශාල වෙළඳ වටිනාකමක් තිබෙනවා.පෞද්ගලික ආයතන ලක්ෂ ගණන් වලින් බදු අය කරනවා.ඒ නිසා වර්තමානයට ඔබින ලෙස නව ගොඩනැගිල්ලක් ඉදි කලොත් ආර්ථිකමකය වශයෙන් නගර සභාවටද විශාල වාසියක් අත් කරගත හැකියි.උදාහරණයක් ලෙස කාගිල්ස් ආයතනය මසකට ලක්ෂ දෙකක පමණ බද්දක් ගෙවනවා.මෙම මහ වීදියේ පොදු වෙළඳ පොල, මාලු වෙළඳ පොල අසළ විශාල ජනකායක් ගැවසෙනවා.නමුත් නිසි ක්‍රමවේදයක් නොමැතිකමින් අපට ලැබෙන ආදායමද ඇහිරිලා.සමහර කඩ වසා ඇති අතර ඒවායින් ලැබෙන්නේද කුඩා බදු මුදලක්.(බොහෝ කඩ ගබඩා වශයෙන්ද පවත්වාගෙන යනු ලබනවා.) ඒ නිසා මේ තත්වය නගරයේ දියුණුවට ගැළපෙන්නේ නෑ.ඒ අනුව මෙම යෝජනාව සඳහා අපගේ සම්පූර්ණ සහයෝගය අප ලබා දෙනවා.සංවිධායක ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගේ ප්‍රමුඛත්වයද ඇතිව නගරයේ හදවත වැනි විශාල වෙළඳ වටිනාකමකින් යුත් නගර සභාව සතු මෙම ස්ථානය අපට නිසි පරිදි ගොඩනැගිය හැකියි.නමුත් හරි ආකාරයෙන් සොයා නොබැලීම හේතුවෙන් මෙය අගාධයට ගොස් තිබෙනවා.ඒ නිසා ඔබතුමාගේ සහයෝගයත් ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. අප මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගෙන හොද සැලසුමක් යටතේ,නගර සභාවටත් ප්‍රතිපාදන ලැබෙන ආකාරයට,එමෙන්ම වෙළඳ මහතුන්ටත් නගරයේ ජනතාවටත් පහසුකම් ලැබෙන ආකාරයෙන් සුදුසු ක්‍රමවේදයක් සැදිය යුතුයි.නිසි මාර්ග සැලැස්මක් යටතේ පාරිභෝගිකයන් සඳහා

රථගාලක්ද සහිතව මෙය සැලසුම්ගත කොට ක්‍රියාත්මක කළ යුතුයි. මෙම යෝජනාව ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ටත් ඉදිරිපත් කළ අතර එතුමන්ද එම යෝජනාවට ප්‍රසාදය පළකරනු ලැබුවා.ඒ අනුව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාවද තිබෙන නිසා අබලන්ව ඇති පොදු වෙළඳ පොල වෙනුවට නව වෙළඳ සංකීර්ණයක් ගොඩනැගීම සඳහා ඔබතුමන්ලාගේ සහයෝගයද ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නාගරික මන්ත්‍රී රාහුල මහතා කළ යෝජනාව අම්බලන්ගොඩ නගර වැසියන්ට අත්‍යවශ්‍ය මූලික දෙයක්.නගර සභාව පිහිටුවීමට පෙර කීපවිටකදීම සංවර්ධන කමිටුවේදී මේ පිළිබද කථිකා කොට, ගරු මහ ඇමතිතුමාගේත් එකගතාවය තුළ මෙහි මිනින්දෝරු සැලැස්ම ලබාගැනීම වෙනුවෙන් කටයුතු කළා.මෙය කඩා ඉවත් කොට නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට දැන් අප සභාවට මුදල් නෑ.නමුත් මහ ඇමතිතුමාගේත් මධ්‍යම රජයේත් මුදල් ප්‍රතිපාදන ලබාගෙන වර්තමානයට උචිත පරිදි නව වෙළඳ සංකීර්ණයක් ඉදි කළයුතු බව මා ප්‍රකාශ කර සිටිනවා.මේ මාස දෙකට වැඩ කිරීම සඳහා මා හට ලක්ෂ දහසක් ලැබී තිබෙනවා.ඒ වගේම අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත්, ගෝනපිනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් අම්බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශයට අයිති බද්දේගම කොටස් 18 ටත් මේ වන විට මුදල් ලැබී තිබෙනවා.ඊට අමතරව ජනවාරි වන විට තව ලක්ෂ 2000ක පමණ මුදල් ලැබීමට නියමිතයි.ඒ නිසා මහ ඇමතිතුමාගේත් මධ්‍යම රජයේත් ප්‍රතිපාදන ලබාගෙන පහළින් රථගාල සහිතව (මාලු වෙළඳ පොලත් සමගම වහළක් ද ඇතිව) මැදින් යාමට ඉඩ තබා, විදේශ රටවල ඇති සුපිරි වෙළඳසැල් මෙන් ඉතා අලංකාරවත් ලෙස මෙම නව වෙළඳ සංකීර්ණය ඉදි කළහොත් අපට මෙයින් විශාල ආදායමක් ලබාගත හැකියි.ඒ නිසා ඔබතුමන්ට මේ සඳහා මූලිකත්වය ලබාගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටින අතර මගේත් ගරු මහ ඇමතිතුමාගේත් පූර්ණ සහයෝගය ලබා දෙන බවද මා ප්‍රකාශ කර සිටිනවා.ඒ නිසා 2019 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන තුළ, අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියද සමග සාකාච්ඡා කොට මේ සඳහා පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.ඉදිරි කාලය තුළ ගරු මහ ඇමතිතුමන්ටත් මටත් ලැබීමට නියමිත මුදල් වලින් කොටසක් (එකගතාවය මත ) මේ සඳහා යෙදවිය හැකි නිසා මෙය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා සහයෝගය ලබා දෙන බව මා ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නාගරික මන්ත්‍රී රාහුල මහතා ඉදිරිපත් කළ යෝජනාව නගරයට අවශ්‍ය ඉතා කාලෝචිත යෝජනාවක් ලෙස මා ප්‍රකාශ කර සිටිනවා.පොදු වෙළඳ පොළ වෙළඳාම් කටයුතු අකර්මණ්‍ය වී දැන් වසර 10කටත් වැඩියි.විමධ්‍යගත මුදල් නොලැබීම නිසාත් නගර සභාවේ අදායම මේ සඳහා ප්‍රමාණවත් නොවන නිසාත් මෙහි නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම දිනෙන් දින කල්ගත වුනා.රාහුල ලලිතවික්‍රම මහතාගේ මූලිකත්වයෙන් ගරු මහ ඇමතිතුමාගෙන්ද ප්‍රතිපාදන ලබාගෙන මෙය සිදු කිරීමට එතුමන් මැදිහත් වී තිබෙනවා.ඒ වගේම එතුමන් ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඇතුලු ඒ පක්ෂය නියෝජනය කරන නිසා අප විශ්වාස කරනවා ඔහුට මෙම ප්‍රතිපාදන ලබාගත හැකි බව.මෙවැනි යෝජනාවක් කිරීම සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතාට ස්තුතිවන්ත වන අතර ඒ සඳහා කොන්දේසි විරහිතව අප එතුමන්ට සහයෝගය ලබාදෙන බවත් ඊට අවශ්‍ය ප්‍රතිපාදන අම්බලන්ගොඩ නගර සභාව සඳහා ලබා ගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රාහුල මන්ත්‍රීතුමන් ඉදිරිපත් කළ යෝජනාවට අපගේ සහයෝගය පළමුව ප්‍රකාශ කර සිටිනවා.පිටස්තර පුද්ගලයකු අම්බලන්ගොඩ නගරයට පැමිණ පොදු වෙළඳ පොළ කොහේද කියා ඇසුවහොත් එය පෙන්වීම අපට මදිකමක් වනවා.ඒ නිසා මෙවැනි යෝජනාවක්

තුළ පොදු වෙළඳ පොළ ඉදි කිරීම අපට විශාල ශක්තියක් මෙන්ම විශාල කීර්තියක් වනවා.ඒනිසා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාහුල මන්ත්‍රීතුමන්ට මාගේ අවංක ස්තූතිය පුද කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාහුල මන්ත්‍රීතුමන්ට මාගේ ස්තූතිය පුද කර සිටිනවා.ඒ වගේම මේ සඳහා අවශ්‍ය විමධ්‍යගත මුදල් ලබාදීමට එකගතාවය පළ කිරීම සම්බන්ධයෙන් ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාටද මාගේ ස්තූතිය පිරිනමනවා.පක්ෂ භේදයකින් තොරව මෙවැනි කර්තව්‍යයක් කිරීම සඳහා මැදිහත් වීම පිළිබද ගරු විපක්ෂ නායක ඩෙනට් පනියන්දූවගේ මහතාටත් මාගේ ස්තූතිය පුද කර සිටින අතර මෙවැනි වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාහුල මැතිතුමාටත් මාගේ ස්තූතිය පුද කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විශාල ජනකායක් වෙළඳ කටයුතු සඳහා අම්බලන්ගොඩ නගරයට පැමිණෙනවා.එළවලු වෙළදාම සඳහා ප්‍රමුඛතාවය ගත් ලක්ෂ්මන් මුදලාලි මහතා වැනි ව්‍යාපාරිකයන් එම ස්ථනයේ තම වෙළඳ කටයුතු ඉතා සාර්ථකව කරගෙන ගියා.නමුත් අද සාමාන්‍ය පුද්ගලයකුට ගොස් එළවලු ටිකක් මිලට ගත නොහැකි පරිදිම මෙම වෙළඳ පොළ අපවිත්‍ර වී තිබෙනවා.අත්‍යවශ්‍යම කටයුත්තක් වන මේ ඉදි කිරීම අපට තවමත් කරගන්න නොහැකි වී තිබෙනවා.(වරාය සෑදීම නිසා අපේ ස්වභාවික පිහිනුම් තටාකයද වැසී ගියා.) එක්සත් ජාතික පක්ෂ සංවිධායක ගරු ඩෙනට් පනියන්දූවගේ මහතාගේද මැදිහත් වීමෙන් , ගරු නාගරික මන්ත්‍රී රාහුල මැතිතුමාගේ යෝජනාවක් මත ඉටු කිරීමට නියමිත මෙම අත්‍යවශ්‍ය කාර්යය ඉටු කිරීම සඳහා සියලුදෙනාගේම සහයෝගය මා අපේක්ෂා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කළ යෝජනාව කාලෝචිත හොද යෝජනාවක් ලෙස මා පිළිගන්නා අතර ඒ සඳහා මාගේ පූර්ණ සහයෝගය ලබා දෙන බවද ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සියලු දෙනාගේම එකගතාවය පරිදි එම යෝජනාව ඒකමතිකව සම්මත කර සිටිනවා.

**තීරණය -**

**අම්බලන්ගොඩ නගර සභාව සතු පැරණි පොදු වෙළඳ පොළ කඩා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම අම්බලන්ගොඩ නගර සභාව සතු පැරණි පොදු වෙළඳ පොළ හා සාප්පු සංකීර්ණය අබලන් තත්ත්වයේ පවතින බැවින් එය කඩා ඉවත් කොට වර්තමානයට ගැලපෙන පරිදි නව ගොඩනැගිල්ලක් ඉදිකර ගැනිමට මුල්‍ය ප්‍රතිපාදන ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගෙන් ලබා ගැනිමට අවශ්‍ය කටයුතු කළ යුතු යැයි ගරු නගරසභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා ඉදිරිපත් කරන ලද යෝජනාව පිලිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගරසභා මන්ත්‍රී ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.02.03** <u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.</u>

**අම්බලන්ගොඩ ධම්මකුසල විද්‍යාලය භාවිතයට නොගන්නා බැවින් එම විදුහල තුළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් හෝ ඵලදායී කාර්යයක් සඳහා යොදවන ලෙස ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගෙන් ඉල්ලා සිටීමට මම මෙම සභාවට යෝජනා කර සිටිමි.**

**ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්දු අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි,ධම්මකුසල විදුහල කියන්නේ මීට පෙර හොඳින් පවත්වාගෙන ගිය අද වැසී යන තත්වයට පත්ව ඇති විද්‍යාලයක්.ඒ වගේම මෙය ජලයද විදුලියද සහිත ශක්තිමත් ගොඩනැගිලි වලින් යුත් භූමියක්.නමුත් දැන් එය ජනතාවට කිසිම ප්‍රයෝජනයක් ගත නොහැකි පරිදි වල් බිහි වී ඇති අතර එය මහ අම්බලන්ගොඩ ජනතාවටත් ගැටලුවක් වී තිබෙනවා.මෙම විදුහලේ ප්‍රථම විදුහල්පතිවරයා ලෙස කටයුතු කළේ මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාගේ පියාණන්.හොඳ උගතුන් , සමාජ සේවකයන් පිරිසක් බිහි කළ මෙවැනි පාසලක් අද නන්නත්තාර වී තිබෙනවා.එහි ආදි ශිෂ්‍යාවක් වශයෙන් මේ පාසල අසළින් ගමන් කරන විට මටත් ඒ පිළිබඳ විශාල කණගාටුවක් ඇති වනවා.ඒ නිසා මේ පිළිබඳ ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ද සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව තමයි මා මේ යෝජනාව ඉදිරිපත් කළේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ යෝජනාව ඔබතුමිය මහ ඇමතිතුමන්ට ඉදිරිපත් කරන්න විදියක් නෑ. එතුමන් සමග සාකච්ඡා කළානම් මේ යෝජනාව දැමීම ප්‍රතික්ෂේප කරනවා. ඊට හේතුව මෙයට විරුද්ධව අධිකරණයේ නඩුවක් තිබෙනවා පාසලක් හැර (අධ්‍යාපන කටයුත්තක් හැර) වෙනත් දෙයකට මෙය යොදාගත නොහැකි බව.

**ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

මා මහ ඇමතිතුමන්ට කියා සිටියේ මෙය කුමන කාර්යයක් සඳහා හෝ යොදා ගන්නා ලෙස.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අධිකරණයෙන් දුන් තීන්දුව නිසා මෙම ස්ථානය සම්බන්ධයෙන් වෙනත් යෝජනාවක් ගත නොහැකි වනවා.

**ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

අධ්‍යාපන අමාත්‍යාශයෙන් මේ සඳහා යම් තීරණයක් ගත හැකිනම් ඒ පිළිබඳ සොයා බලා ක්‍රියා කරන ලෙස මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය අධ්‍යාපන අමාත්‍යාශයෙන් නොව ගරු අධිකරණය විසින් ගනු ලැබූ තීන්දුවක්.

**ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

මා මෙය යෝජනා කළේ මින් ඉදිරියට හෝ ප්‍රයෝජනයක් ගත හැකි පරිදි මෙය යොදා ගනීවි යන සංකල්පයෙන්.වල් බිහි වී ඇති බැවින් මත්ද්‍රව්‍ය ආදී නොයෙකුත් දේවල් වලට ඇබ්බැහිවූවනේගන් තර්ජනයක් විය හැකියි.ඒ නිසා අඩු තරමේ මෙය සුද්ධ පවිත්‍ර කර දෙන ලෙසවත් මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.කිසිම ආරක්ෂක තත්වයක් එම ස්ථානයේ නෑ.ඒ නිසා මේ ගැන අවධානය යොමු කොට ධම්මකුසල විදුහල සම්බන්ධයෙන් කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මා එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමාගෙන්ද ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මම හිතන්නේ නිලානි මන්ත්‍රීතුමියට මේ පිළිබද නිවැරදි අවබෝධයක් තිබී නෑ.ධම්මකුසල විද්‍යාලය වැසීම පිළිබදව මහ අධිකරණ නඩු තීන්දුවේ තිබෙන්නේ මෙහි පාසලක්ම දැමිය යුතුයි යන්නයි.2016 වර්ෂයේදී මා මෙහි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සදහා කරුණු සොයා බැලීමේදී දැන ගන්නට ලැබුනේද ඒ සදහා අයිතියක් නීතිය මගින් නොමැති බවයි.මහ අධිකරණ තීන්දුවේ තිබෙන්නේ මෙය අනිවාර්යයෙන්ම පාසලක් විය යුතු බවයි. සංවර්ධන කමිටුවේදී කීප වතාවක්ම මේ පිළිබද සාකච්ඡා කළා.මෙහි අයිතිය තිබෙන්නේ පළාත් සභාවට නිසා කලාප අධ්‍යක්ෂතුමිය විසින් යෝජනා කර තිබෙනවා ගා/ප්‍රජාපති ගෝතමී බාලිකා විද්යාලයේ ඉඩ පහසුකම් නොමැති නිසා එම විදුහලේ ප්‍රාථමික අංශය ධම්මකුසල විදුහල් භූමියට රැගෙන යන ලෙස.නමුත් එම යෝජනාව තවම සංවර්ධන කමිටුවට ඉදිරිපත් වුනේ නෑ.නමුත් නගරයේ තිබෙන ප්‍රජාපතී විදුහලේ කොටසක් හෝ ධර්මාශෝක විදුහලේ කොටසක් මෙතැනට රැගෙන යා යුතුයි.ඒ නිසා එය ඉදිරියේදී සිදුවේවි. එහි සමහර ගොඩනැගිලි භාවිතා කළ හැකි අතර සමහර ගොඩනැගිලි භාවිතා කළ නොහැකි තත්වයේ පවතිනවා.මන්ත්‍රීතුමිය සදහන් කළ පරිදි මෙහි කැලෑ වැදී තිබෙන නිසා මෙය විවිධ සමාජ විරෝධී ක්‍රියා සදහා භාවිතා කරනු ලබනවා.ඒ නිසා මෙය සුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බව මා ප්‍රකාශ කර සිටිනවා.නමුත් මෙය උසාවි නියෝගයක් නිසා නිලානි මන්ත්‍රීතුමියගේ යෝජනාව සිදුකළ නොහැකි වනවා.ඒ අනුව මෙතැන පාසලක් ඉදි කළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාංගන භූමිය නම් වූ එල් හැඩයක් ආකාරයට පිහිටි අක්කර හතරහමාරක් වූ භූමියත් ධම්මකුසල විදුහල් භූමියට යාබද කළ හැකිනම් අම්බලන්ගොඩ තිබෙන විශාලම ක්‍රීඩාංගනය බවට (අක්කර පහක හයක පමණ ) එය පත්කළ හැකියි. ඒ සදහා මෙම විදුහල් භූමිය ලබා ගැනීමට මා උත්සාහ කළත් මීට අදාළ නඩු තීන්දුව නිසා ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යභාරයක් ඉටුකළ නොහැකි තත්වයට පත්ව තිබෙනවා.ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ද මේ තත්වය පිළිබද දැනුවත්.එතුතමන්ද මෙම ස්ථානය කුමන හෝ කටයුත්තක් සදහා යොදා ගැනීමට උත්සාහ කළා.නමුත් මෙහි පසෙහි යට තිබෙන තත්වය අනුව උස් ගොඩනැගිලි ඉදි කිරීමේ බාධාවක් තිබෙනවා.මෙහි අඩි 80 ක පමණ කිරිමැටි තට්ටුවක් තිබෙනවා.ඒ නිසා මෙහි ලොකු ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු නැවතුනා.නැතිනම් මේ වනවිට එම පාසල නැවත ස්ථාපනය වී අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමන් මට වඩා නීතිය හුගක් දන්නා කෙනෙක්.ඒ නිසා මේ තීන්දුවට එරෙහිව අපට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිද? යන්න මා විමසා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අභයාචනයක් ඉදිරිපත් කිරීමේ කාලය ඉකුත්ව ගොස් තිබෙනවා.එය අපේ කාර්යයක් නොවෙයි, එය අධ්‍යාපන අමාත්‍යාංශය සතු කාර්යයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නිලානි මන්ත්‍රීතුමිය ඉගෙනගත් පාසල ලෙස,අද එය පත්වී තිබෙන තත්වය අනුව එම මන්ත්‍රීතුමිය කළේ හොද යෝජනාවක්.ගරු මන්ත්‍රීතුමිය එහි තිබෙන අධිකරණ තීන්දුව පිළිබද දැනුවත් වී තිබුනේ නෑ.ඔබතුමන් විසින් ඒ පිළිබද දැනුවත් කිරීම වැදගත් වනවා.

මීට පෙර ප්‍රජාපතී බාලිකා විදුහලේ ප්‍රාථමික අංශය මෙම ස්ථානයට රැගෙන යාමට උත්සාහ කරන අවස්ථාවේදීත් එහි උද්ඝෝෂණයක් ඇතිවුනා.එදින මාත් ගරු සභාපතිතුමාත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, වජිර අබේවර්ධන ගරු ඇමතිතුමාත් එම අවස්ථවේ සිටියා.ඒ අවස්ථාවේ ජනතාව අවබෝධ කර ගත්තේ නෑ ඒ පාසල ඔබතුමන් කියූ ආකාරයෙන් දියුණු කළ හැකි බව.ඒ දිනවල ප්‍රදේශවාසීන් පවා මේ පිළබද උනන්දුවක් දැක්වූයේ නෑ.මොකද වැඩි වශයෙන් මෙයට සහභාගී වී තිබුනේ පිටස්තර පුද්ගලයන්.නමුත් දැන් ඒ පිළිබද ජනතාව තේරුම්ගෙන තිබෙනවා.අධිකරණ කටයුත්තක් නිසා මෙය සිදු කළ නොහැකි වුවත් මෙහි අයිතිය තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයටයි.නමුත් ඉදිරියේදී පාසලක් ඉදිකරන තෙක් හෝ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ගේ අනුදැනුමින් යුක්තව එහි සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එසේනම් එම යෝජනාව සම්මත කර සිටිනවා

**තීරණය**

**අම්බලන්ගොඩ ධම්මකුසල විද්‍යාලය භාවිතයට නොගන්නා බැවින් එම විදුහල තුළ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් හෝ ඵලදායි කාර්යයක යොදවන ලෙස ගරු අමාත්‍ය ෂාන් විජයලාල් මැතිතුමාගෙන් ඉල්ලා සිටින ලෙසට කරන ලද යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව මෙය පාසලක් සඳහා පමණක් යොදා ගැනිම සුදුසු බවටත් වෙනත් කිසිඳු කාර්යයක් සඳහා යොදාගත නොහැකි බවටත් මහාධිකරණ නඩු තින්දුවක් ගෙන ඇති බැවින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පන්යන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

- පෙරවරු 11.20 ට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවට පැමිණියා.

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1 2018-09-18** දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව

<u>**2018** සැප්තැම්බර් මස **18** වන දින පුස්තකාල කමිටු වාර්තාව</u>

| | |
|---|---|
| • ගරු සභාපති | ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | ඩී.ධර්මදාස මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | නන්දන රාජපක්ෂ මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | ධනසේන මාදුවගේ මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රිනි | එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මිය |
| • කමිටු සාමාජික | එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා |
| • කමිටු සාමාජික | සුගත් හෙට්ටිආරච්චි මහතා |
| • කමිටු සාමාජික | හර්බට් වීරක්කොඩි මහතා |
| • කමිටු සාමාජික | එම්.ඒ.ජයවීර මහතා |
| • කමිටු සාමාජික | හර්බට් වීරක්කොඩි මහතා |
| • කමිටු සාමාජික | ටී.ඩබ්.හරිස්චන්ද්‍ර මහතා |
| • කමිටු සාමාජික | ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා |
| • කමිටු සාමාජික | ප්‍රේමසිරි රතුවඩු මහතා |
| • කමිටු සාමාජික | සිරිපාල මාදුවගේ මහතා |
| • ලේකම් | බී.ඒ. ධම්මිකා මිය |
| • ප්‍රජා සංවර්ධන නිලධාරී | ඩී.වී.තරංගි මිය |
| • පුස්තකාලයාධිපති | කේ.ඩබ්ලිව්.රංජනී මානෙල් මෙනවිය |
| • පුස්තකාලයාධිපති | ඩී. මහේෂා තාබ්‍රේව් මෙනවිය |
| • පුස්තකාල සහායිකා | ඒ.ජී.රසිකා මිය |
| • පුස්තකාල සහායිකා | බී.එච්.දයාලතා මිය |
| • පුස්තකාල සහායිකා | එම්.ඩබ්ලිව්. ජේ.සුමංගලී මිය |
| • පුස්තකාල සහායිකා | එස්.සුසිලා දීපානි මිය |

- පුස්තකාල සහායිකා මාලති සමන්තා ආරියසිංහ මිය
- පුස්තකාල සහායිකා ඒ.ජී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය
- පුස්තකාල සහායිකා ජී.එච්.එල්.පියන්ති මෙනවිය
- පුස්තකාල සහායිකා එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මිය
- පුස්තකාල සහායක ඒ.ඩබ්.ඉන්ද්‍රදාස මහතා

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ 2018/09/18 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව</u>

- ගරු සභාපතිතුමා කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. 2.30 ට පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

- එතුමා විසින් කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, විශේෂයෙන් පුස්තකාල කමිටුවට පැමිණි ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතාගේ බිරිඳ වන කේ.එල්. කල්‍යාණි මහත්මිය, පුස්තකාල කමිටු සාමාජික මහතුන්, ලේකම්තුමිය සහ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිනියන් සහ පුස්තකාල සහායක සහායිකාවන් ඇතුලු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදි.

- පළමුවෙන්ම පුස්තකාල කමිටුවට අනුපමේය සේවයක් ඉටුකළ ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතාගේ අභාවය වෙනුවෙන් විනාඩියක නිෂ්ශබ්ද තාවයක් ආරක්ෂා කිරීම සිදුවිය. සභාපතිතුමා විසින් පසුගිය දින අභාවයට පත් වූ ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පුස්තකාල කමිටුවට කල අනුපමේය මෙහෙවර පිළිබඳවත් එතුමාගේ අභාවය නිසා පුස්තකාල කමිටුවට සිදුවන අපහසුතාවය පිළිබඳවත් ගුණ කථනයක් සිදු කරන ලදි. එතුමා අවුරුදු 21 පමණ කාලයක් සිට පුස්තකාල කමිටුවට ස්වේච්ඡාවෙන් උදව් කිරීම පිළිබඳවත් අම්බලන්ගොඩ නගරයටම එතුමා සිදුකල මෙහෙය ඉතාමත් අගය කොට සලකන බවත් ප්‍රකාශ කරන ලදි.

- ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා විසින් අවසන් වරට රචිත "කොරල් කොදෙව්ව" ග්‍රන්ථයෙන් පිටපත් 05ක් එතුමාගේ බිරිඳ විසින් පුස්තකාලයාධිපතිනියට පරිත්‍යාග කරන ලදි.

- ටී.ඩබ්. පියසිරි මහතා පුස්තකාල කමිටුවට සහභාගී වීමට නොහැකි බව දන්වා ලිපියක් එවා ඇති බව සභාපතිතුමා කමිටුවට දන්වන ලදි.

- පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදු කරන ලදි.

- ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාලවල ප්‍රගතිය ඒ ඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි. විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදි.

- ශාඛා පුස්තකාලවල සමහර පොත් බැඳීම සිදුකර නොමැතිව එම පොත් පාඨකයන්ට පරිහරණය කිරීමට යොදා ඇති බව පෙනී යන බව සභාපතිතුමා විසින් කමිටුවට දන්වන ලදි. එම නිසා පොත් ඉක්මනින් විනාශ වීම සිදුවන බැවින් එම පොත් සුළු ප්‍රමාණයක් හෝ රැගෙනවිත් බැඳීම සිදුකල යුතුබව සභාපතිතුමාගේ අදහස විය. සාහිත්‍ය මාසයේ මිළදී ගන්නා ලද පොත් ශාඛා පුස්තකාල භාර සහායිකාවන්ට භාර දී ඒවා පාඨකයන්ට පරිහරණය කිරීමට සලස්වා පසුව කොටස් වශයෙන් රැගෙනවිත් බැඳීම සිදුකර ගත හැකි බව පුස්තකාලයාධිපතිනිය කමිටුවට දන්වන ලදි.

❖ ජාතික කියවීමේ මාසයේ පවත්වන උත්සවය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම.

සැප්තැම්බර් මස 17 වන දින ජාතික කියවීමේ මාසයේ පවත්වන තරග ආරම්භ කර ඇති බව පුස්තකාලයාධිපතිනිය කමිටුවට දන්වන ලදි. සාහිත්‍ය උත්සවය ඔක්තෝබර් මස 19වන දින පවත්වන බවත් එයට මහාචාර්ය ජී.බී. දිසානායක මහතාගේ පැමිණීම අනිවාර්ය බව සහතික කොට එදිනට එතුමාගේ පැමිණීම පිළිබඳ සොයා බැලීමට හර්බට් වීරක්කොඩි මහතාට පවරන ලදි.

- “සත්මඩල” මාසික සඟරාව පුස්තකාලයට මිළදී ගැනීම සම්බන්ධ ලිපිය සභාපතිතුමා විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි. ප්‍රධාන පුස්තකාලයට පමණක් එම සඟරාව මිලදී ගැනීමට පුස්තකාල කමිටුවේ සාමාජික මහත්ම මහත්මීන්ගේ අදහස විය.
- කෙරමිණිය ශාඛා පුස්තකාලයේ නම පීටර් ද සිල්වා අනුස්මරණ පුස්තකාලය ලෙස නම් කිරීමට ප්‍රජා මණ්ඩල රැස්වීමේදී අනුමත වූ බව සභාපතිතුමා කමිටුවට දන්වන ලදි.
- ඕකන්ද ශාඛා පුස්තකාලයට වතුර ටැංකියක් ලබාදීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට උපදෙස් ලබාදෙන ලදි.
- අලුතින් විෂය නිර්දේශිත පොත් ලබාදෙන මෙන් ඉල්ලා ඇති ශාඛා පුස්තකාල සඳහා එම පොත් මිලදී ගැනීමට අවශ්‍ය මුදල් වෙන් කරගත හැකිබව සභාපතිතුමා කමිටුවට දන්වන ලදි.
- හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලය ඉරිදා දින විවෘත කර ඒ වෙනුවට සතියේ දිනයක් පුස්තකාලය වසා තැබීමට කටයුතු කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි. ඒ අනුව ඒ පිළිබඳ සොයා බලා කටයුතු කර ඉරිදා දින එම ශාඛා පුස්තකාලය විවෘත කිරීමට කටයුතු යොදන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදි.
- පසුගිය කමිටුවලදී ශාඛා පුස්තකාලවල ඉදිරිපත් වූ අඩුපාඩු පිළිබඳ සොයා බලා ඉක්මනින් ඒවාට විසඳුම් ලබාදෙන ලෙස සභාපතිතුමා විසින් ලේකම්තුමියට උපදෙස් ලබාදෙන ලදි.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතාගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කල අතර එතුමාගේ මෙහෙවර පිළිබඳ ගුණ කථනය කොට ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු අවසක් කරන ලදි.

....................................

කමිටු ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ

.......................................

ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ

..................................

අත්සන් කළේ සභාපති
නගර සභාව අම්බලන්ගොඩ

**තීරණය**

**2018-09-18 දින ප.ව 2.30ට පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2 2018-09-19 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව**

**<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**

**2018.09.19 ප.ව.2.30**

**<u>සහභාගීත්වය</u>**

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්. — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
2. ග්‍රේෂන් කෙරමිණියගේ — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව

3. ජී.ජී රුවිනි පේෂලා ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව.
4. ධනසේන මාදුවගේ ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව.
5. ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව.
6. ජී.සරත් ශ්‍රී ලාල් ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව.
7. වෛද්‍ය නිමාලි විජයසිංහ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරී, අම්බලන්ගොඩ
8. බී.ඒ ධම්මිකා. ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.
9. එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි ආයුර්වේද වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව.
10. වෛද්‍ය වී.ජී.සී ජීවනී. පශු වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ.
11. බී.එම්.යු.කේ ප්‍රනාන්දු (මහේෂ්) මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර.
12. ඩී.එස්.ඊ ගමගේ. පවුල් සෞඛ්‍ය නිලධාරී, සෞ.වෛ.නි කාර්යාලය.
13. පී.එම් විජේසිංහ තාක්ෂණ සේවා නිලධාරී.අම්බලන්ගොඩ නගර සභාව
14. ආර්.එම්.ඩබ්.බන්දුල උප පොලිස් පරීක්ෂක,අම්බලන්ගොඩ
15. තිලක් හර්ෂදේව ද සිල්වා ග්‍රාම නිලධාරී,86ඊ ඕකන්ද
16. පී.එච්.අමිත් ක්‍රිෂාන්ත පර්යන්ත පරිපාලක,ධීවර වරාය
17. කේ.ගුරුගේ පින්නදූව
18. ඒ.එල්.එස්. ද සිල්වා කළමනාකාර සහකාර.අම්බලන්ගොඩ නගර සභාව
19. එම්.ඩබ්.හිරාන් සංජීව සෞඛ්‍ය පරිපාලක, අම්බලන්ගොඩ නගර සභාව
20. ඒ.අයි සාරංග සෞඛ්‍ය පරිපාලක. අම්බලන්ගොඩ නගර සභාව

**පිළිගැනීම**

ගරු නාගරික මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් හා සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනුලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | සාකච්ඡා වූ කරුණු. | තීරණය. |
|---|---|---|---|
| **2018**.08.20 දින පැවති **රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනය.** | | | |
| නගර සභා සේවකයන් යොදවා මාළු ලැලි ඉවත් කිරීම | තාක්ෂණ සේවා නිලධාරී.පී.එම් විජේසිංහ මෙ.වි. | වැඩපරිපාලක මහතා හට තනිව සිදුකළ නොහැකි බව | කර්මාන්ත අංශයේ සේවකයන් යොදවා සිදු කිරීම. |
| සුනඛයින් රැක බලාගැනීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම. | ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණිය මහතා සහ ජී.සරත් ශ්‍රී ලාල් මහතා | මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් පසු මහජනයාට සිදුවන යහපත පිළිබඳව කරුණු පැහැදිලි කරදීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව | මහජන විරෝධතා මැද සුනඛ රැඳවුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීම |
| කසල බැහැර කරන ඉඩමේ ගේට්ටුව සවි කිරීම. | තාක්ෂණ සේවා නිලධාරී.පී.එම් විජේසිංහ මෙ.වි. | පසුගිය මාසික සභාවට අදාල ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති බව | ඇස්තමේන්තු දෙකට අදාල ඉතිරි කටයුතු සිදුකර කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීම. |
| පෝරොක් ඇළෙන් අධික දුර්ගන්ධයක් හමන බවට ලැබී ඇති පැමිණිල්ල | ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | පෝරොක් ඇළේ ඇති අධික දුර්ගන්ධය නිසා මැස්සන් විශාල ලෙස බෝ වීමෙන් අවට නිවාස වල මහජනතාවට සිදුවන අපහසුතාවය | කඩිනමින් පස් දමා ස්ථරය වසා දමා ඇළ පිරිසිදු කිරීම |
| | ග්‍රාම නිලධාරී තිලක් හර්ෂදේව මහතා | පීරිස් වෙද මාවතට පහළින් කළුවඩුමුල්ල පෙදෙස කාණුවෙන් කළු පාට දියරයක් ගලා යන බව | |
| සම්පත් ෆාමසිය අසල කාණුවෙන් අධික දුර්ගන්ධයක් ඇතිවීම | මහජන සෞඛ්‍ය පරීක්ෂක බී.එම්.යූ.කේ.ප්‍රනාන්දු මහතා | ස්ථානය පරීක්ෂා කිරීමෙන් පසු කාණු හා වැසිකිළි වලවල් පවිත්‍ර කර ඇති නිසා තත්වය සමනය වී ඇති බව | - |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වෙනුවෙන් වෙන්කළ ආරක්ෂිත ස්ථානයක් සකස්කිරීම. | තාක්ෂණ සේවා නිලධාරී.පී.එම් විජේසිංහ මෙ.වි. | සැප්තැම්බර් මාසික සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති බව | - |
| සෞඛ්‍ය හා කර්මාන්ත අංශයේ රාජකාරී ආවරණය සඳහා නිශ්චිත සේවකයකුගේ අවශ්‍යතාවය | නගර සභා ලේකම් බී.ඒ.ධම්මිකා මිය | - | නිල්මිණි නොමැති දිනවලදී රාජකාරී ආවරණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ඒ.එච්.දීපිකා මහත්මිය යෙදවීම. |

| | | | |
|---|---|---|---|
| තාක්ෂණ සේවා නිලධාරීන් හට මේසයක් හා පුටු දෙකක් ලබා දීම. | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා | - | මිල ගණන් කැඳවා ඉක්මනින් ලබාදීම |
| මහවීදිය පියල් මහතාගේ ගැස්කඩය අසල ළිඳ පිරිසිදු කිරීම හා වෙරළ උද්‍යානය අසල ඇති ධීවර ළිඳ පිළිසකර කිරීම | මහජන සෞඛ්‍ය පරීක්ෂක බී.එම්.යූ.කේ.ප්‍රනාන්දු මහතා | ළිං දෙකම අවට පිරිසිදු කර ඇති බව | වෙරළ උද්‍යානය අසල ඇති ධීවර ළිඳ පිළිසකර කිරීම සඳහා කඩිනමින් කොන්ත්‍රාත්කරුවෙකු සොයා ගැනීම. |
| **ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම** | | | |
| සුනඛ රැඳවුම් මධ්‍යස්ථානයක් සඳහා අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් ඉඩමක් වෙන් කර ගැනීම | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | ලිපියේ සඳහන් නිර්නායක වලට සියළුදෙනා එකඟතාවය පළ කරන ලදී. | සියළු විරෝධතා මැද සුනඛ රැඳවුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කටයුතු කිරීම |
| **අදහස් හා යෝජනා** | | . | . |
| ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සිටින සුනඛයා ඉවත් කිරීම. | ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා | පොල්වත්ත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සිටින සපාකන සුනඛයකු විසින් බෙහෙත් ලබාගැනීමට පැමිණෙන රෝගීන්ට සිදුවන කරදරය | සුනඛයා ඉවත් කිරීමට කටයුතු කිරීම. |
| පෝරොක් ඇළ වෙත ගහක් කඩා වැටීම | ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා | සිරිපාල මාදුවගේ මහතාගේ නිවස පිටුපසින් පෝරොක් ඇළ වෙත ගහක් කඩා වැටී ඇති බව | බැකෝ රථය ආධාරයෙන් ගස ඉවත් කිරීම. |
| කොඩිකාර පෙදෙස දෙපැත්ත පාරේ කාණු පවිත්‍ර කිරීම | ගරු නගර සභා මන්ත්‍රී ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | කොඩිකාර පෙදෙස දෙපැත්ත පාරේ කාණු පද්ධතිය වල්බිහි වී ඇති නිසා ජලය බැසයාම අවහිර වී ඇති බව | තණකොළ කපන යන්ත්‍රය ආධාරයෙන් කාණුව පවිත්‍ර කිරීම. |
| ගුඩ්ෂෙඩ් පාරේ කාණුවේ අපද්‍රව්‍ය සිර වීම හා බෝක්කුව සකස් කිරීම. | ග්‍රාම නිලධාරී තිලක් හර්ෂදේව මහතා | දුම්රිය ස්ථානය පිටුපස ගුඩ්ෂෙඩ් පාරේ කාණුවේ අපද්‍රව්‍ය සිර වී ඇති බව හා එම ස්ථානයේ බෝක්කුවසෑදීම සඳහා ඇස්තමේන්තු සමයා ඇති බව | අදාල මාර්ගයේ කාණු හා බෝක්කුව පිළිබඳ තත්ව වාර්තාවක් සෞඛ්‍ය පරිපාලකවරුන්ගෙන එම වාර්තාව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීම. |
| | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා | එම පාර මාර්ග සංවර්ධන අධිකාරිය සතු බැවින් බොක්කුව සකස් කිරීම සඳහා මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සම්බන්ධීකරණ කමිටුවට යොමුකළ යුතු බව | |

| | | | |
|---|---|---|---|
| පඤ්ඤාලෝක මාවතේ කළුවඩුමුල්ල ළිඳ පිළිසකර කිරීම. | ගරු නගර සභා මන්ත්‍රී ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | - | කළුවඩුමුල්ල ළිඳ පිළිසකර කිරීම. |
| දේවානන්ද විද්‍යාලය දෙපස කාණු පද්ධතිය පිරිසිදු කිරීම | ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී රුවිනි පේෂලා මහත්මිය | දින දෙකකට වරක් වත් එම කාණු පිරිසිදු කළ යුතු බව | |
| අළුත් පාරේ කාණු පිරිසිදු කිරීම | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා | කාණු පිරිසිදු කිරීම සෞඛ්‍ය අංශයේ කාන්තාවන් ලවා සිදුකිරීමේදි ඔවුන් ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කිරීම සම්බන්ධ ගැටළුව | සෞඛ්‍ය කම්කරුවන් යොදා අළුත් පාරේ කාණු පිරිසිදු කිරීම |
| පෝරඹ දේවාල පිටුපස කාණුව පිරිසිදු කිරීම | ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණිය මහතා | පෝරඹ දේවාල පිටුපස කාණුව පස් සිර වී ඇති බව | එම කාණුවේ පස් ඉවත් කර ජලය බැසයාමට හැකි පරිදි කාණුව පිරිසිදු කිරීම. |
| පටබැදිමුල්ල ළමා හා ගර්භණී මවුවරුන්ගේ සායනය අළුත්වැඩියා කිරීම. | පවුල් සෞඛ්‍ය නිලධාරී ඩී.එස්.ඊ ගමගේ මහත්මිය | සායනයේ විදුලිය හැර සියළු වැඩ අවසන් කර ඇති බව හා සායනය නැවත ආරම්භ කිරීම සඳහා භාණ්ඩ පිළිවෙලකට තබා ගැනීමට සෞඛ්‍ය කම්කරුවන් අවශ්‍ය බව | සායනය පිළිවෙලකට සකස් කර ගැනීමට සහය සඳහා නිල්මිණි දින දෙකක් සඳහා නිදහස් කිරීම. |
| රාත්‍රී වැඩකරන වාහන වල ස්ටිකරයක් ඇලවීම හා රාත්‍රී වැඩකරන සේවකයන් සඳහා විවේක කාමරයක් සකස්කිරීම. | නගර සභා ලේකම් බී.ඒ. ධම්මිකා මිය | රාත්‍රී වැඩකරන සේවකයන් සඳහා ලබා දී ඇති නිල ඇඳුම පැළඳිය යුතු බව හා රාත්‍රී වැඩකරන සේවකයන් හට නොයෙක් අපහසුතා මත රාත්‍රී රාජකාරි කිරීමෙන් පසු නිවෙස් වලට යාම හා නැවත උදෑසනින්ම රාජකාරියට පැමිණීම අපහසු බව | රාත්‍රී සේවය සඳහා යොදාගන්නා වාහනවල අනතුරු අවම කර ගැනීම සඳහා ආලෝකය පරාවර්ථනය වන ස්ටිකරයක් ඇලවීම හා රාත්‍රී සේවකයන් සඳහා විවේක කාමරයක් සකස් කිරීමට සුදුසු ස්ථානයක් තිරණය කර ඒ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. |
| පාරේ කුණු දමන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරිම. | උප පොලිස් පරීක්ෂක ආර්.එම්.ඩබ්.බන්දුල මහතා | පාරේ කුණු දමන හෙප්පු මුල්ල,තල්ගස්ගොඩ ඇතුළු කොට්ඨාශ වල ජනතාව නඩු පැවරීම කාර්ය සිදුකිරීම සඳහා පරිසර පොලිසියේ කාර්ය මණ්ඩලය නොමැති බව හා ධම්මිකපුර කාණු පිරිසිදු කළ යුතු බව | පාරේ කුණු දමන පුද්ගලයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බව දැනුම්දීම. |
| නගර සභා ආයුර්වේද මධ්‍යස්ථානයේ බෙහෙත් | ආයුර්වේද වෛද්‍ය නිලධාරී එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි | සියළු පළාත් පාලන ආයතන වල වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා උස් |

| | | | |
|---|---|---|---|
| තෙල් ප්‍රමාණවත් නොවීම. | මහත්මිය | රජයේ අනුමත මුදල බෙහෙත් තෙල් මිලදීගැනීමට ප්‍රමාණවත් නොවන බව | ඇඳක් ලබාගැනීමට කටයුතු කිරීම. |
| | නගර සභා ලේකම් බී.ඒ.ධම්මිකා මිය | නොමිලේ ලැබෙන බෙහෙත් වලට අමතරව සභා අරමුදලින් රු:50000/- ක මුදලක් බෙහෙත් මිලදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දී ඇති බව | |
| ඕකඩ ඇළ පිරිසිදු කිරීම | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා | - | බැකෝ රථය ආධාරයෙන් ඕකඩ ඇළපිරිසිදු කිරීම. |
| **ස්තුති කතාව** | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා | අද දින කමිටුවට සහභාගී වූ මන්ත්‍රී වරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීනිය,ආයුර්වේද වෛද්‍යතුමිය සහ පශු වෛද්‍ය නිලධාරිනිය ඇතුළු සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව. | |
| **නිමාව** | | ප.ව 4.30 | |

සකස් කළේ
කළමනාකරණ සහකාර

නිර්දේශ කරමි | අනුමත කරමි.

ලේකම්
අම්බලන්ගොඩ නගර සභාව.

සභාපති
අම්බලන්ගොඩ නගර සභාව.

**තීරණය -**

**2018- 09- 19 දින ප.ව 2.30 ට පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රීලාල්ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3 2018- 09- 11 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ හල්වතුර ඉඩම සම්බන්ධ වාර්තාව**

<u>**අම්බලන්ගොඩ හල්වතුර ඉඩම් සම්බන්ධ වාර්තාව -2018.09.11**</u>

**පැමිණීම**

01. එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපතිතුමතා
02. නන්දන රාජපක්ෂ මහතා - ගරු නගර සභා මන්ත්‍රී
03. ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී
04. රාහුල ලලිතවික්‍රම මහතා -ගරු නගර සභා මන්ත්‍රී
05. බී. ඒ.ධම්මිකා මිය -ලේකම්,නගර සභාව,අම්බලන්ගොඩ
06. අබේකෝන් මහතා -අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය, ගාල්ල
07. තුෂාරි දිසානායක මිය -සහකාර අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය, ගාල්ල
08. එම්.වී ශිරෝමා රංජනී මිය -සැලසුම් නිලධාරී,නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල
09. කේ.ජී.ඉනෝකා මිය -ඉඩම් නිලධාරී,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ
10. කේ.ඒ.ශශිකා පෙරේරා මිය -සංවර්ධන නිලධාරී,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ
11. ආර්.ඩබ්.ඩී.මල්කාන්ති මිය -සංවර්ධන නිලධාරී,නගර සභාව,අම්බලන්ගොඩ

**පිළිගැනීම- එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපතිතුමා,නගර සභාව,අම්බලන්ගොඩ**

අම්බලන්ගොඩ හල්වතුර ව්‍යාපෘතිය වෙනුවෙන් අත්පත් කරගන්නා ලද ඉඩම පිළිබඳ සාකච්ඡා කිරීම වෙනුවෙන් පැමිණි නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සාකච්ජාව වෙනුවෙන් පිළිගන්නා ලදී.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපතිතුමා,නගර සභාව,අම්බලන්ගොඩ**

මහනගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයෙන් අපෙන් ඉල්ලීමක් කරලා තිබුණා හල්වතුර ව්‍යාපෘතියේ ඉඩම් නැවත ලබා දෙන්න කියලා. අපි මේ පිළිබඳව නගර සභා මසික සභාවේදී සාකච්ජා කළ අවස්ථාවේදී මෙම ඉඩම් කොටස් අතරින් නගර සභාවට අවශ්‍ය ඉඩම් නාගරික සංවර්ධන අධිකාරීයේ අදහස් දැනගන්න මං කැමති.

**අබේකෝන් මහතා- අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල**

නගර සභාවේ අවශ්‍යතාවය වෙනුවෙන් අපි මේ ඉඩම් අත්පත් කරගත්තේ ,නගර සභාව ලක්ෂ 19 ක් මේ සඳහා වන්දි ගෙවලා තියෙනවා. නමුත් සම්පූර්ණයෙන්ම වන්දි ගෙවීම සඳහා නගර සභාවට මදල් ප්‍රතිපාදන නොමැති නිසා මේ ඉඩම් කොටස් ටික වන්දි ගෙවීම කටයුතු අවසන් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට කඩිනමින් ලබාදීම සුදුසු වෙනවා. මොකද හල්වතුර ප්‍රදේශය අවට සංවර්ධනය වෙමින් පවතින නිසා අනවසර ක්‍රියා සිදුවෙමින් පවතිනවා. එනිසා නගර සභාවට අවශ්‍ය ඉඩම් කොටස් තබාගෙන ඉතිරි කොටස් අපට ලබා දෙන්න,මේ කටයුතු අවසන් කරන්න.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපතිතුමා,නගර සභාව,අම්බලන්ගොඩ**

ඔබතුමාලා නිදහස් අවකාශ ලෙස වෙන් කරලා තියෙන ප්‍රදේශ අපි ඒ අයුරින්ම තබන්න ඕන. ඒ වගේම ක්‍රීඩාංගනය වෙනුවෙන් වෙන් කරලා තියෙන කොටසත් අපි ඒලෙසම තබාගන්න ඕන. සියලු ප්‍රදේශ සංවර්ධන කටයුතු සඳහා ගොඩ කරන්න හොඳ නෑ. ජල පෝෂක ප්‍රදේශ ගොඩකරන්නේ නැතුව තියාගන්න ඕන නැතිනම් ගංවතුර අවධානමක් ඇතිවෙන්න පුලුවන්. ඒ වගේම අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට නව කාර්යාල ගොඩනැගිල්ලක් හදන්න හල්වතුර භූමියෙන් ඉඩම් කොටසක් ඉල්ලනවා. ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව මඟින් සංවර්ධනය කරලා තියෙන ප්‍රදේශයේ පොදු කටයුතු වෙනුවෙන් වෙන් කරලා තියෙන 10% භූමි ප්‍රදේශය සහ ක්‍රීඩාංගනයේ කොටසක් මේ වෙනුවෙන් අපි ලබා දෙන්න තීරණය කරලා තියෙනවා. ඒ අනුව විනෝද කටයුතු වෙනුවෙන් අහිමි වෙන භූමියෙන් සිදු වන කාර්යය සඳහා අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේ ඉහල මහල ක්‍රීඩාංගනය ලෙස සංවර්ධනය කර භාවිතා කිරීමට සාකච්ජා කළා. නමුත් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙහි එකඟතාවයක් මේ සඳහා ලැබිලා නෑ.

**අබේකෝන් මහතා- අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල**

නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව 10% භූමි ප්‍රදේශය ප්‍රජා විනෝද කටයුතු සඳහා අනිවාර්යෙන්ම වෙන්කරලා තියන්න ඕන. එහෙම නොවුනොත් අපේ පනත උල්ලංඝනය වෙනවා. එනිසා මේ පිළිබඳව අපි සාකච්ඡා කරලා බලන්න ඕන. එනිසා ඔබතුමා මෙම යෝජනාව අපිට ලිඛිතව එවන්න. අපේ සැලසුම් කමිටුවට යොමු කරන්නම්. එතනින් මේ පිළිබඳව සාකච්ඡා කරලා තීරණයක් දේවි. සමහර විට කොන්දේසි වලට යටත්ව හෝ මේ සඳහා එකඟතාවය ලබාගන්න බලමු.ඒ වගේම අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට කියන්න තව විකල්ප ඉඩම් කොටසක් හඳුනාගන්න කියලා. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා.

**කේ.ජී. ඉනෝකා මිය- ඉඩම් නිලධාරී,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,අම්බලන්ගොඩ**

නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නගරයට ආසන්නයේ ප්‍රමාණවත් ඉඩමක් ලෙස අපි හඳුනාගත්තේ මේ භූමිය.

**එම්.වී.ශිරෝමා රංජනී මිය - සැලසුම් නිලධාරි , නාගරික සංවර්ධන අධිකාරිය**

අම්බලන්ගොඩ වාරිමාර්ග කාර්යාලය පිහිටි භූමිය සලකා බැලුවොත් මොකද?

**එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපතිතුමා,නගර සභාව,අම්බලන්ගොඩ**

වාරිමාර්ග කාර්යාලය ඒ සඳහා කැමති වෙන්නේ නෑ. අපි සකච්ඡා කළේ හල්වතුර ඉඩම් කොටසක් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලබා දෙන්න සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනට පිහිටා ඇති ගොඩනැගිල්ල නගර සභා කාර්යාලය සඳහා ලබා ගන්න.හල්වතුර ඉඩම් කොටස් සඳහා රජයේ තක්සේරුවක් කරලා වන්දි ගෙවන්න තමයි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනට බලාපොරොත්තු වන්නේ.ඒ අනුව ඔවුන් තක්සේරු වාර්තාව ලබා ගැනීමට කටයුතු කරලා තියෙනව හල්වතුර ඉඩම් කොටස් වනජීවී ආඥාපනතට අයත් වනවාද? හල්වතුර ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු තමයි මේ ගැසට් එක නිකුත් කරලා තියෙන්නේ.

**අබේකෝන් මහතා- අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල**

එහෙනම් අපට මේ ඉඩම් වල කිසිම කාර්යයක් කරන්න බැරි වෙනවා.

**කේ.ජී. ඉනෝකා මිය- ඉඩම් නිලධාරී,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,අම්බලන්ගොඩ**

මම අම්බලන්ගොඩ ප්‍රදේශයේ උද්‍යාන පාලක නිළධාරීන් සමඟ මේ පිළිබඳව කතා කළා.එතුමා කීවා මේ ආඥාපනත අනුව අම්බලන්ගොඩ බස් නැවතුම් පොළ භූමියත් මේ පනතට අයත් වනවා කියලා.ඒ නිසා එවැනි ප්‍රදේශ අතහැරලා නැවත ගැසට් කරන්න ක්‍රියා කරනවා කියලා.

**අබේකෝන් මහතා- අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල**

එහෙනම් මේ ඉඩම් කොටසත් අතහැරලා ගැසට් කරන්න කියලා කියන්න.මහජනතාවට පහසුවෙන් ළඟා වෙන්න පුලුවන් සහ වාහන නැවතුම් පහසුකම් සපයා ගන්න පුලුවන් වෙනත් විකල්ප භූමියක් මේ සඳහා අපිත් පරීක්ෂා කරලා බලන්නම්.මොකද නව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගොඩනැගිල්ලක් සඳහා මුදල් ප්‍රතිපාදන ලැබෙනවානම් අපි මේ සඳහා සහයෝගය ලබා දෙන්න ඕනනේ.ඒ වාගේම නගර සභාවට ඔබතුමන්ලා භාරයේ තියා ගන්න ඕන ඉඩම් කොටස් ටිකත් අපට කියන්න.එතනොට අපි ඒ ගැනත් සලකා බලන්නම්.ඔබතුමන්ලා ලක්ෂ 19 ක් වන්දි ගෙවලා තියෙනවා.

**එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපතිතුමා,නගර සභාව,අම්බලන්ගොඩ**

හොඳයි අපි එහෙම කරන්නම්. ඔබතුමන්ලා 1989 වර්ෂයේදී හදපු සැලසුම් අනුව අපි හිතලා තියෙනවා පුංචි පාලම හා මහ පාලම අතර ප්‍රදේශය තෙත් බිම් කලාපයක් ලෙසම සංවර්ධනය කරලා පවත්වාගෙන යන්න.ඒ අනුව අපි දන්වලා එවන්නම් ඔබතුමාලාට අපට අවශ්‍ය ඉඩම් කොටස පිළිබඳව.

**අබේකෝන් මහතා- අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල**

අපේ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා අපි අම්බලන්ගොඩ නගර සභාවත් වනජීවී කාර්යාලයත් කැඳවලා මේ සම්බන්ධව සාකච්ඡා කරමු.

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා විසින් පැමිණි සියලු දෙනාට ස්තූති කිරීමෙන් අනතුරුව ප.ව.3.36 ට පමණ කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

| | | |
|---|---|---|
| සකස් කළේ- | බී.ඒ. ධම්මිකා, | ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප්. |
| ආර්.ඩබ්.ඩී.මල්කාන්ති, | ලේකම්, | සභාපති, |
| සංවර්ධන නිළධාරී, | නගර සභාව- අම්බලන්ගොඩ | නගර සභාව-අම්බලන්ගොඩ |
| නගර සභාව - අම්බලන්ගොඩ | | |

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එම කමිටුවට මාත් නම්කර තිබුණත් එදින මා විදේශගත වී සිටි බැවින් මට ඒ සඳහා සහභාගී විය නොහැකි වුනා.මෙම භූමියේ යම් යම් කොටස් නොයෙක් අවශ්‍යතා සඳහා සභාව මගින් ඉල්ලා ඇති  බව නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කළ යුතුයි.ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට මෙම ඉඩම ලබා දීම සම්බනධයෙන් අදාළ මිනිනදෝරු මහතුන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිලේඛන පරිශීලනය කිරීමේදී ගම්‍ය වනනේ මේවායේ නිවැරදි අයිතියක් නොමැති බවයි.මිනිදෝරු මහතුන් විසින් සඳහන් කොට තිබුනේ 'මේ අය විසින් අල්ලා ගෙන, මේ අය විසින් පදිංචි වී සිටින, මේ අය විසින් අයිතිවාසිකම් කියනවා යැයි කියා සිටියි' යන්නයි.එයින් අපට ගම්‍ය වන්නේ මේ පිළිබඳ සියයට සියයක අයිතියක් මේ සියලු දේපළ සම්බන්ධයෙන් නොමැති බවයි.අප විශ්වාස කරනවා මේ අක්කර 230 න් අඩුම වශයෙන් අක්කර 150 කට වඩා ඉඩම් වල නිවැරදි නීත්‍යානුකූල අයිතියක් නොමැති බව.ඒවා රජය සතු ඉඩම්.ඒ  නිසා අප වන්දි ගෙවිය යුතු වන්නේ සීමිත ඉඩම් ප්‍රමාණයක් සඳහා පමණයි.එහිදී අපට හැකියාව තිබෙනවා අධිකරණ ක්‍රියාමාර්ගයකින් මෙහි නීත්‍යානුකූල අයිතිකරුවන් සොයා අදාළ වන්දි මුදල් ගෙවන්න.මේ පිළිබඳ දැනුවත් කිරීමේ අවස්ථාවට මට සහභාගී විය නොහැකි වුනා.ඒ නිසා මෙය සභාගත කරන ලෙස ඉල්ලා සිටින අතර නාගරික සංවර්ධන අධිකාරියේ මී ළඟ රැස්වීමේදී මේ පිළිබඳ දැනුවත් කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වනවා.

**තීරණය -**

**2018-09-11  දින පෙ.ව 2 .30 ට පැවති අම්බලන්ගොඩ හල්වතුර ඉඩම් සම්බන්ධ   වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4     2018- 09- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව

<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>

**<u>2018.09.20</u>**

**සහභාගිත්වය-**

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා- ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.
2. ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර  සභාව.

3. ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
4. ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
5. ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මිය - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.
6. එච්.ඉනෝකා ක්‍රිෂානති මිය - ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.
7. ජී.ජී.ආර්.පේෂලා කුමාරි මිය - ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.
8. ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි - ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.
9. ජේ.ඩබ්ලිව්.ආනන්ද සිල්වා මහතා- ඇව්දින්නන්ගේ සංගමය . අම්බලන්ගොඩ.
10. එස්.කේ.පත්මසිරි මහතා - ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.
11. එස්.එම්.නීල් වසන්ත මහතා - පිහිනුම් පුහුණුකරු, අම්බලන්ගොඩ.
12. ටී.සරත් ශාන්ත මහතා - සිංහ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.
13. මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා - ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.
14. පී.එම්.විජේසිංහ මෙ.වි - තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.
15. ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - දකුණු පළාත් පා පන්දු පුහුණුකරු
16. ජී.අශෝක කුමාර මහතා - ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.
17. ලක්මාලි රුවනි මිය - සංවර්ධන සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.
18. එච්.ජී.දිලිනි චතුරිකා මිය - කළමනාකරණ සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.
19. ආර්.ඩබ්ලිව්.ඩී.මල්කාන්ති මිය - සංවර්ධන සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.
20. ඩී.වී.තරංගි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.

**පිළිගැනීම.-ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා ඇතුළු සියළුම මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

<u>ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම.</u>

01. අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.සෝභිත රංජිත් මැතිතුමා විසින් අද දින ක්‍රීඩා කමිටුවට සහභාගීවීමට නොහැකි බව දන්වන ලද ලිපිය ඉදිරිපත් කිරීම.
02. ක්‍රීඩා කමිටු සාමාජික ෂර්ලි චන්ද්‍රසිරි මහතා අද දින ක්‍රීඩා කමිටුවට සහභාගීවීමට නොහැකි බව දන්වමින් දුරථනයෙන් දෙන ලද දැනුම් දීම ඉදිරිපත් කිරීම.

**පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය**

**වයස අවු.16න් පහළ පා පන්දු තරගාවලිය සංවිධාන කිරීම.**
**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා,ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
කොහොමද සංවිධාන කටයුතු මේ වන විට මොනවද කරල තියෙන්නෙ?

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු.**
මෙම තරගාවලියට පාසල් 14 ක් පා පන්දු සෙල්ලම් කරනවා, පළමුවෙන්ම දකුණු පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂකගෙන් අනුමැතිය ගන්න අවශ්‍යයි.ඊට පස්සේ තමයි පාසල් දැනුවත් කරන්න වෙන්නෙ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ප්‍රජා සංවර්ධන නිලධාරි ලිපියකින් මේ පිළිබඳව ක්‍රීඩා අධ්‍යක්ෂක දැනුවත් කර අවසර ගන්න කටයුතු කරන්න. මෙම තරගාවලියට අදාළ ඇස්තමේන්තුවක් සභාවට ඉදිරිපත් කරන්න.

- කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට සෑදීමට අවශ්‍ය බඩු ඇණවුම් කර දීම.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මෙම කාරණය ක්‍රීඩා කමිටුව පටන්ගත් දවසේ ඉඳල කථාකරනවා.තාම වැඩේ කෙරුනේ නැහැ. මම සැපයුම් නිලධාරිට එන්න කිව්වෙත් ඒකයි. මොකක්ද ගැටළුව.

**ලක්මාලි රුවනි මිය,සංවර්ධන සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.**

සභාපතිතුමනි, ඇස්තමේන්තුව වෙනස්වුන නිසා මුලින් ඇණවුම් කරන්න කියපු උපකරණ ලිස්ට් එකත් වෙනස් වුණා. මේ සභාවට අවශ්‍ය උපකරණවලට අදාළ මිල ගණන් ඉදිරිපත් කරන්න පුළුවන්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
.මෙම ක්‍රීඩාංගණය කැබිනට් එකෙන් අපට පවරාදෙන ලද ලිපියේ පිටපතක් ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමාට ලබා දෙන්න.

- ❖ **මහජන ක්‍රීඩාංගණයේ වතුර රැදෙන එක නැවැත්වීමට හා ගාලු පාර අයින දිගේ ගල් බැම්මට උඩින් යකඩ වැටක් සෑදීමට ඇස්තමේන්තු සකස් කිරීම.**

**පී.එම්.විජේසිංහ මෙ.වි -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
අදාළ මැනුම් ලබාගෙන ඇති අතර ඇස්තමේන්තුව ඔක්තෝබර් සභාවට ඉදිරිපත් කරන බව.

- ❖ මානාන ක්‍රීඩාංගණයේ පැවිලියන් එකක් සෑදීමට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම.

**පී.එම්.විජේසිංහ මෙ.වි -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
පිට්ටනිය බලන්න මන්ත්‍රීතුමිය, ක්‍රීඩා භූමි උපදේශක, ක්‍රීඩා නිලධාරිතුමාත් එක්ක ගියා නිශ්චිත ස්ථානයක් තීරණය කරගන්න බැරිවුණා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මහ අම්බලන්ගොඩ, පනියන්දූව ග්‍රාම නිලධාරි වසම්වලට අදාළ සේවා පියසි මෙම භූමියේම හදන්න කියල මම ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් ඉල්ලා සිටියා. ප්‍රජා ශාලාව හා පෙර පාසල අතර එම ගොඩනැඟිලි හැදේවි. පැවිලියන් එකට ධම්මකුසල පාසල පැත්ත තමයි ගන්න වෙන්නෙ.

- ❖ ධීවර සංකීර්ණය නැවත නගර සභාවට පවරා ගැනීමට අදාළව සිහිකැඳවීමේ ලිපිය යැවීම.
  ඩී.වී.තරංගි ,ප්‍රජා සංවර්ධන නිලධාරි
  එම ලිපිය යවන ලද බව දන්වන ලදි.

- ❖ මාදම්පා ගඟ පිහිනුම් තටාකයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ඇස්තමේන්තුව ලබා දීම.
  **පී.එම්.විජේසිංහ මෙ.වි -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
  මැනුම් ලබා ගෙන ඇති ඇස්තමේන්තුව ඉදිරි සභාවකට ඉදිරිපත් කරන බව.

**එස්.කේ.පත්මසිරි මහතා- ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**
ගරු සභාපතිතුමනි, මාදම්පා ගඟ පිහිණුම්වලට වගේම සංචාරක ආකර්ශනීය ස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් මෙම භූමියේ පසුගිය කාලයේ රුහුණු සංචාරක මණ්ඩලය මගින් ඉදිකිරීම් කටයුතු කරනු ලැබුවා.එක් අවස්ථාවකදී බැකෝ යන්ත්‍රයක් ගන්න ගිහින් Toilet fit කැඩිලා ගියා. ඒ අයගේ Storerooms විදියට පාවිච්චි කළේ අපේ Changing Rooms.දකුණු පළාත් සංචාරක මණ්ඩලයේ සභාපති ජනිත් චන්ද්‍රසිරි මහතා ඒ අවස්ථාවේ දී පොරොන්දු වුණා ඒ සියල්ල හදල දෙනව කියල.නමත් දැන් එතුමා එම තනතුරේ නැහැ.

**ජී.සරත් ශ්‍රී ලාල් මහතා- ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.**
අපි මේ සියළු දේ ගොඩනහලා ඩොල්ෆින් එකට භාරදීල තියෙන්නෙ.ඒ නිසා ඔබතුමාලා මේ සම්බන්ධව වගකීම භාර ගත යුතුයි.

**එස්.කේ.පත්මසිරි මහතා- ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ .**
Toilet, Changing Rooms වල යතුරු අපි ළඟ තමයි තියෙන්නෙ. එහෙත් සමහර අවස්ථාවලදී අපට පාලනය කළ නොහැකි තත්වයන් උදාවෙනවා.

**එස්.එම්.නීල් වසන්ත මහතා- පිහුණුම් පුහුණුකරු, අම්බලන්ගොඩ.**
මමත් පිහිණුම් පුහුණුවීම් කරනවා මාදම්පා තටාකයේ, ඒත් මගේ ළමයින්ට Changing Rooms පාවිච්චි කරන්න දෙන්නේ නැහැ.

**එස්.කේ.පත්මසිරි මහතා- ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**
අපි අවුරුද්දටම අපේ සංගමයට ගන්නේ රු.250.00 විතරයි.අපි ළමයින්ට නොමිලේ පුහුණුවීම් කරන්නේ. අපේ සංගමයේ සමාජිකත්වය ලබාගෙන පුහුණුවීම් කරන්න කියන්න. මොකද අපි අපේ මහ සංගමයට වසරකට රු.8000.00 ගෙවන්න ඕනේ.අනිත් එක ක්‍රීඩා උපදේශක කෙනෙක් වුනාම ඊට අදාළ ආචාර ධර්ම පද්ධතියකට අනුව කටයුතු කළ යුතුයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමාපියන් ලවා අනෙක් අයට දොස් කියවන එක හොඳ නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

Toilet fit කැඩිච්ච ඉක්මනට හදල දෙන්න.අපේ ගලියෙන් අයින් කරන්න පුළුවන්.වැස්සක් වැස්සොත් විශාල හානික් වෙනවා.මේක ඉක්මනට කරන්න.සංචාරක මණ්ඩලයේ ඉදිකිරීම් කටයුතු නිසා වෙච්ච අලාභය ගැන ඇස්ත්මේන්තුවක් හදල සංචාරක මණ්ඩලය දැනුවත් කරන්න.සියළු ප්‍රතිසංස්කරණ වලට අදාළ ඇස්තමේන්තුවක් සභාවට දෙන්න.
අපි මාදම්පා පිහිණුම් තටාකය හදන කොට අම්බලන්ගොඩ පිළිගත් පිහිණුම් සම්බන්ධ ක්‍රීඩා සංගමයකට තිබුණේ ඩොල්ෆින් එක විතරයි.ඒක නිසා අපි ඒ දවස්වලම වගකීම ගිවිසුමකින් ඩොල්ෆින් එකට භාරදුන්නා. අපි මේ හැමදේකින්ම බලපොරොත්තු වෙන්නෙ පිහිණුම් ක්‍රීඩාවට දක්ෂයන් බිහිකරන්න උදව්කරන්න. කවුරුවත් ගැටුම් ඇති කරගන්නවට අපි කැමති නැහැ. ඒක නිසා ක්‍රීඩාවෙත් මහත්මා ගති රැකෙන විදියට කටයුතු කරන්න. මම බලාපොරොත්තු වෙනවා ඉදිරියේ දී කවුරුවත් ගැටුම් ඇති කරගන්නේ නැතිව සහයෝගයෙන් පුහුණුවීම් කරයි කියල.

**අදහස් හා යෝජනා**
**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**
දැන් කොහොමද සභාපතිතුමනි,ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලට මොකද වෙන්නේ?

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි පිට්ටනියේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට යවල මාස දෙකක් විතර වෙනවා. අඩුපාඩු කියල ආපසු එවල තියෙනවා.ඒ ගොල්ලො හදන්නේ අපේ වැඩේ පරක්කු කරන්න. WC මොනවද කියල තියෙන අඩු පාඩු.

**ආර්.ඩබ්ලිව්.ඩී.මල්කාන්ති මිය,සංවර්ධන සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමා ඒ ලිපියෙන් දන්වල තියෙන්නෙ මිල ගණන් ලබා ගැනීම ගැටළු සහගත බවත් සුදුසුකම් ලත් ආයතනයකින් මිල ගණන් කැඳවා TEC මඟින් නිර්දේශ ලබා ගෙන විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් පසුව ක්‍රියාත්මක කිරීම සුදුසු බව.

**ධම්මික කොඩිකාර මහතා-ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලංකාවේ පිළිගත්ම ආයතනය තමයි ජිනසේන සමාගම.අපි ඒ අයගෙන් තමයි මිල ගණන් අරන් තියෙන්නේ සහකාර කොමසාරිස් කාර්යාලය මේ ගැන දැනුවත් වෙලා නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ලැබී තියෙන උපදෙස් අනුව කටයුතු කරල අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන්න.

**එස්.කේ.පත්මසිරි මහතා- ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ .**
සභාපතිතුමනි, අපි කලිනුත් මේ ගැන දන්වල තියෙනවා. මාදම්පා ගඟට අපවිත්‍ර ජලය එකතු කරන බව.
සංචාරක මණ්ඩලයෙන් ඒ පැත්තෙන් බැම්මක් දාන්න මුදල් යොදවන්න පොරොන්දු වුණා. තාම මොකුත් කෙරුනේ නම් නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
නැවත මේ ගැන සංචාරක මණ්ඩලය දැනුවත් කරමු.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා- පාපන්දු පුහුණු කරු, අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි, මේ වසරේ ජාතික ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික් පා පන්දු කණ්ඩායම නියෝජනය කිරිමට අපේ අම්බලන්ගොඩ ක්‍රීඩිකාවෝ අට දෙනෙක් සමත් වුණා. හතර දෙනෙක් පළාත් කණ්ඩායම නියෝජනය

කරනවා. පළවෙනි අවස්ථාවට මෙවර ජාතික ක්‍රීඩා උළෙලේ දකුණු පළාත සිව්වන ස්ථානය හිමිකරගනු ලැබුවා.අපේ පුහුණු කරු මහේන්ද්‍ර මහතාටත් මේකේ ගෞරවය හිමිවිය යුතුයි. පාපන්දු ක්‍රීඩාව නඟා සිටුවීමට ඔබතුමා ලොකු උත්සහයක් ගන්නවා කියල අපි දන්වා. ඒක නිසා කාන්තා පාපන්දු ක්‍රීඩාවටත් තල්ලුවක් දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
නගර සභා පාපනන්දු සංචිතයට ක්‍රීඩකයන් විසිපස් දෙනෙක් තෝරාගෙන පුහුණුවීම් කරනවා වගේ කාන්තා ක්‍රීඩිකාවන් පහළොස් දෙනෙක් තෝරා ගෙන පුහුණුවීම් කරන්න. සියළු පහසුකම් අපි ලබා දෙන්නම්.

**ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි -ගරු නගර සභා මන්ත්‍රිණී, අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි, අම්බලන්ගොඩ නියෝජනය කරමින් දිස්ත්‍රික් මට්ටමින්, පළාත් මට්ටමින්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහණය හිමිකරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ බොහෝමයක් ඉන්නවා.චෙස් ක්‍රීඩාවෙන් අපේ මාධ්‍යවේදී සුසිල් මහතාගේ දියණිය ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රාහණයක් හිමිකර ගනු ලැබුවා. අපිට ක්‍රීඩා කමිටුවෙන් ඔවුන්ව ඇගයීමකට ළක් කරල උත්සවයක් සංවිධානය කරන්න පුළුවන්නම් ඉතා වටිනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි මීට පෙර පාසල් ක්‍රීඩාව ඉහළ නැංවීමේ අරමුණින් නගර ක්‍රීඩා කියල ක්‍රීඩා උත්සවයක් සංවිධානය කරනු ලැබුවා. ක්‍රිකට්, වොලිබොල්, පාපන්දු, නෙට් බෝල්, චෙස් ඇතුළු සියළු ක්‍රීඩාවන් ඊට ඇතුළත් වුණා. ලක්ෂ 6 පමණ වියදම් කරල ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 800ට පමණ කුසලාන සහතික පිරිනැමුවා.2015 වසරේදී අපි මේ උත්සවය කරන්න විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ඉල්ලුවාම එය අනවශ්‍ය වියදමක් කරල එය නැවැත්වුවා.ඉදිරියේ දී මේ ක්‍රීඩා උළෙල නැවත කරන්න අපි බලමු.

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩා භූමි උපදේශක, අම්බලන්ගොඩ නගර සභාව.**
මේ දවස්වල පොල්වත්ත ක්‍රීඩාංගණය තරගවලට වෙන් කරන නිසා Practice කරන අයට අවස්ථා ලැබෙනව අඩු නිසා Practice වලට හා Practice matchවලට මේ පිට්ටනිය හදල දෙන්න කියල ඉල්ලීම් කරනවා.අවස්ථාව දෙන්න පුළුවන්නම් හොඳයි. ක්‍රීඩා මණ්ඩපයේ විදුලි ලබා දීමේ කටයුතු අවසන් ඒ ඇස්තමේන්තුවට Fan දාල නැහැ. Fan 04 ක් දාලා දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
පුහුණු වීම වලට හදල දෙන්න ප්‍රශ්නයක් නැහැ. Fan ගන්න ඉල්ලීමක් කර මිලදී ගැනීමට කටයුතු කරන්න.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා- පාපන්දු පුහුණු කරු, අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි මේ ක්‍රීඩා කමිටුවට පාසල් නියෝජනයක් නැති එක හොඳ නැහැ. මෙතන අපි සෑම තීරණයක්ම ගන්නේ ක්‍රීඩාවේ උන්නතියට. පාසල් නියෝජනයකුත් තියෙනවා නම් හොඳයි.

**ඩී.වී.තරංගි, ප්‍රජා සංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගර සභාව.**
ක්‍රීඩා කමිටුව පැමිණීමට සියළු පාසල් දැනුවත් කරල ලිපි යවනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපේ නගරයේ සමස්ථ ක්‍රීඩා පද්ධතියම රැඳිල තියෙන්නේ මේ ක්‍රීඩාංගණය වටේ.වසර තුනක් තිස්සේ අපිට මේ පිට්ටනිය හදාගන්න බැරිවෙලා තියෙනවා. ඒ අයට මේ ගැන විශ්වාසය නැතිවුනාම එන්නේ නැහැ.අපි ඒ විශ්වාසය නැවත ගොඩ නැඟෙන විදියට කටයුතු කරන්න ඕනේ.

**ස්තූති කථාව- ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මැතිතුමා**
අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගී වූ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත්, ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළුම මහත්වරුන්ටත් නිලධාරි සියළු දෙනාටත් ස්තූතිය පුදකරමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.
සකස් කළේ,

........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

......................................... ලේකම්, නගර සභාව- අම්බලන්ගොඩ.

......................................... සභාපති, නගර සභාව-අම්බලන්ගොඩ.

**තීරණය -**

**2018- 09-20 දින ප.ව 2.30ට පැවති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5 2018- 09– 11 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව**

**ටෙන්ඩර් කමිටුව**

**2018/09/ 11 දින ප.ව 2.30**

**සහභාගීත්වය**

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ධම්මික කොඩිකාර මහතා — ගරු නගර මන්ත්‍රී. , අම්බලන්ගොඩ නගර සභාව
3. නන්දන රාජපක්ෂ මහතා — ගරු නගර මන්ත්‍රී. , අම්බලන්ගොඩ නගර සභාව
4. රාහුල ලලිත විත්‍රම මහතා — ගරු නගර මන්ත්‍රී. , අම්බලන්ගොඩ නගර සභාව
5. බී.ඒ ධම්මිකා මිය — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
6. එච්.පී. මිහිරි ද සිල්වා මිය — ප්‍රධාන කළමණාකරන සහකාර. අම්බලන්ගොඩ නගර
7. ඩබ්.පී. සිල්වා මිය — අභ්‍යන්තර විගණන නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව

6.ඩී.එච්.එස්. ඩී ගුණවර්ධන මයා — තාක්ෂණ නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව

8. ලක්මාලි රුවනි — සංවර්ධන නිලධාරී. අම්බලන්ගොඩ නගර සභාව

**කමිටු වාර්තාව**

1.තාර සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ බිටුලින්ක් ඉමල්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයයි. නමුත් පසුගිය වර එම ආයතනය ලබාදුන් 80/100 තාර තුනී බව නිරීක්ෂණය වීමෙන් මී ලග මිල ගණන් ඉදිරිපත් කර ඇති බිටුමික්ස් ආයතනයේ මිල ගනන් පිළිගැනීම සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Bitumix (pvt)ltd homagama | Bitulink emalshion (pvt)ltd giriulla | Ceylon petroleum copration |
|---|---|---|---|---|---|---|

| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
|---|---|---|---|---|---|---|
| 1. | 80/100 තාර | 50 | | 13750.00 | 13500.00 | - |

2.කොඩිකණු සඳහා අවශ්‍ය GI බට සහ සින්ක් එක සඳහා අවම මිල ගණන් සටහන් කර ඇති පූර්ණා හාඩ්වෙයාර් වෙතින් මිල පිළිගැනීම සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | RJD හාඩ්වෙයාර් අම්බලන් | පූර්ණා වෙළෙඳ සැල අම්බලන් | B"K stores wathugedara |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | වට්ටම් මිල |
| 1. | GI බට අඟල් 1 (ඝනකම) | 100 | | පකිස්ථාන් 2700.00 | 2500.00 පකිස්ථාන් | 2600.00 |
| 2. | සින්ක් එක | 01 | | 5/5 3000.00 | 15/18 ජ්රිසුසු 1900.00<br>36/18 ජ්රිසුසු 2700.00 | 3000.00 ප්‍රින්ස් |

3.ලෝක ළමා දින සඳහා ප්‍රෙවිශ පත්‍ර හා ආරධනා පත්‍ර සඳහා කැඳවූ මිල ගණන් අතරින් අවම මිල ඉදිරිපත් කල සක්වා ප්‍රින්ටර්ස් මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Sumudu printers | Sakva printers ambalango | Inluck printers ambalangoda |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1. | පප්‍රෙව් පත්‍ර | 10000 | | 45000.00 (4.50) | 37500.00 (3.75) | 49000.00 (4.90) |
| 2. | ආරාධනා පත්‍ර | 150 | | 7125.00 (47.50) | 6225.00 (41/50) | 8700.00 (58.00) |

4..ගලි බවුසරයේ හෝස් එක සහ ක්ලිප් එක සඳහා අවම මිල ඉදිරිපත් කල ආනන්ද ඔටෝ ස්පෙයාස් ආයතනයේ මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Buddhi auto treders cloombo<br>එකක් තොගය | Ananda auto spares colombo<br>එකක් තොගය | Saman moter stores colombo<br>එකක් තොගය |
|---|---|---|---|---|---|---|
| 1. | *100F gully hose (3)* | | | 98000.00 | 95000.00 | 97000.00 |
| 2. | Cup clink set (3) bronz | | | 12500.00 | 12000.00 | 15000.00 |
| 3. | Hose clip | | | 250.00 | 200.00 | 250.00 |

5. රතු ඩබල් තැබ් එක සඳහා meeter board එත සඳහා අවම මිල ඉදිරිපත් කල ආනන්ද ඔටෝ ස්පෙයාස් ආයතනයේ මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Buddhi auto treders cloombo<br>එකක් තොගය | Ananda auto spares colombo<br>එකක් තොගය | Saman moter stores colombo<br>එකක් තොගය |
|---|---|---|---|---|---|---|
| 1. | *L 200 meeter board* | | | 55000.00<br>(recondition) | 47500.00<br>(used with japan) | 55000.00 |

6. කියවීමේ මාසය සඳහා අවශ්‍ය සහතික පත් , ලිපිගොනු කවර, ආරාධනා පත්‍ර සඳහා කැඳවූ මිල ගණන් අතරින් අවම මිල ඉදිරිපත් කල සක්වා ප්‍රින්ටර්ස් මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Sumudu printers<br>එකක් තොගය | Sakva printers ambalango<br>එකක් තොගය | Inluck printers ambalango da<br>එකක් තොගය |
|---|---|---|---|---|---|---|
| 1 | සහතික පත්‍ර | 200 | | 17000.00<br>(85.00) | 13500.00<br>(67.50) | 15000.00<br>(75.00) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2. | ආරාධනා පත්‍ර | 200 | | 9200.00 (46.00) | 6750.00 (33.75) | 8500.00 (42.50) |
| 3. | ලිපිගොනු පත්‍ර | 200 | | 22000.00 (110.00) | 14750.00 (73.75) | 18700.00 (93.50) |

7..විදුලි උපාංග සඳහා  අවම මිල ඉදිරිපත් කල ඒෂියන් ඉලෙක්ට්‍රිකල් ආයතනයේ මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | New metroi electricals colombo | ABC electricals (Colombo) | Asion electricals (Colombo) |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | *No'line tap* | | | 225.00 | 210.00 | 200.00 |
| 1. | 'no 15 A plug top | | | 235.00 | 230.00 | 225.00 |

8. ලිපි ද්‍රව්‍ය සඳහා  මිල ඉදිරිපත් කල රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | | |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | *පුල්ස්කැප් කොළපකට්* | 01 | | 900.00 | | |
| 1. | ලීගල් කොළ පැකට් | 01 | | 850.00 | | |

9. ටයර් සඳහා  අවම මිල ඉදිරිපත් කල  crown  tyres (pvt) ltd ආයතනයේ මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | The tyer max (Colombo) | Prince tyre service (Colombo) | Crown tyres (pvt)ltd (Colombo) |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | *14/17.5 advance tyre(14pr)* | | | China 45850.00 | China 46800.00 | China 44900.00 |
| 2. | *19.5/24 advance tyre (12pr)* | | | China 88000.00 | China 88500.00 | China 85000.00 |

10. ,ලිපිද්‍රව්‍ය මුද්‍රණය සඳහා  කැඳවූ මිල ගණන් අතරින් අවම මිල ඉදිරිපත් කල සක්වා ප්‍රින්ටර්ස් මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Sumudu printers | Sakva printers ambalangoda | Inluck printers ambalangoda |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | *පුස්තකාල මුදල් භාර ගැනීමලප කුවිතාන්සි පොත්* | 100 | | 10500.00 (105.00) | 7750.00 (77.50) | 9500.00 (95.00) |
| 2. | පුස්තකාල සාමාජික කාඩ්පත් | 500 | | 8750.00 (17.50) | 4750.00 (9.50) | 6750.00 (13.50) |
| 2. | වර්ණ පෝස්ටර්- අයවැය යෝජනා ලබා ගැනීම සම්බන්ධව | 250 | | 12500.00 (50.00) | 8750.00 (35.00) | 10625.00 (42.50) |

11.සමරු ති ළිණ සඳහා  අවම මිල ඉදිරිපත් කල සමාරා ප්ලාස්ටික් සහ ග්‍රැෆික් ආයතනයේ මගින් ලබාදී ඇති මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | සමල් සිලි නිර්මාණ ගාල්ල | සමාරා ප්ලාස්ටික් සහ ග්‍රැෆික් අම්බලන්ගො | ධයමන් ඇඩ්වටයිසින් අම්බලන්ගො ඩ |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1. | *සමරු (6x4)* | 17 | | 700.00 | 600.00 | 950.00 |

12. toner  සඳහා Lanka technology appalinse  ආයතනය සහ  Omak tecnolagy   යන ආයතන දෙකම  එකම මිල (අවම මිල) ඉදිරිපත් කර ඇති අතර ඡායා පිටපත් යන්ත්‍රෙය් ආරක්ෂාව සඳහා ටොෂිබා ආයතනයේ අලෙවි නියෝජිත සඳහා Lanka technology appalinse ආයතනයෙන් ටෝනර් මිලදී ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Lanka technology appalinse pvt ltd galle | Dulara stationaris galle | Omak tecnolagy ambalangoda | Tulip computers ambalangoda |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | *Toshiba 2309 toner* | 5 | | 10925.00 | 10950.00 | 10925.00 | - |

13. ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යාල හැඳුනුම්පත සැකසීම සඳහා 2018/08/17 දින පැවති ටෙන්ඩර් කමිටුවේදී අනුමත වුවද , මිල ගණන් කැඳවීමේදී නියමිත අකෘතියක් නොමැති වීම හා සමූහ ඡායාරූපය සඳහා මිල ගණන් නොමැති වීම හේතුවෙන් එම අංග සම්පූර්න කොට නැවත මිල ගණන් කැඳවන ලෙස ටෙන්ඩර් කමිටු ව මගින් තීරණය තරන ලදී.

.................................... ............................................. ..................................................

| | | |
|---|---|---|
| සකස් කලේ | ලේකම්, | ගරු සභාපති, |
| එල්.ආර්.මිගෙල්හේවා | බී.ඒ. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| සංවර්ධන නිළධාරී | නගර සභාව , අම්බලන්ගොඩ | නගර සභාව , අම්බලන්ගොඩ |

.

**තීරණය -**

**2018-09-11 දින ප.ව 2.30 ට පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත්කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 6 2018- 09- 27 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව**

**මූල්‍ය කමිටුව**
**2018-09-27 දින ප.ව.2.30**

සහභාගීත්වය

| | |
|---|---|
| 1.ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 1ග ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 2ග ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 3ග බී.ඒ.ධම්මිකා මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |

පිළිගැනීම
ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍ය කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම් ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා ලදී.
අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී.
**ගෙවීම් ලබන්නාගේ නම මිලදීගෙන ඇති භාණ්ඩ පිලිබඳ**

| විස්තර | | මුදල රු. |
|---|---|---|
| **01**.සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන් අගෝ. 01-15 දක්වා ඉන්ධන බිල | 180049.00 |
| 02. සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන් ජූලි 16-31 දක්වා ඉන්ධන බිල | 159520.00 |
| 03. කළමණාකරු , මහජන බැංකුව අම්බලන්ගොඩ | රු.4000000 ක මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම | 4000000.00 |
| 04.ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් | ඇ.අ.1878 යටතේ ලබාගත් විදුලි උපාංග සඳහා (කටර්අඬු 1ක් 1350*03,උල්අඬු 1350*03, ටෙස්ටර් 350*03, රින්ච් 300*01) | 12150.00 |
| 05.එදිරිසිංහ බ්‍රදර්ස්ප්‍රයිවට් ලිමිටඩ් (ඇ.අ.1920.1921.1922හා1923) | 49-9421 ට්‍රැක්ටරයේ අලුත්වැඩියා සඳහා අදාල උපකරණ | 39612.21 |
| 06. එදිරිසිංහ බ්‍රදර්ස්ප්‍රයිවට් ලිමිටඩ් (ඇ.අ.1924) | 49-9421 ට්‍රැක්ටරයේ අලුත්වැඩියා සඳහා අදාල උපකරණ | 13014.44 |
| 07. මිළිඳු එන්ට්‍රප්‍රයිසස් (ඇනවුම-1919) | ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.5445 බැගින් 08 ක් ) | 43560.00 |
| 08. දයාවංශ ජයකොඩි සහ සමාගම (රිසිට් අංක31271) | පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම | 104675.00 |
| 09. සරසවි පොත්හල (ඉන්වොයිස් අංක-021ඖඪ0007030- | පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම | 99867.00 |
| 10. මිළිඳු එන්ට්‍රප්‍රයිසස් (ඇනවුම-1935) | ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.5445 බැගින් 08 ක් ) | 43560.00 |
| 11.සී/ස ලංකා විදුලි පෞද්.සමාගම | 2018 මැයි විදුලි බිල | 89584.77 |
| 12. සී/ස ලංකා විදුලි පෞද්.සමාගම | 2018 අප්‍රේල් විදුලි බිල | 96405.45 |
| 13. මේ යටතේ වවුචරයක් ඉදිරිපත් වී නැත | | |
| 14.සභාපති,නගර සභාව අම්බලන්ගොඩ-ගි.අ. 035100146295638 බැර | 2018 ජන., පෙබ.,මාර්තු මාසවල වැටුපින් අය කරන ලද සේවක ණය වාරික සේවක ණය ගිණුමට බැර කිරීම | 33896.23 |
| 15.ඔමැක් ටෙක්නලොජි (ඇ.අ.1863) | ටෝනර් මිලදී ගැනීම 1ක් 8250*10 | 82500.00 |
| 16.ජී.ඩබ්.ඉන්දික | ABC ගල් (1ක් 6500*5) | 32500.00 |
| 17.දේශීය ණය සංවර්ධන අරමුදල | බැංකු ස්ථාවර නියෝගයකින් ගෙවනු ලබන ගලි බවුසර් වාරිකය-2018-11කාර්තුව ගිණුම් ගත කිරීම | 55350.78 |

18. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන 2018 මැයි මස ජල ගාස්තු 27322.93
මන්ඩලය (සභාව සතු ආයකනයන්හි )

19. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන 2018 ජූනි මස ජල ගාස්තු 33473.92
මණ්ඩලය (සභාව සතු ආයතනයන්හි )

20.ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් විදුලි උපාංග මිලදී ගැනීම 210875.00
(ඇ.අංක1908)

21.ඩබ්.සී.ජේ.සෝමරත්න 5X5 ප්‍රමාණයේ ස්ටිකර් හා
(ඇ.අංක 1936) බලපත්‍ර කඩදාසි මුද්‍රණය (52.50*250) 13125.00

22. එම්.එස්.වීරසිංහ නගර සභා පුස්තකාල සඳහා අගෝ. මස ලබා
ගත් පුවත්පත් සඳහා 46780.00

23.පී.ඩබ්.අසේල මාධව මහජන නියෝජිත පුහුණු පාඨමාලාව සඳහා
යොදාගත් බස්රථය සඳහා ගෙවීම 42000.00

24.සභාපති නගර සභාව අම්බලන්ගොඩ තැන්පතු ගිණුමේ ඇති විනෝද බදු ආදායම්
සහා පොදු ගිණුමට බැර කිරීම 21000.00

25. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2018 අගෝස්තු මස ඕඹ කොටසක් ගෙවීම
239861.74

26. ලක්ෂාන් එන්ටර්ටේට්මන්ට් ලෝක ළමාසැනකෙළියේ මෙරිගෝ රවුන්ඩ්,
පුංචි කෝච්චිය..........ආදියට ගෙවීම. 350000.00

27.ඩබ්.ඒ.උපුල් ලෝක ළමාසැනකෙළියේ නර්තන වෙනුවෙන්
ගෙවීම 60000.00

28. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2018 සැප්1-15දක්වා ඕඹ කොටසක් ගෙවීම
154206.62

29. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. අගෝස්තු මස දුරකතන බිල
32516.53

30. සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන් අගෝ.
සමුපකාර සමිතිය 16-31 දක්වා ඉන්ධන බිල
151454.00

31.ලංකා ටෙක්නොලොජි ඇප්ලිකන්ස් ප්‍රයි.
ලිමිටඩ් (ඇ.අ.1941) ටෝනර් මිලදී ගැනීම
54625.00

32.ටී.ජී.කරුණාතිලක උලු(1000*65)හා මුදුන් උලු(100*95) 74500.00
(ඇ.අ.1940)

33.එස්.එම්.එන් සමරසේකර බෝන්ස්බාර්,ජීඅයි බට,ගැල්වනයිස් තහඩු
135300.00

(ඇ.අ.1885)

34.රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව ගම් (1 ක් 98*25 හා 4 1 ක් 650*100)
පැකට් ගැනීම 67450.00

35. පූර්ණා වෙළඳ සැල ජී අයි බට 100(1ක් 2600*100) 260000.00

2018 සැප්තැම්බර් මස අතිකාල හා මාසික වැටුප් පත් ගෙවීම් නිර්දේශය සඳහා මුදල් කමිටුවට ඉදිරිපත් කල අතර පහත පරිදි මාසිකව ගෙවීමට සිදුවන එම ගෙවීම් අනුමත කිරීමේ බලය සභාපතිතුමා වෙත පැවරීම සුදුසු බවට මූලා කමිටුව නිර්දේශ කරන ලදී.

01. අතිකාල ගෙවීම්- සෞඛා අංශය
02. අතිකාල ගෙවීම්- කර්මාන්ත අංශය
03. ස්ථිර මාසික වැටුප
04. දෛනික වැටුප

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.4.30 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

............................................ ..................................................

සකස් කලේ

| | |
|---|---|
| ලේකම්, | ගරු සභාපති, |
| බී.ඒ. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| නගර සභාව ,අම්බලන්ගොඩ | නගර සභාව ,අම්බලන්ගොඩ |

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙම මූලා කමිටු වාර්තාව අනුව එහි යම් වරදක් තිබෙනවානම් අප එය නිවැරදි කරගත යුතුයි.එහි වොට් 400 චෝක් 50 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුනා.මේ පිළිබඳ කරුණු සොයා ගත යුතුයි.මීට පෙර මා මේ සභාව නියෝජනය කරන වකවානුවේ අප ගබඩාවේ තබන්නේ වොට් 400 චෝක් 10 ක් පමණ.මෙවර චෝක් 50 ක් ඇනවුම් කර තිබුනා.මිල ගණන් ලබා ගැනීමනම් නීත්‍යානුකූලව කර තිබුණා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අයිතම ගණන කීයද?

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මීට පෙරනම් එකක මිල රු.2950/= ක් වනවා.මෙම චෝක් 50 සඳහා රු.එක්ලක්ෂ හතළිස්හත්දහස් ගණනක් වැය වී තිබුණා.මෙවර ගෙන්වූ චෝක් 50 න් 39 ක් සවිකොට තිබෙනවා. මාගේ ප්‍රශ්නය වන්නේ 39 ක් සවි කළේ කොහේද යන්නයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම නම් සවි කරන්නේ නෑ.අදාළ නිළධාරීන් විසින් තමයි මේවා සවි කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගරයේ මම හිත්න්නේ සෝඩියම් ජේපර් තිබ්බත් මේ කහපාට එළිය තිබෙන බල්බ මුහුදුකරයටම උපරිම වශයෙන් 08ක් ඇති.මම මේ ගැන කතා කරන්නේ මීට අදාළ මුදල වැඩිනිසා.රු.2950/= බැගින් චෝක් 50ට රු.එක් ලක්ෂ හතළිස්හත්දහස් ගණනක් වැය වනවා.ඒ නිසා මේ චෝක් 39 සවි කළ ස්ථාන පිළිබඳ වාර්තාවක් දිය හැකිද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ චෝක් 39 සවි කිරීම පිළිබඳ වාර්තාවක් අපි ඔබතුමන්ට දෙන්නම්.රාහුල මන්ත්‍රීතුමන් මෙහිදී යම් සාධාරණ හේතුවක් ඉදිරිපත් කළා.හේතුව මෙහිදී ඇනවුම් කර තිබෙන්නේ වෝට් 400 චෝක්.නමුත් අවශ්‍ය වන්නේ වොට් 125 චෝක්.ඒ නිසා මෙසේ වැඩිපුර ඇනවුම් කිරීමට හේතුව සොයා බලා වාර්තා කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ බස් නැවතුම් පොළේ සවි කර තිබෙන්නේත් වොට් 125 බල්බ 10 ක් පමණ.මේ චෝක් එකක් කොළඹින් මිලදී ගත්තත් රු.1650/= ක් පමණ වනවා.මේවා දැන් මිලට ගෙන තිබෙන්නේ රු.2950/= කට.ඒ නිසා මන්ත්‍රීවරු සියලු දෙනාටම මා කියා සිටින්නේ අපි නිවැරදි දේ කළ යුතුයි.ඒ නිසා මට ඒ පිළිබඳ කරුණු වාර්තා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රීතුමන් අසා සිටින්නේ වොට් 125 යොදන චෝක් සඳහා වොට් 400 චෝක් යෙදීමට හේතුවත් මෙම චෝක් 39 යොදන ලද ස්ථාන පිළිබඳවත්ය.ඒ නිසා මෙම ස්ථාන පිළිබඳ වාර්තාවක් ඊළඟ සභාවට සපයන ලෙස ඉල්ලා සිටිනවා.මේ බල්බ ඇනවුම් කරන්නේ සභාපතිවත් මන්ත්‍රීවරුන්වත් නොවෙයි.ඒ නිසා වරදක් වී තිබෙනවානම් ඒ වරද නිවැරදි විය යුතුයි.ඒ නිසා එහි වාර්තාව ලබා දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

තාක්ෂණ සේවා නිළධාරීගෙන් විදුලිය සම්බන්ධ කටයුතු ඉවත් වීම පිළිබඳ මා දැනුවත් නෑ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මා හිතන ආකාරයට මේවායේ පසුවිපරමක් නෑ.භාණ්ඩ මිලට ගැනීමේදී ඉන්වෙන්ට්‍රිගත වී තිබෙනවා.නමුත් ඒවායේ පසුවිපරමක් නෑ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කෙසේ වෙතත් භාණ්ඩ ඇනවුම් කරනු ලබන්නේ තාක්ෂණ සේවා නිළධාරී හරහා නිසා ඒ පිළිබඳ නිසි වාර්තාවක් සපයන ලෙස ප්‍රකාශ කර සිටිනවා.

<u>**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි, ලේකම්තුමනි, අද සිටවත් තාක්ෂණ සේවා නිළධාරීන් වෙත ඒ අංශ භාරදෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මම දන්නා තරමින් ඔවුන්ට මේ අංශය භාර දී තිබෙන්නේ.

<u>**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

නමුත් එතුමන්ලා කියා සිටින්නේ එතුමන්ලාට මේ විදුලි අංශයේ කටයුතු භාර දී නොමැති බව.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මීට අදාළ ලිපි විදුලි කම්බිකරුට දෙනු ලබන්නේ තාක්ෂණ සේවා නිළධාරී මගින්.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලේකම්තුමියනි, වහාම විදුලි අංශයේ ප්‍රධානියා වශයෙන් තාක්ෂණ සේවා නිළධාරී මහතා පත් කරන ලෙස ඉල්ලා සිටිනවා.ඇයි මොවුන්ව මේ කටයුත්තෙන් බැහැර කළේ? මීට පෙර භාණ්ඩ ඇනවුම් කරනු ලැබුවේ කවුරුන් විසින්ද? අපි පත් වූවාට පසුවනම් එහෙම දෙයක් වුනේ නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අප පත්ව ඒමට පෙර තාක්ෂණ සේවා නිළධාරීන් මේ කටයුත්තෙන් බැහැර කර තිබුනානම් , මෙතැන් සිට ඔවුන්ට එම කටයුත්ත සඳහා බලය පැවරීම සඳහා අප මේ අවස්ථාවේදී මුලු සභාවේම අනුමැතිය ලබාදෙනවා.ඒ නිසා මින් ඉදිරියට භාණ්ඩ ඇනවුම් කිරීම අනිවාර්යයෙන්ම තාක්ෂණ සේවා නිළධාරී මහතා හරහා සිදුවිය යුතුය.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ලේකම්තුමියනි, අපි රු.2950/= ක් වන චෝක් ගත්තත් වොට් 125 ක චෝක් එකක් සඳහා වැය වන්නේ රු.700/= ක් 800/= ක් පමණයි.ඒ නිසා මේ පිළිබඳ දැනුවත් නැතිනම් මේවා අනිසි ආකාරයෙන් භාවිතා විය හැකියි.ඒ නිසා මෙහි වගකීම තාක්ෂණ සේවා නිළධාරීන්ට පවරා ඔවුන් හරහා ඉටුවිය යුතුයි.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙය අද්භූත කතාවක්.කර්මාන්ත අංශයේ වගකීම තිබිය යුත්තේ තාක්ෂණ සේවා නිළධාරීන්ට.භාණ්ඩ නිකුත් විය යුත්තේ එතුමන් හරහායි.මෙතෙක් කල් එතුමන් මේ පිළිබඳව අපව දැනුවත් කොට නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ගැන මා දැනුවත් වූයේත් අදයි.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා දන්නා තරමින් පාරක තිබෙන විදුලි බුබුලක් දැවී ගියත් ඒ සඳහා නැවත බල්බයක් නිකුත් කරනු ලබන්නේත් තාක්ෂණ සේවා නිළධාරීතුමන්ගේ නිරීක්ෂණයෙන් පසුවයි.ඒ නිසා අනිවාර්යයෙන් මේ පිළිබඳ සොයා බලන ලෙස මා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.මටත් එක අවස්ථාවක මේ සම්බන්ධයෙන් ගැටලුවක් ඇතිවුනා.අපේ ගබඩාවෙන් විදුලි බුබුලු 30ක් ලබාගෙන තිබෙනවා කාර්යාලයීය නිළධාරිනියක් හරහා.නමුත් එය නිකුත්විය යුත්තේ කාර්මික නිළධාරීතුමන් හරහායි.මෙය කොමසාරිස්තුමියගේ පාලන කාලය තුළ සිදුවුන වැරදි සහගත දෙයක්.ඒ වගේම විදුලි අංශයට අවශ්‍ය සී.එෆ්.එල්.බල්බ 30ක් කාර්මික නිළධාරීන් වෙත නිකුත්කර තිබෙන්නේත් එම විෂය භාර නිළධාරියා හරහාමයි.එය එසේ සිදු නොවිය යුතුයි

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අනුව සමස්ථ කාර්මික අංශයේ හා විදුලි අංශයේ වගකීම තාක්ෂණ සේවා නිළධාරීන් හට පැවරිය යුතුයි.ඒ නිසා මෙහිදී යම් වරදක් සිදු වී ඇත්නම් එය නිවැරදි කරන ලෙස මා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මේ භාණ්ඩ මිලට ගැනීමේදී යම් නිර්දේශයක් තිබිය යුතුයි.එහිදී මිල ගණන් කැඳවා එය සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අපි ඒ පිළිබඳ තීරණයක් ගනු ලබනවා.ඒ නිසා මේ පිළිබඳ සොයා බැලිය යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ ඇනවුම් ලබා දෙන ලෙස ඉල්ලන නිළධාරියා කවුරුන්ද යන්න පිළිබඳ සැපයුම් නිළධාරී විසින් පිළිතුරු සැපයිය යුතුයි.ඒ නිසා මේ පිළිබඳ සොයා බලන ලෙස ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.ඇත්තෙන්ම විදුලි විෂයය සම්බන්ධව මට විශේෂඥ දැනුමක් නෑ.ඒ නිසා අදාළ නිළධාරීන් විසින් ඒ පිළිබඳ සොයා බැලිය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම  මහතා කතා කරමින්</u>

අපි මේ පිළිබඳ සභාපතිතුමන්ට වරදක් කියනවා නොවෙයි, නමුත් මෙහි චෝක් 50ට රු. එක්ලක්ෂ හතළිස් හත්දහස් ගණනක් වැය වනවා.රු.50000/= කින් කළ හැකි කාර්යයකට ඇයි අපි මෙතරම් මුදලක් වැය කරන්නේ.ඒ මුදලින් අපට පාරක් ඉදි කරන්න පුලුවන්නේ.

<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමන්ගේ අනුමැතිය ඇතිව පසුගිය දිනක තාක්ෂණ සේවා නිළධාරීද සමග මා මේ පිළිබඳ පරීක්ෂා කළා.එහිදී මා රාහුල මන්ත්‍රීතුමන් කියූ කරුණු සමග එකග වනවා.එහි තිබූ ස්විච වලින් කොටසක් හැගර්, කොටසක් කෙවිල්ටන්, කොටසක් ඔරේන්ජ්.නමුත් එය එසේ සිදුවිය නොහැකියි,මොකද රජයේ ආයතන වලට දමන්නේ හැගර් හෝ මොලර් පමණයි.ඒ නිසා මේ ගැන සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ තත්වය ඇති වී තිබෙන්නේ කොමසාරිස්තුමිගේ පාලන කාලය තුළ.ඒ අනුව අපේ මන්ත්‍රීවරු කියන කතාව නිවැරදියි.ඒ නිසා අදාළ වගකිව යුතු නිළධාරීන්ගේ අනුදැනුමෙන් යුක්තව මින් ඉදිරියට නිවැරදි ආකාරයෙන් මෙම කටයුතු සිදුකළ යුතුයි කියා මා තාක්ෂණ සේවා නිළධාරී මහතාට ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපි මූල්‍ය කමිටුවේදී තීරණයක් ගනු ලැබුවා සභාව සතු සියලු භාණ්ඩ වල U.C.A. ලෙස සළකුණු කරන ලෙස.පයිප්ප වල U.C.A. ලෙස සළකුණු කිරීමටත් , බල්බ, චෝක් ආදියෙහි මාර්කර් පෙන් එකකින් නොමැකෙන ලෙස U.C.A. ලෙස සළකුණු කිරීමටත් තීරණය වූවා. එවිට ඒවා නැවත විකිණිය නොහැකි වනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙතෙක් කල් අතිකාල ගෙවීම, වැටුප් ගෙවීම මා පුහුණුවෙන්ම සිදුකළා.නමුත් කමිටුව දන්වා තිබෙනවා මෙම මුදල රු.10000/= ට වැඩි නිසා සභා අනුමැතියට යොමු කළයුතු බව.නමුත් වැටුප් සහ අතිකාල ගෙවීම සභා අනුමැතිය ලැබෙන තෙක් ප්‍රමාද කළහොත් සේවකයන් අපහසුතාවයට පත්වන නිසා මීට පෙර තිබූ පරිදි එම බලය සභාපතිතුමාට පවරන ලෙස සභාවෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය -**

**2018-08-27 දින පැවති මුල්‍ය කමිටු වාර්තාවෙහි අංක 04 හි සඳහන් ඒෂියන් ඉලෙක්ට්‍රිකල් වෙත ගෙවන ලද වැයපතට අදාළ භාණ්ඩ ඇණවුම් කිරීමේ නියෝගයෙන් 125 W චෝක් වෙනුවට 400 w චෝක් ලබාගැනිම හා එම චෝක් සවිකර ඇති ස්ථාන පිළිබඳ  වාර්තාවක් ලබන සභාවට ලබා දීමට යටත්ව මුල්‍ය කමිටු වාර්තාවේ අනෙකුත් කරුණු පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**තීරණය**

**විදුලි අංශයේ ප්‍රධාන අධික්ෂණ නිලධාරි තාක්ෂණ සේවා නිලධාරි බැවින් එම භාණ්ඩ ඇණවුම් කිරිම තාක්ෂණ සේවා නිලධාරි හරහා සිදුවිය යුතු බවත් කර්මාන්ත සහ විදුලි අංශයේ සියලු කටයුතු තාක්ෂණ සේවා නිලධාරි හරහා සිදුකිරිමටත් ඊට අදාළ වගකිම් සියල්ල තාක්ෂණ සේවා නිලධාරින්ට පැවරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

**6: 7 2018- 09- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව</u>

**2018/09/19**

<u>සහභාගීත්වය -</u>

| | |
|---|---|
| **එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා** | **ගරු සභාපති,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ආර්.එම්.ලසන්ත මහතා** | **ගරු නගර සභා මන්ත්‍රී,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ධනසේන මාදුවගේ මහතා.** | **ගරු නගර සභා මන්ත්‍රී,නගර සභාව ,අම්බලන්ගොඩ** |
| **බී.ඒ.ධම්මිකා මිය.** | **ලේකම්,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ඊ.වාසනා තරංගි මිය.** | **ප්‍රජා සංවර්ධන නිලධාරී ,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **පී.එම්.විජේසිංහ මෙනවිය.** | **තාක්ෂණ සේවා නිලධාරිනී, නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ඩී.රජිතා ක්‍රිෂාන්ති මෙන්ඩිස් මිය.** | **කළමනාකරණ සහකාර,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **කුලසේන ගුරුගේ මහතා.** | **ප්‍රදේශ නියෝජිත.** |

<u>පිළිගැනීම -</u>

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතාගේ ප්‍රධානත්වයෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි .

ගරු සභාපති තුමන් විසින් අද දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පැමිණි සියළු දෙනා පිළිගන්නා ලදි.

**<u>ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම -</u>**

දළුක්කන්ද අංක 04 තැලිගල කන්ද ඉඩමේ ඔප්පු ලබා දීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යවන ලද ලිපියේ පිටපත.

**<u>යෝජනා හා අදහස් -</u>**

- තැලිගල කන්ද ඉඩම මුදල් ගෙවා ඇති දෙදෙනාට ඔප්පු ලබා දීමට අදාල කටයුතු කර ඇතත් ප්‍රධාන අමාත්‍යාංශ මඟන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත නිර්දේශය සඳහා යවා ඇත්තේ එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මියගේ ගොනුව පමණක් බැවින් එච් ඒ.ජයලත් මහතාගේ ගොනුවත් නිර්දේශය සඳහා යොමු කර දෙදෙනාගෙම ඔප්පු ලබා දීමේ කටයුතු එකවර සිදු කිරීම කළ යුතු බව කමිටුව නිර්දේශ කරන ලදි.

- T.H.W. නිවාස වල අංක 62 පදිංචි ගිනිගල් ගොඩගේ නන්දසිරි ද සිල්වා මහතා විසින් තමාට අයත් අංක 90 දරණ බිම් කොටස ඔහුග් දියණිය වන ගිනිගල් ගොඩගේ රුවිනි පේෂලා කුමාරි මියට පවරා දීමට අදාල ලිපිය කමිටුවට ඉදිරිපත් කර අතර දිවුරුම් ප්‍රකාශයක් ලබා ගෙන ඉහත පරිදි ඉඩම පැවරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට කමිටුව නිර්දේශය ලබා දෙන ලදි.

**<u>ස්තුති කථාව -</u>**

ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් පැමිණ සිටින සියල්ලටම ස්තුතිය පුද කර අතර නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව නිමාවට පත් විය .

**සකස් කළේ,**

........................
**කළමනාකරණ සහකාර**
**නගර සභාව -අම්බලන්ගොඩ.**

...................................
**ලේකම්,**

**නගර සභාව -අම්බලන්ගොඩ.**

..............................
**සභාපති**

**නගර සභාව -අම්බලන්ගොඩ.**

**තීරණය -**

**2018-09-19 දින ප.ව 2.30 ට පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:8 2018- 09-21 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත කමිටු වාර්තාව**

**<u>අම්බලන්ගොඩ නගර සභා කර්මාන්ත කමිටු වාර්තාව - 2018.09.21</u>**

පැමිණීම

1. එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති
2. ඩබ්.ජ්. සෝභිත රංජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රී
3. බී.ජ්. ධම්මිකා මිය - ලේකම්,නගර සභාව ,අම්බලන්ගොඩ
4. ආර්.ඩබ්.ඩී. මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරි,නගර සභාව,අම්බලන්ගොඩ
5. එච්.ජී. දිලිනි චතුරිකා මිය - කළමනාකරණ සහකාර,නගර සභාව,අම්බලන්ගොඩ

**පිළිගැනීම - ආර්.ඩබ්.ඩී. මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරි**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු නාගා සිටුවීම උදෙසා අවශ්‍යා සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ජා කර,එම කටයුතු වඩාත් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම මෙම කමිටුවෙහි අරමුණ බව ප්‍රකාශ කරන ලදී.

**එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කථා කරමින් , මෙම කමිටුවේහි ප්‍රධාන අරමුණ ද්විතීක සංවර්ධන සැලැස්ම -2017 කසල වෙන් කිරීම සඳහා ගබඩා පහසුකම් ලබා දීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුගත මුදල හා ගිවිසුම්ගත මුදල ඉක්මවා ඇති බිල්පත් වටිනාකම ගෙවීම සම්බන්ධ සාකච්ජා කිරීම බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව කමිටුව විසින් පහත කරුණු සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදී.

01. ද්විතික සංවර්ධන සැලැස්ම - 2017 කසල වෙන් කිරීම සඳහා ගබඩා පහසුකම් ලබා දීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුගත මුදල හා ගිවිසුම්ගත මුදල ඉක්මවා ඇති බිල්පත් වටිනාකම ගෙවීම සම්බන්ධයෙන් සාකච්ජා කළ කමිටුව විසින් ගිවිසුම්ගත මුදල හා අනුමත ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා ඇති බිල්පත් වටිනාකමට අදාළව නව ඇස්තමේන්තුවක් සභාවට යොමු කර ඒ සඳහා ගිවිසුම්ගත වීමෙන් පසු අදාළ සමිතියට එම මුදල ගෙවීමට කමිටුව තීරණය කරන ලදී.

02. දේගොඩ පාර ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව සකස් කරන ලද ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට සිදුවී ඇති බැවින් මාර්ගයේ වතුර නොරැඳෙන සේ ABC යොදා තාවකාලිකව ජනතාවට ගමන් කිරීමට හැකි වන පරිදි මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමටත් ඉන්පසුව මාර්ගය දෙපස කාණු යෙදීමට අදාළව සහ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අදාළව වෙන වෙනම සකස් කළ ඇස්තමේන්තු මාසික සභාවට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

03. අම්බලන්ගොඩ ප්‍රධාන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමට අදාළව ක්‍රීඩා භූමියක පැවතිය යුතු ප්‍රමිතියට අදාළව තව දුරටත් ක්‍රීඩාංගනයට යෙදිය යුතු පස් ප්‍රමාණය පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමටද කමිටුව තීරණය කරන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් පැමිණි සියලුම දෙනාට ස්තුති කිරීමෙන් අනතුරුව ප.ව. 3.40ට පමණ කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

| | | |
|---|---|---|
| සකස් කළේ- | බී.ඒ. ධම්මිකා, | ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප්. |
| එච්.ඒ. දිලිනි චතුරිකා, | ලේකම්, | සභාපති, |
| කළමනාකරණ සහකාර, | නගර සභාව- අම්බලන්ගොඩ | නගර සභාව-අම්බලන්ගොඩ |
| නගර සභාව - අම්බලන්ගොඩ | | |

**තීරණය -**

**2018-09-21 දින ප.ව 2.30 ට පැවති කර්මාන්ත කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිළගණන්

**7:1** ටෙන්ඩර්:- නැත

**7:2** **මිළගණන්:-** නැත

## (08) ගෙවීම්

**08.01** නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා **2018** අගෝස්තු මාසය සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු **.46780.00** ක මුදලක් එම්.එස්.වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.02** **2018** මාර්තු **01** සිට **2018.** මාර්තු **18** දක්වා පුද්ගලික ආරක්ෂක සේවාව සඳහා ගෙවිම වෙනුවෙන් පරිදි රු:**99981.00** ක මුදලක් ඩිල්කෝ සිකියුරිටි ඇන්ඩ් ඉන්වෙස්ටිගේෂන් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය වෙත ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි

**08.03** අම්බලන්ගොඩ මහජන පුස්තකාලය සඳහා නිතිය සඟරාව මිලදි ගැනිම වෙනුවෙන් රු.**12000.00** ක මුදලක් නිතිය පදනම් ආයතනය වෙත ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි

**08:04** ද්විතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම **2017** යටතේ ඉටු කරන ලද කසල වෙන් කිරිම සඳහා ගබඩා පහසුකම් ලබාදිමේ කර්මාන්තයේ අවසාන බිල්පත් වටිනාකමෙන් ප්‍රතිපාදන සිමාව ඉක්මවා ඇති බිල්පත් වටිනාකම වන රු.**44516.99** ක මුදල සහා අරමුදලින් ගෙවිම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## (09) ගිණුම්

**09.01** **2018** අගෝස්තු මාසයට අදාල වියදම් වැය විශ්ලේෂණය, ලැබීම් විග්‍රහය සහ **2018** අගෝස්තු මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත්කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

.

## (10) ඇස්තමේන්තු

**10:1)** නොමිලේ අභ්‍යාස පොත් ප්‍රධානය - **2018** ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් සකස් කරන ලද රු.4500000.00 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ලක්ෂ 45ක් යනු විශාල මුදලක්.අපි පත්වී සිටින්නේ අම්බලන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන්, ඒ දූ දරුවන් වෙනුවෙන්. ඒ නිසා අපි ඔවුන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර මෙය එම දූදරුවන් වෙනුවෙන් සිදු කරන අත්‍යවශ්‍ය කාර්යයක්.නමුත් මෙය විනිවිදභාවයකින් යුතුව සිදු කල යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ලිපිය කියවන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ඔබතුමන් කලින් ඔය දේ ඉදිරිපත් කළානම් මම කියන්න සිටියේත් ඔය දේම තමයි.ග්‍රාම නිළධාරී හරහා ආර්ථිකඅපහසුතා ඇති සාමාන්‍ය ජනතාව වෙනුවෙන් අපි මේ පොත් ලබාදී ඔවුන්ට සේවයක් කළ යුතුයි. ඒ නිසා මෙය හොද යෝජනාවක්.අපි නගර සභාවෙන් මේ මුදල් යොදවන විට විනිවිදභාවයකින් කටයුතු කරන ලෙස මා නැවතත් ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබද ගැටලුවක් නෑ.නමුත් මීට අදාළ මුදල ලක්ෂ 45 ක් වනවා.පාසල් ළමුන් වෙනුවෙන් ලක්ෂ 45 ක් වැනි මුදලක් වැය කළහැකි තැනක නගර සභාව සිටිනවානම් එය සුභවාදී දෙයක්.නමුත් මෙම මුදල දැරීම තුළ නගර සභාව විසින් අනෙකුත් වගකීම් ඉටු කිරීමේදී මුහුණපෑමට සිදුවන මූල්‍යමය ගැටලු පිළිබද ඔබතුමන්ගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.ඒ වගේම මෙම අඩු ආදායම් ලබන පවුල් වල ළමුන් සඳහා මෙය ලබා දීමේදී විශේෂයෙන්ම නගර සභාව සතු මුදල් නිසා එය විනිවිධභාවයකින් සිදු කළ යුතුයි.ඒ අනුව මෙහි මුදල් වැය කිරීමට අදාළ විස්තර සියලුම මන්ත්‍රීවරුන්ට සැපයිය යුතුයි.ඒ මුදල් වැය කිරීමට පෙර ඒවා පරීක්ෂා කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ට යම් කාලපරිච්ඡේදයක් දිය යුතුයි.මේවා නගර සභාවේ මුදල් නිසා ඔබතුමන් කලින් කියූ නිර්ණායක වලට පටහැනිව මේවා ලබාදුන්නොත් එය වැරදි පූර්වාදර්ශයක් වේවි.මේ සඳහා වැයවන මුදල් අපට නැවත ලැබෙන්නේ නෑ.සභාව මගින් ලක්ෂ 45ක් වැනි විශාල මුදලක් වියදම් කරන නිසා මෙහිදී පැහැදිලි විනිවිදභාවයකින් යුතුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙහි ගැටලුව තිබෙන්නේ මීට පෙරත් අපි මේ විදියට පොත් බෙදුවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ කාලේ පොතක් රු.20/= යි.නමුත් දැන් පොතක් රු.50ක් පමණ වනවා.අපි අන්තිමට පොත් බෙදූ අවස්ථාවේ අපට ලක්ෂ 24ක් පමණ වැය වී තිබෙනවා. නමුත් මේ වනවිට එහි වියදම ඒ වගේ දෙගුණයක්.

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

මෙය ඇත්තෙන්ම හොද යේජනාවක්.නමුත් එකවරම ලක්ෂ 45ක් ලෙස දැක්වූවිට බය හිතෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එසේ ලක්ෂ 45ක් ලෙස නොදමා බෑ.මොකද මා මේ සඳහා පළාත් සභාවේ අනුමැතිය ලබාගත යුතුයි.

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

අනුමැතියට යැවීම සඳහා අවශ්‍ය වාර්තා ඉක්මනින් ලබාගත හැකි මාර්ග ඕනෑතරම් තිබෙනවා.පාසල් වලින් අදාළ ලැයිස්තු ලබාගත හැකියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුලින්ම මේ සඳහා පළාත් සභා අනුමැතිය ලබාගත යුතුයි.මොකද අපේ පිට්ටනිය හදන්න කවම අනුමැතිය ලැබී නෑ.මෙය ජනතාවට කියූ පසු පොත් ලබා දිය නොහැකි වුනොත් එය ලැජ්ජාවක් වනවා.ඒ නිසා මෙය පළාත් සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා දුන්නොත් පමණක් පොත් ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමනම් ගැටලුවක් වන්නේ නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේනම් ඒ විදියට පිට්ටනියට අනුමැතිය අරන් දෙන්න ඔබතුමන්ට බැරිද?

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

කලිනුත් මේ පොත් ලබාදීම සඳහා ලක්ෂ 18කට ඡාමර බුක් ෂොප් එකෙන් පොත් මිලට අරගෙන එය නොගෙවා තිබී මහඇමතිතුමන්ගේ අනුමැතියෙන් පසු එය ගෙව්වනේ? මේ සඳහා වැය වන මුදල ලක්ෂ 45 ක් ලෙස එකවරම කොමසාරිස්තුමන්ට කියූවිට එතුමන් මෙය ප්‍රතික්ෂේප කරාවි.ඒ නිසා මෙය නිසි ලෙස ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලින් වතාවෙත් මෙය අනුමත කරන්න අවුරුදු එකහමාරක් පමණ ගතවුනා.එය සිදුවුනේ මෙසේයි.මුලින් මෙය ලක්ෂ දහඅටකට , විස්සකට සභාවේ අනුමත වුනත් අන්තිමට එය අන්තිමට එය ලක්ෂ 24 ක් පමණ වුනා.ඒ අනුව ලක්ෂ හතරහමාරක් පමණ වන ඉතිරි මුදල ගෙවන්න අවුරුදු එකහමාරක් පමණ ගතවුනා.

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

එය වන්නේ මෙහෙමයි. මෙය නගරයේ කොට්ඨාශ 13 තුළ නිසි පරිදි බෙදිය යුතුයි.මේ සඳහා පිටස්තර පිරිස් ඇතුළත් වූ සමහර අවස්ථා තිබෙනවා.නමුත් එවැනි දේවල් අවම කරගෙන නිසි පරිදි මෙය ඉටු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමත් ඒ කාලේ මේ පොත් බෙදන කර්තව්‍යයට එකතු වුන කෙනෙක්.

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ඔව්, අපි පොත් බෙදුවා. නමුත් අපි පිටට බෙදුවේ නෑ.විහාරගොඩ ආදී ප්‍රදේශ වල අයටත් පොත් බෙදුවා. ඒ නිසා විනිවිදභාවකින් යුතුව මෙය සිදුකළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමන්ද පොත් බෙදපු කෙනෙක් හැටියට යම් පොඩි සිද්ධියක් අල්ලගෙන කතා කරන්න එපා.

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහි ඇත්ත කතාව වන්නේ අපිට පොත් 100 ක් දුන්නොත් මෙහෙට 150 ක් ලබා දේවි.අපි ඉල්ලා සිටින්නේ සාධාරණ විදියට මෙය සිදු කරන ලෙසයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අනුව නිළධාරීන් මගින්ම මේ පොත් බෙදීම සිදු කළයුතු බව මා ප්‍රකාශ කර සිටිනවා..

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙහිදී අපට විශාල මූල්‍ය අර්බුදයකට මුහුණ පෑමට සිදු වනවා. හේතුව ලක්ෂ 45 ක් කියන්නේ පොඩි මුදලක් නොවෙයි.අපි පත්වී ගතවුනේ තවම මාස කීපයක් පමණයි.ඇත්තෙන්ම පිට්ටනිය හදන එක මීට වඩා ලොකු කාර්යයක් වනවා.ඒ නිසා මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා මෙය ලබන වසරට හෝ කල් දමා පිට්ටනිය සාදන කාර්යය සඳහා ප්‍රමුඛස්ථානය ලබා දෙන ලෙස.මොකද මෙය පාසල් දෙකක් තුනක් ක්‍රීඩා කරන ස්ථානයක්.පසුගිය දවසක මට ඇහුණා පුද්ගලයෙක් කියනවා අවුරුදු දෙක තුනකට පසු මෙහෙමවත් මේ පිට්ටනියේ මෙවැනි ජනකායක් පිරවීම ලොකු දෙයක් කියා.ඒ නිසා මේ මුදල පිට්ටනිය සඳහා යොදවලා මුලින්ම එහි කටයුතු අවසන් කර දෙන මෙන් මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම අපේ ගරු උප සභාපතිතුමා කරන ලද යෝජනාව අදට ගැළපෙන , ඒ වගේම ජනතාව බලාපොරොත්තුවෙන් සිටින දෙයක්. අපට වැනි තිබෙන මූල්‍ය තත්වය අනුව අපි ලක්ෂ 45 ක් වැනි මුදලක් දරන්නේ කෙසේද?අපට තිබෙන ලොකුම ගැටලුවක් තමයි මේ අම්බල්ගොඩ නගර සභා පිට්ටනිය.අවුරුදු ගණනක් අපට මෙය කරගත නොහැකි වුනා. ක්‍රිකට් බෝඩ් එකත් අදාළ ඇමතිවරුත් මාරු වීම නිසා මෙය අඩපණ වුනා.එසේ නැතිනම් මේ වනවිට එහි ඉතුරු වැඩ කටයුතු ටිකත් කර අවසන්.ඒ නිසා මම හිතන්නේ උප සභාපති තුමා කළ ඉල්ලීමට අපේ මන්ත්‍රීවරු කිසි කෙනෙක් විරුද්ධ වන එකක් නෑ.ඒ අනුව මේ වසරේ පොත් ලබා දීමේ කාර්යය ඉවතලා ඒ සඳහා නියමිත රු. ලක්ෂ 45 ක මුදලත් මේ ක්‍රීඩා පිටිය සෑදීම සඳහා අවශ්‍ය මුදලටම එකතුකොට හැකි ඉක්මනින් එය ජනතාවට ලබාදීමට කටයුතු කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.ක්‍රීඩා පිටිය සෑදුව පසු අපට ලබන වර්ෂයේ ළමුන් වෙනුවෙන් රු. ලක්ෂ හැට හැත්තෑවක් වුනත් වියදම් කළ හැකියි.ඒ අනුව විවිධ දේවල් සඳහා මුදල් වැය නොකර හැකි ඉක්මනින් මේ නගර සභා ක්‍රීඩා පිටිය සෑදීමේ කටයුත්ත අවසන් කරන මෙන් ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සියලු මන්ත්‍රීවරු මේ සඳහා එකගතාවය පළ කරනවාද? මේ වසරේ පොත් ලබා දීම නොමැතිව ඒ මුදල් මේ ක්‍රීඩා පිටිය ඉදි කිරීමේ කටයුතු සඳහා යොදවන්න මාගේ පුද්ගලික එකගතාවය මා පළ කර සිටිනවා.ඒ අනුව අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත අකමැත්ත ප්‍රකාශ කර සිටින ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එසේනම් එම කටයුත්ත ආරම්භ කරන බව මා මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනව

**තීරණය**

**මෙම වසරේදී පොත් බෙදා දීමේ කටයුත්ත සිදු නොකොට එම මුදල් ප්‍රමාණය ද නගර සභා ක්‍රීඩාංගනය සෑදීමේ කටයුත්ත සඳහා යොදා ගැනීමින් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය .**

11) වෙනත් කරුණු

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

- ගරු සභාපතිතුමනි, ඊයේ දිනයේ නගර සභාවේ පැවැත්වුනු ලෝක ළමා දින වැඩසටහන ඉතාම සාර්ථක අන්දමින් පැවැත්වුනා.රජයෙන්වත් පළාත් සභාවෙන්වත් කිසිම ආධාරයක් උපකාරයක් නොමැතිව නගර සභාවේ මුදල්වත් වැය නොකොට ගරු සභාපතිතුමන්ගේ සංකල්පයක් මත එතුමන්ගේ කැපවීමෙන් මෙම වැඩ සටහන සිදුකළා. අවුරුදු තුනකට පසුව කුඩා ළමුන් සතුටු කිරීමට ලැබීම ඉතා වටිනවා.තවද නගර සභාවේත් ලේකම් තුමියගේත් ප්‍රජා සංවර්ධන නිළධාරී ඇතුලු කාර්ය මණ්ඩලයේ සහයෝගය මේ සාර්ථකත්වයට හේතු වුනා.පහළ සේවකයන්ගේ පටන් සියලු දෙනාම දිවා රෑ නොබලා කැපවීමෙන් කටයුතු කළා.අවුරුදු තුනකට පසු ඊයේ අපේ අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය වර්ණවත් වුනා.ඒ අනුව මේ කටයුත්ත සාර්ථකව ඉටු කිරීමට මූලික වූ ගරු සභිපතිතුමාටත් සහයෝගය ලබාදුන් සියලු දෙනාටත් මාගේ ස්තූතිය පුද කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,කැටන්තොට පන්සලේ ඉඩම සම්බන්ධව නඩුවක් තිබෙනවාද? ඊයේ නායක හාමුදුරුවන් ඒ පිළිබඳ ලිපියක් එවනු ලැබුවා.

(ලිපිය කියවන ලදී)

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

හල්වතුර භූමිය සම්බන්ධයෙන් ඔබතුමන්ලාට ගොනු 07 ක් ලබා දුන්නා.එහි අපේ ඉඩම් කොටසේ තමයි හාමුදුරුවන් දැලක් දාලා තිබෙන්නේ.ඔය කියන ඉඩම පවරාගෙන තිබෙනවා.ඔතන දහඅට බාස්ලාගේ පවුල් 02 ක් සිටිනවා.මම එක්වරක් ලක්ෂ 07 ක වන්දි මුදලක් ඔවුනට ගෙවුවා.අදාළ ගොනුවේ අත්පත් කර ගැනීමේ නියෝගය සවිස්තරව තිබෙනවා.මා මෙය හාමුරුවන්ට පෙන්වා සාකච්ඡා කරන්න සිටියා.දැන් භුක්තිය නැවත පවරා ගැනීමට නඩුවක් පවරන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමියට දන්වා යැවිය යුතු වනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, විශේෂ සභි රැස්වීමේදීත් සාකච්ඡා කළ පරිදි තල්ගස්ගොඩ නො.4/14 ලිපිනයේ පදිංචි රසිකා නිලානි විසින් එවන ලද ලිපියේ සඳහන් වනවා ඇයගේ නිවසට යාබද නිවසේ කාණුව වසා කොන්ක්‍රීට් කණු දෙකක් දමා ගේට්ටුව සවිකළ බව.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අද ඒ සඳහා පැමිනිලි කිරීමට පැමිණි අවස්ථාවේ මා තාක්ෂණ සේවා නිළධාරී මහතාට එය යොමු කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

එදිනම ලේකම්තුමිය මේ සඳහා තාක්ෂණ සේවා නිළධාරී මහතා යවා තිබෙනවා.එවිට මේ කාර්යය නතර කර තිබෙනවා.නමුත් දැන් නැවතත් ඒ ස්ථාන දෙක කඩා කණුව දමා ගේට්ටු දෙක සවි කර තිබෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මමත් කාර්මික නිළධාරී මහතාත් එම ස්ථානහය පරීක්ෂා කිරීමට ගිය අවස්ථාවේ දුටුවා දෙපැත්තෙන් කාණු දෙක පෙනෙන්නට තිබෙන බව. ඒ පාර ඉදි කළේ නගර සභාවෙන්.නිර්මල කොතලාවල ඇමතිතුමා ලක්ෂ 15 ක් එවලා එහි ගල් අල්ලනු ලැබුවා.පාරේ පළල තිබෙනවා.නමුත් කාණුව වැසී තිබෙනවා.දෙපැත්තෙන් කාණු දෙක පෙනෙනවා.මා ඒ අවස්ථවේ කාර්මික නිළධාරී මහතාට පැවසුවා

කුමක්ද සිදුවී තිබේදැයි බැලීමට මෙම ස්ථානය භාරා බලන ලෙස.එහිදී පෙනුනේත් දෙපැත්තේ කාණු දෙක තිබෙන බවයි.මෙහි තිබෙන්නේ දෙපිරිසක් අතර ආරවුලක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මෙහි අනවසර ඉදිකිරීමක් නැති වුනානම් ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න අපට වැඩක් නෑ.කාණුවේ වතුර බසිනවානම්, අවහිර වී නැතිනම් අපට ගැටලුවක් නෑ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කාණුව සුද්ධ කොට එය වැසිය යුතුයි.ඔබතුමන්ලා එම ස්ථානයට ගියානම් පැහැදිලි වේවි එහි තත්වය පිළිබඳ.එතැන තිබෙන්නේ පෞද්ගලික ගැටලුවක් නිසා ඇතිවුන තත්වයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

- ගරු සභාපතිතුමනි, D4E යන්ත්‍රය පිළිබඳ වර්තමාන තත්වය මා දැන ගන්නට කැමතියි.මහ ඇමතිතුමාට ඒ සම්බන්ධ ලිපියක් යොමු කරනු ලැබුවාද?
- අපි පසුගිය සභා වාරයකදී යෝජනාවක් කළා කුණු එකතු කිරීම සඳහා යන්ත්‍රයක් ලබා ගැනීම සම්බන්ධව මහ ඇමතිතුමන්ට ලිපිටයක් යවන ලෙස, එහි ලිපි යවා තිබෙනවාද? ඊට පිළිතුරු ලැබී තිබෙනවාද?
- ඒ වගේම පසුගිය සභා වාරයකදී යෝජනාවක් ඉදිරිපත් කළා පුද්ගලික ටෙලිකොම් පද්ධතිය පිළිබඳව.එහිදී රාහුල මන්ත්‍රීතුමන් ඉල්ලා සිටියා ටෙලිකොම් ආයතනයෙන්ද කැඳවන ලෙස.නමුත් නිළධාරීන් කීපවරක් ටෙලිකොම් ආයතනයට ලිපි ඉදිරිපත් කළත් මේ වනතුරුත් ඊට ප්‍රතිචාරයක් ලැබී නොමැති බව දැන ගන්නට ලැබුනා.ප්‍රතිචාරයක් නැතිනම් සභාව ගෙනයාමේ විශාල අඩුපාඩුවක් තිබෙනවා.මොකද දුරකථන ඇමතුම් සඳහා ලේකම්තුමිය පහළට පැමිණිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

(දුරකථන පද්ධතියට අදාළ ලිපිය කියවන ලදී.)

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාව තුළ අභ්‍යන්තර දුරකථන ජාල පද්දතිය ස්ථාපිත කිරිම සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව මීට පෙර ඉදිරිපත් කරන ලද ලංකා බෙල් ආයතනයෙන් මෙම කටයුත්ත සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

- ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයකදී ඉදිරිපත් කළා ස්වභාවික පිහිනුම් තටාකයේ ගල් වැටියක් බැඳීම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉල්ලීමක් කරන ලෙස.මොකද ගම්වාසීන් අපෙන් නිතරම ඒ පිළිබඳ විමසනවා.නමුත් අපට දියහැකි වන්නේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දෙන පිළිතුර.ඒ නිසා ඒ පිළිබඳ සොයා බලන ලෙස මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.එහි තිබෙන ගල් බැම්ම ඉස්සුවොත් වතුර පාර ආවත් වැලි එන එක නතර වේවි.මා හිතන්නේ තිබෙන ගල් බැම්ම ඉස්සුවොත් හරියාවි.ඒ නිසා ඒ සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීතිමය උපදෙස් ලබාගත යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සඳහා ගල් වැටියක් දැමිය යුතුයි.යන රළ පහර ගොඩ පැත්තෙන් ගොස් උතුරු පැත්තෙන් නැවතත් ඇතුළට පැමිණෙනවා.එවිට වැලි නැවතත් ඇතුළට එනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

- ගරු සභාපතිතුමනි, අපි පසුගිය සභා වාරයකදීත් කතා කළා නගර සභා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම ගැන N.B.R.O වාර්තාව අනුව අලුත්වැඩියාවන් කරගෙන යනු ලබනවා. එහි වර්තමාන තත්වය කුමක්ද? කවදා වනවිට මෙය අවසන් කළ හැකිද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සඳහා ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස මා තාක්ෂණ සේවා නිළධාරීතුමන්ව දැනුවත් කොට තිබෙනවා.ඔවුන් දන්වා තිබෙනවා ප්‍රධාන බිත්තිය ඉවත් කරන ලෙස.එවිට වහල රඳවීම පිළිබඳ අලුතින් සිතන්න වන අවස්ථාවක් එනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එහි බිත්තිය ඉවත් කොට කණු දෙකක් සහිතව වීදුරු යොදා ලස්සනට සැදිය හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

- ගරු සභාපතිතුමනි,අපේ හැඳුනුම්පත් පිළිබඳව මීට පෙරත් සභාවට ඉදිරිපත් කළා. නමුත් තවම එය ලබා ගැනීමට නොහැකි වුනා.
- තවද, අපේ වැසිකිළි පද්ධතිය සාදන ලෙස ඉල්ලීමක් කළත් එය ඉටු වී නෑ.
- ඒ වගේම ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මියත් මාත් දුරකථන ඉල්ලා තිබෙනවා.නමුත් ලූප් නොමැතිකමෙන් කියා එය තවම සවිකොට නෑ.අපට දුරකථන ලබාදෙන තෙක් හෝ අපේ ජංගම දුරකථනයේ බිල ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය ටෙලිකොම් ආයතනයට කියා ඔබතුමියලාටම කරගත හැකියි.අපි මේ සම්බන්ධයෙන් උපදෙස් අරන් තිබෙනවා.පනත අනුව ගෙවීමට හැකි වන්නේ ස්ථාවර දුරකථනයට පමණයි.ජංගම දුරකථනය සඳහා ගෙවිය හැකි වන්නේ සභාපතිතුමාටත් උප සභාපතිතුමාටත් පමණයි.
හැඳුනුම්පත් සම්බන්ධයෙන් ටෙන්ඩර් එක නැවත කඩන්න සිදුවී තිබෙනවා.ඉන්පසු ළගදීම එය ලබා දිය හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

- ගරු සභාපතිතුමනි, රොසෙත් රෝහල අසළ තිබෙන බැඩ්මින්ටන් ගොඩනැගිල්ල අබලන් තත්වයට පත්ව තිබෙනවා.එය කරන්නේ සංගමය මගින්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්, බැඩ්මින්ටන් සංගමය මගින්

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

එසේනම් ඒ සංගමයට දැනුම්දිය යුතුයි අඩුතරමින් මෙහි වැහිපීළි ටිකවත් සාදන ලෙසට.ඒ වගේම මෙහි රථ ගාල දී තිබෙන්නේ මුදල් වලටද? නගර සභාවට මුදල් දෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් එය මාසෙකට රු.250/= කට බද්ධට දී තිබෙනවා.රොසෙත් එක රු.20000/= ක් පමණ ගෙවනවා රථගාල සඳහා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

එහි නඩත්තුවක් සිදුවන්නේම නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නඩත්තු කරන්නනම් අපිට පවරා ගැනීමට සිදු වනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙහි රථ ගාල තිබෙන ස්ථානයේ හොඳ ගොඩනැගිල්ලක් ඉදි කළ හැකියි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය හොඳ ස්ථානයක තිබෙන ගොඩනැගිල්ලක්.ඒ නිසා මෙය නඩත්තු කරන ලෙසට ඔවුන් දැනුවත් කරන්න.

- ඒ වගේම පොල්වත්තපුර ඕකන්ද ඔප්පු ලබා දීම සම්බන්ධව කතා කළ යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය ඉටු කරන්න විදියක් නෑ.එය අපට අයිති නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

නමුත් එහි අලුත් ඔප්පු හැටියට නැවත ලබා දෙන්න බැරිද?එහි නිවාස සංවර්ධන අධිකාරියේ දැන්වීම් පුවරුවක් තිබෙනවා

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිවාස සංවර්ධන අධිකාරියෙන් මුදල් දුන්නත්,ඔවුන් කරන්නේ රු.25000/= ක් ලබාදී උදා ගමක් කියා පල කරනවා.නගර සභාවට ඔප්පු ලබාදිය හැක්කේ නගර සභාව සතු ඉඩමක පමණයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

මෙහි නිවාස ලාභීන් මුදල් ලබා දී තිබෙන්නේද නගර සභාව හරහායි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක් එක් කාලයට නොයෙකුත් දේශපාලන හේතු මත එසේ ලබා දෙනවා.ඒ කාලේ හිටපු පාලකයන් නගර සභාව සතු ඉඩමක් සේ සලකා දෙන්න කියූ විට ආණ්ඩුවෙන් දීලා තිබෙනවා.ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් මේ පිළිබඳ විමසූවිට ඔතුමිය පැවසුයේ මෙය පෞද්ගලික ඉඩමක් බවයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

පෞද්ගලික ඉඩමක්නම් මේ සඳහා කුමක් හෝ ක්‍රමවේදයක් ගත යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහි අයිතිකරුවකු ඉන්න බව මා දන්නවා.නමුත් අයිතිකරුවන් පිළිබඳ සෙවීමට ගියොත් ඔවුන් සල්ලි ඉල්ලාවි.ඒ නිසා අපට ඒ සඳහා මුදල් ගෙවන්න බෑ.එම ඉඩම සෞඛ්‍යාධාර සභාව විසින් මිලට ගෙන තිබෙනවා.ඒ නිසා එය සෞඛ්‍ය අමාත්‍යාංයෙන් කළ යුතු දෙයක්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සෞඛ්‍ය අමාත්‍යාංයෙන් විමසූ වි ඔවුන් පවසන්නේ ඔවුන්ට අයිති නැති බවයි.ඒ නිසා මෙය විශාල ගැටලුවක්.ඒ මිනිස්සු පව්.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සුසාන භූමිය සඳහා ඉඩම අපි නගර සභාවෙන් පවරාගෙන තිබෙනවා.ඒ භූමියෙන් කොටසක් හෝ මෙයට ඇතුළත් වී තිබේද යන්න සොයා බැලීමේදී එය එසේ සිදු වී නොමැති බව ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුම් දී තිබෙනවා.ඒ ඇතුලේ තිබුනානම් මට සභවෙන් තීන්දුවක් ගෙන ඔප්පුවක් දිය හැකි වනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්</u>**

- ගරු සභාපතිතුමනි, රණසූරිය මාවතේ පෙට්ටි බෝක්කුව ආරම්භ කිරීම සම්බන්ධයෙන්කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස මා ඔබතුමන්ට ස්තූතිය පුද කර සිටිනවා.
- ඊට අමතරව රණසූරිය මාවතේ ඇති පිං ළිද වටේටම කුණු දමා එය දැන් භාවිතා කළ නොහැකියි.ඒ නිසා එය සුද්ධ පවිත්‍ර කොට දෙන මෙන් ඉල්ලා සිටිනවා.
- පීරිස් වෙද මාවතේ කලුවඩුමුල්ලට වැටෙන අතුරු මාර්ගය සඳහා රු.120000/= ක වියදම් ඇස්තමේන්තුවත් ඇවිත් තිබෙනවා.නමුත් එය මෙතෙක් ඉටු වී නෑ.ඒ නිසා ඒ ගැන ඔබතුමන්ගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඊළඟට දීමට තීන්දු කොට තිබෙන්නේ කෙරම්ණිය පින්නදූව ප්‍රදේශයට.ඉන් පසුව අපි ඔබතුමන් කියූ කාර්යය ඉටු කරන්නම්.

## 12) න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු

**12:1 ගා/ පී ද.එස් කුලරත්න මහ විදුහලේ විදුහල්පති විසින් රණසූරිය මාවත සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් 2018.09.19 දින ඉදිරිපත් කළ ලිපිය සභාගත කරන ලදි.**

ළමුන් 3700 කට අධික  ප්‍රමාණයක් අධ්‍යාපනය ලබන කුලරත්න විද්‍යාලයට යන මාර්ගය ඉතා පටු වීම නිසා දැඩි වාහන තදබධයක් ඇති බැවින් දරුවන් අනතුරු වලට ලක් වීමේ අවධානමට ලක්වී ඇති බවත් එම මාර්ගය දෙපස ඇති කුඹුරු මට්ටමට පාර තනා ඇති බැවින් වර්ෂා දින වල ජලයෙන් යට වන බවත් දන්වා ඇත.
එම නිසා පහත කරුණු කෙරෙහි අවධානය යොමුකොට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා තිබෙනවා.

1. මෙම මාර්ගය අවම වශයෙන් අඩි 20ක් දක්වා හෝ පළල් කිරීම
2. ජල ගැලීම් වලදී මාර්ගය ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා දැනට පහත් ප්‍රදේශය ගොඩකර මාර්ගය ඉස්සීමට කටයුතු කිරීම
3. මාර්ගය එක්පසක අඩි 3ක් ,4ක් පළල ඉන්ටලොක් හෝ කොන්ක්‍රීට් යොදා පදික මංතීරුවක් සකස් කිරීම

**<u>ගරු නාගරික මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත  මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මා දැනගන්නට කැමතියි පෙට්ටි බෝක්කුව සම්බන්ධයෙන් නගර සභාවේ අලුත්ම තත්වය කුමක්ද කියා,

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහි කටයුතු සිදු කෙරෙමින් පවතිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත  මහතා  කතා කරමින්</u>**

එම ලිපිය සම්බන්ධයෙන් කතා කිරීමේදී, පෙට්ටි බෝක්කුව සෑදීමේදී සුපර්වයිසර්වරයකු පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.දවසම එතන ගත කරන්න නොහැකි වුනත් මට හැකි සෑම අවස්ථවකම

මම එම ස්ථානයට ගියා.මේ අසළ සිටින ඉඩම් හිමියන් කියා සිටියේ ඇලත් සමග ඇති කොටස පස් දමා පළල් නොකරන ලෙසයි.එය එසේ වුනොත් මන්ත්‍රීවරුන්ට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කරන බවද ඔවුන් වැඩි දුරටත් කියා සිටියා. ඒ නිසා මේ පෙට්ටි බෝක්කුව සාදා නිම කළ පසු ඇලත් සමග පුරවා ඇති කොටසේ ඇති සිලින්ඩරද ඉවත් කොට, වැඩිය පස් නොදමා විදුහල්පතිතුමන්ද කියූ පරිදි වාහනයක් හරවා ගත හැකි පරිදි, නීත්‍යානුකූල පදනම යටතේ මෙය සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මගේ නිවස ඉදිරිපිට ඇති කාණුව සඳහා ඇස්තමේන්තුද සකස් කර අනුමත වී තිබියදී 2011 සිට අවුරුදු හතක් පමණ ගත වෙලත් මේ වනතුරු එහි ඉදි කිරීම් කටයුතු සිදු වී නෑ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කොන්ත්‍රාත්කරුවකු එවන්න, එවිට අපි ඔහුට මෙය භාර දෙන්නම්.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මහතා කතා කරමින්</u>

මා ළග කොන්ත්‍රාත්කරුවන් නැනේ ගරු සභාපතිතුමනි,කොමසාරිස්තුමියගේ පාලන කාලයේ කවුරුන් හෝ කොන්ත්‍රාත්කරුවකු සමග ගිවිසුම්ගත කරගෙන තිබුණා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කොන්ත්‍රාත්කරුවකු එවන්න, එවිට අපි ඔහුට සමිතියක් හරහා මෙය ඉටු කිරීම සඳහා බලය පවරා සිටින්නම්.

**තීරණය -**

**මෙම ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව පෙට්ටි බෝක්කුව සාදා නිම කළ පසු ඇලත් සමග පුරවා ඇති කොටසේ ඇති සිලින්ඩරද ඉවත් කොට, වැඩි වශයෙන් පස් නොදමා වාහනයක් හරවා ගත හැකි පරිදි, නීත්‍යානුකූල පදනමක් යටතේ සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා අනුමැතිය ලබා දෙන ලදී.**

**12:02** අදාහනාගාරය සඳහා ගනු ලබන ගෑස් මිල ඉහළ යාම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ආදාහනාගාරය සඳහා අවශ්‍ය ගෑස් මිලදී ගනු ලැබූ මිළිඳු එන්ටර්ප්‍රයිසස් ආයතනය මගින් රු.5445/= ක් වූ ගෑස් සිලින්ඩරයක මිල රු. 6095/= වශයෙන් මිල වැඩි වී ඇති බව දැනුම් දී ඇති බැවින් බැවින් එම මිලට ගෑස් මිලදී සඳහා අනුමැතිය ඉල්ලා තිබෙනවා.

**තීරණය -**

**ආදාහනාගාරය සඳහා අවශ්‍ය ගෑස් මිළදි ගනු ලැබූ මිළිඳු එන්ට්‍රපයිසස් ආයතනය මගින් රු.5445.00 ක් වූ ගෑස් සිලින්ඩරයක මිළ රු.6095.00 වශයෙන් මිළ වැඩි වූ බව දැනුම් දි ඇති අතර, රජය විසින් ගෑස් මිළ වැඩිවීම සිදු කර ඇති බැවින් නව මිළට මිළදි ගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේවිරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12:03 ඉදරි වර්ෂ සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන සහකාර පී.එච්.එල්.සී.පුෂ්පරාණි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක 3/1/1/1/52 හා 2018.08.29 දිනැති ලිපිය අනුව ඉදිරි වර්ෂ සඳහා සංවර්ධන යෝජනා පහත පරිදි වේ.

යෝජනාව,

නිවාස මටටමින් කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් ලබා දීම.

| | ඇස්තමේන්තු මුදල |
|---|---|
| එක් බඳුනක් සඳහා රු.5000.00*500 | රු.2500000.00 |

**තීරණය -**

**නිවාස මට්ටමින් කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් ලබා දිම**

| | **ඇස්තමේන්තු මුදල** |
|---|---|
| **එක් බඳුනක් සඳහා රු.5000.00*500** | **රු.2500000.00** |

**ඉහත ආකාරයට ඉදිරි වර්ෂ සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනිමට අදාළව සංවර්ධන සහකාර (පරිසර) පී.එච්.එල්.සි.පුෂ්පරාණි මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනාව පිලිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**12:4** **පනියන්දූව සුහසාධක හා අවමංගල්‍යාධාර සමිතියේ ටෙන්ට් එක අලුත්වැඩියා කිරීම සඳහා (84ඒ) පනියන්දූව ප්‍රජා මණ්ඩලයට අයත් ගිනුමෙන් (ගි.අ.100330409529) රු.35000/= ක් ලබා දෙන මෙන් ඉල්ලා පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුවේ ලෙකම් විසින් 2018.09.24 දින ඉදිරිපත් කරන ලද** ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සඳහා ප්‍රජා සංවර්ධන නිළධාරී හා ලේකම් විසින් කළ නිර්දේශය මත මෙය අනුමත කර සිටිනවා.

**තීරණය -**

**පනියන්දූව සුහසාධක සහ අවමංගල්‍යාධාර සමිතියේ ටෙන්ට් එක අලුත්වැඩියා කිරිම වෙනුවෙන් වහල්තහඩු ,කොකු සැදිම සඳහා පට්ටම් ,අබල් වි ඇති කණු සහ වහල් සැකිලිල අලුත්වැඩියාව, පයිප්ප (3/4 ජී.අයි.බට ),වැඩකුළිය,තින්ත සඳහා පනියන්දූව ප්‍රජා මණ්ඩලයට අයත් ගිණුමෙන් රු.35000.00 ක මුදලක් ලබා දෙන ලෙසට පනියන්දූව ප්‍රජා මණ්ඩලය විසින් කරන ලද ඉල්ලිම ඉටු කිරිම සුදුසු බවත් මේ සම්බන්ධව තාක්ෂණ සේවා නිලධාරි විසින් ඇස්තමේන්තුවක් ලබා දිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12:5** ප්‍රජා මණ්ඩල ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් ප්‍රජා සංවර්ධන නිළධාරී විසින් 2018.09.28 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කර තිබුණි.

නගර සභා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන 2018.09.15 , 16, 22 යන දින වලදී යාවත්කාලීන කරන ලද කෙරමිණිය, කලුවඩුමුල්ල, පෝරඹ, පටබැදිමුල්ල හා තල්ගස්ගොඩ යන ප්‍රජා මණ්ඩල

පළාත් පාලන සහකාර කොමසාරිස්කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා සභා අනුමැතිය ඉල්ලා තිබෙනවා.

**තීරණය -**

**නගර සභා අධික්ෂණය යටතේ ක්‍රියාත්මක වන 2018.09.15,16,22 යනදිනවලදි යාවත්කාලින කරන ලද කෙරමිණිය ,පෝරඹ,පටබැදිමුල්ල හා තල්ගස්ගොඩ යන ප්‍රජා මණ්ඩල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල්වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12:6** **'නොමිලේ බැනරයක් ප්‍රදර්ශනය කිරීම '** සඳහා අවසර ලබාගැනීම වෙනුවෙන් ඕකන්ද අරුනලු මව් සමිතියේ පී.ජේ.සමන්ති ප්‍රියදර්ශනී විසින් 2018.09.28 දින ඉදිරිපත් කළ ලිපිය සභාවට ඉදිරිපත් කර තිබුණි.

සිරස නාලිකාවේ 'ගෝට් ටැලනට්' වැඩ සටහනේ අවසන් වටයට තේරීපත්වූ ඉදිකැටියේ පදිංචි තිළිණ එගොඩගේ ශිෂ්‍යාගේ බැනරයක් පොල්වත්ත මංසන්ධියේ නොමිලේ ප්‍රදර්ශනය කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.

**තීරණය**

**ඉදිකැටියේ පදිංචි තිළිණ එගොඩගේ ශිෂ්‍යයා සිරස නාලිකාවේ පැවැත්වෙන ''ගෝට් ටැලන්ට් ''වැඩසටහනේ අවසන් වටයට තේරි පත්වී ඇති බැවින් එම ශිෂ්‍යයාට සුභපැතිම වෙනුවෙන් ඕකන්ද අරුණලු මව් සමිතිය විසින් 2018.09.28 දින සිට 2018.10.05 දින දක්වා පොල්වත්ත මංසන්ධියේ නොමිලේ බැනරයක් ප්‍රදර්ශණය කිරිම සඳහා සභා අනුමැතියට යටත්ව අවසරය ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදි.**

**12:7** **අම්බලන්ගෙඩෙ නගර සභා පරිශ්‍රයේ හා බස් නැවතුම් පොළේ ආරක්ෂක අංශයට නිළධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන්** ඉදිරිපත් කරන ලද 2018.08.01 දිනැති ලිපිය සභා අනුමැතිය වෙනුවෙන් සභාවට ඉදිරිපත් කර තිබුණි.

<u>ගරු නාගරික මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,අම්බලන්ගොඩ බස් නැවතුම් පොළ සඳහා ආරක්ෂක අංශයේ නිළධාරීන් දෙදෙනෙක් අවශ්‍ය වනවාද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

බස් නැවතුම් පොළේ දෙපැත්තට දෙන්නෙක් අවශ්‍යයි.මේ පිළිබඳ ලසන්ත මන්ත්‍රීතුමන්ගේ අදහස කුමක්ද?

<u>ගරු නාගරික මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

දෙදෙනෙක් අවශ්‍යයි ගරු සභාපතිතුමනි.

<u>ගරු නාගරික මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

මා නම් දකින්නේ නෑ එහි එවැනි සේවයක් ඉටු වන බව.

<u>ගරු නාගරික මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා පසුගිය දින කීපයේම දුටුවා, එහි සිටින්නේ එක් ආරක්ෂක නිළධාරියකු පමණයි.මුලු දවස පුරාම සිටින්නේ එක් අයෙක් පමණයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහි සිටිනනේ එක් අයෙක් පමණක් නම් දෙදෙනෙකුට වැටුප් නොගෙවා එක් අයෙකුට පමණක් වැටුප් ගෙවන ලෙස මා ලේකම්තුමියට දන්වා සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

මෙම ස්ථානයේ සේවය කිරීම සඳහා එක් අයෙකු ප්‍රමාණවත් වන්නේ නෑ.මොකද දෙපැත්තෙන්ම එක විට වාහන ඇතුලු කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

රාජකාරී වැඩි, වැඩියෙන් වාහන නතර කරන්නේ දිවා කාලයේදී නිසා දිවා කාලය සඳහා සේවකයන් දෙදෙනෙකුත් රාත්‍රී කාලය සඳහා එක් සේවකයකුත් යොදා ගැනීම සුදුසු යැයි මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

රාත්‍රී කාලයේ විවිධ දේවල් එම ස්ථානයේ සිදු වන නිසා එක් අයෙකුට පාලනය කිරීම අසීරු වනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

දහවල් කාලයේ ජනගහනය වැඩියි.රාත්‍රී අටෙන් පසුව කඩවල්ද වහන නිසා ජනගහණය අඩු වනවා.එවිට එක් අයෙකුටම ඉහළ මාලයත් පහළ මාලයත් පරීක්ෂා කළ හැකියි.මූල්‍යමය පැත්ත ගැන සලකා බැලීමේදී දිවා කාලය සඳහා දෙදෙනෙකුත් රාත්‍රී කාලය සඳහා එක් අයෙකුත් සුදුසු යැයි මා යෝජනා කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එළිවන විට ත්‍රී රෝද රථගාලේ ඇති බොහෝ ත්‍රී රෝද රථ බස්නැවතුම් පොළ ප්‍රධාන දොරටුවෙන් ඇතුලේ ගාල් කොට ඔවුන් ත්‍රී රෝද රථය තුළ නිදා ගන්නවා.පසුගිය දිනක උදෑසන 4.00 ට පමණ එහි ගිය අවස්ථාවකදීත් මා දුටුවේ ආරක්ෂක මහතුන් කවුරුත් එහි නොසිටි බවත් ත්‍රී රෝද රථ බස්නැවතුම් පොළට ඇතුල් කර තිබූ බවත්.

**<u>ගරු නාගරික මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පසුගිය 29, 30 දෙදින ලේකම්තුමියද දැනුවත් කොට මා ක්‍රීඩා පිටියට එක් ආරක්ෂක නිළධාරියකු ගෙන්වා ගත්තා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේනම් ඒ පිළබඳ සොයා බලා එහි සිටින්නේ එක් අයෙක් පමණක්නම් එක් අයෙකුට ගෙවීම් කරන ලෙස මා ලේකමතුමියට දන්වා සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

නගර සභාවේ ආරක්ෂක නිළධාරීන් දෙදෙනකු සිටීනම් ඉන් එක් අයෙක් බස් නැවතුම් පොළ සඳහාද යෙදවිය හැකි නේද ගරු සභාපතිතුමනි,

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභාවේ රාත්‍රී කාලයේ ආරක්ෂක සේවයේ සිටින්නේ එක් අයෙක් පමණයි.මෙතැනින් බස් නැවතුම් පොළට මාරු කළොත් ඔවුන්ගේ වගකීම නැතිව යනවා.ඒ නිසා ඔවුන් සතු වගකීම තබා ගත යුතුයි.

**තීරණය -**

**අම්බලන්ගොඩ නගර සභාව සහ බස්නැවතුම්පළ සඳහා ආරක්ෂක කටයුතු දැනට ක්‍රියාත්මක වන ගිවිසුම් කාලසීමාව තුළ ආරක්ෂක කාර්ය මණ්ඩලය විසින් නගර සභා පරිශ්‍රය තුළ දිවා කාලයේ OIC 01 අයෙකු හා SO අයෙකු යොදවන ලෙසත් රාත්‍රී කාලයේ SO අයෙකු යෙදවීමටත් බස් නැවතුම් පළ දිවා කාලයේ SO දෙදෙනෙකු සහ රාත්‍රී කාලයේ SO දෙදෙනෙකුත් රාත්‍රී කාලයේ නගරසභා පරිශ්‍රයේ දැනට සේවයේ යොදවා ඇති මුරකරු සුමුදු මයා වෙනත් ස්ථානයක යෙදවීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**12:8** **"නිල සෙවන කාර්යාලයක් ඉදි කිරීම (2019 වර්ෂය)"** සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද 2018.09.26 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කර තිබුණි.

ග්‍රාම නිළධාරී , ආර්ථික සංවර්ධන නිළධාරී , සමෘද්ධි සංවර්ධන නිළධාරී හා කෘෂි පර්යේෂණ හා නිෂපාදන නිළධාරී එකම ස්ථානයක සිට කාර්යක්ෂම සේවයක් ලබාදීමේ අරමුණින් ස්වදේශ කටයුතු අමාත්‍යාශය මගින් ක්‍රියාවට නංවන නිල සෙවන කාර්යාලය ඉදිකිරීම සඳහා පහත ඉඩම් හඳුනාගෙන ඇති බැවින් ඒ පිළිබඳ එකගතාවය ඉල්ලා තිබුණි.

| අනු අංකය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය | යෝජිත ස්ථානය | |
|---|---|---|---|
| 01 | 82 මහ අම්බලන්ගොඩ | කොට්ඨාශයෙන් පිටත කොට්ඨාශයට මායිම්ව පිහිටි ඉඩමකි.ප්‍රජාශාලා ගොඩනැගිල්ල හා නගර සභා පෙර පාසල අතර හිස් ඉඩම ( මානාන ක්‍රීඩාංගන භූමිය) | |
| 02 | 82 ඒ හිරේවත්ත | 1. මාසම්පා ගග අසළ පිහිනුම් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය පිහිටි ඉඩම<br>2. හිරේවත්ත නගර සභා පුස්තකාලය පිහිටි ඉඩමේ කොටසක් | |
| 03 | 83 කරිත්තකන්ධ | අම්බලන්ගොඩ කන්ද මාවත පොදු ළිද පිහිටි ඉඩම | පර්. 4 |
| 04 | 84 ඒ පනියන්දූව | දැනට ග්‍රම නිළධාරීජ කාර්යාලය පිහිටි ප්‍රජාශාලා ගොඩනැගිල්ල හා නගර සභා පෙර පාසල අතර හිස් බිම ( මානාන ක්‍රීඩා භූමිය) | |
| 05 | 85 පටබැදිමුල්ල | දැනට ග්‍රාම නිළධාරී කාර්යාලය පවත්වාගෙන යනගොඩනැගිල්ල පිහිටි වෙරළ උද්‍යානය ආශ්‍රිත ඉඩම | |
| 06 | 86 ඒ කලුවඩුමුල්ල | ග්‍රාමිණී විද්‍යාල ක්‍රීඩා භූමිය | |
| 07 | 86 සී පෝරඹ | අ.ම. කරුණාරත්න ප්‍රජා ශාලාව පිහිටි ඉඩම | |
| 08 | 84 විලේගොඩ | අම්බලන්ගොඩ මහා විහාර පාර භූමිතෙල් ගබඩාව අසළ ඉඩම | |
| 09 | 86 ඩී තල්ගස්ගොඩ | අම්බලන්ගොඩ ග්‍රාම නිළධාරී ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ බිම් කොටසක් | |

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,සෝභිත මන්ත්‍රීතුමාත් මමත් සහභාගී වූ ප්‍රජා මණ්ඩල සංවර්ධන වැඩපිළිවෙල දිනයේ පෙන්වා දෙනු ලැබුවේ මහ අම්බලන්ගොඩ අපේ පෙර පාසලට යාබද ඉඩමේ විශාල ඉඩ ප්‍රමාණයක් පවතින බවයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එහි තිබෙන්නේ ළිදක්.එම ළිද පරිත්‍යාග කළ පුද්ගලයා හෝ ඥාතීන් විසින් කිසියම් දිනක ඒ ළිද නැවත ඉල්ලා සිටියහොත් අපට ගොඩනැගිල්ලත් සමගම ඔහුට දීමට සිදු වනවා.අපට මෙම ළිද පරිත්‍යාග කරනු ලැබුවේ කවුරුන් විසින්ද?

**ගරු නාගරික මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ඔහු දැනට පදිංචිව සිටින්නේ කොළඹ ප්‍රදේශයේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔවුන් මේ ළිද අප වෙත පැවරීමට එකග වේවිද?

**ගරු නාගරික මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්**

මා ඒ පිළිබද සොයා බලා කටයුතු කරන්නම්.ඒ අනුව ඔහුගේ කැමැත්ත ඇතිව එම ස්ථානයේ මෙය ඉදි කිරීම සුදුසු බව මා යෝජනා කර සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එසේනම් මේ ළිද අයිතිකරු විසින් මෙය අප වෙත පැවරීමේ එකගතාවය ලැබුනහොත් පමණක් අදාළ ඉදි කිරීම සදහා මෙම භූමිය සුදුසු බව මා ප්‍රකාශ කර සිටිනවා.
මී ළගට අම්බලන්ගොඩ කන්ද මාවත තිබෙන පොදු ළිද පිහිටි ඉඩම මෙම ඉදි කිරීම සදහා සුදුසුදැයි විමසා සිටිනවා.

**ගරු නාගරික මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ඒ සදහා මාගේ එකගතාවය ප්‍රකාශ කොට සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

**පනියන්දූව,** දැනට ග්‍රාම නිළධාරී කාර්යාලය පිහිටි මානාන භූමියේ එම ස්ථානයේම ඉදි කිරීමට අවසරය ලබා දෙනවා.
**පටබැදිමුල්ල,** දැනට ග්‍රාම නිළධාරී කාර්යාලය පිහිටි වෙරළ උද්‍යානය ආශ්‍රිත ඉඩමේ ඉදි කිරීමට අවසරය ලබා දෙනවා.
**කලුවඩුමුල්ල,** ග්‍රාමිණී විද්‍යාලයේ ක්‍රීඩා භූමිය තුළ එහි පසෙකින් ඉදි කිරීමට අවසරය ලබා දෙනවා.
**පෝරඹ,** ඇ.ම.කරුණාරත්න ප්‍රජා ශාලාව පිහිටි ඉඩමේ කොටසක ඉදි කිරීමට අවසරය ලබා දෙනවා.
**විලේගොඩ,** අම්බලන්ගොඩ මහා විහාර පාරේ භූමිතෙල් ගබඩාව අසළ ඉඩම ඉදි කිරීමට අවසරය ලබා දෙනවා.නමුත් දැනට මෙම භූමියේ අයිතිකරු වනුයේ දුම්රිය දෙපාර්තමේන්තුවයි.දුම්රිය දෙපාර්මේන්තුව ළමා ක්‍රීඩාංගනයක් පවත්වාගෙන යාම සදහා බදු පදනම මත මෙය අපට ලබා දී තිබෙනවා.නමුත් ක්‍රීඩාංගනයක් පවත්වාගෙන යන්නේ නැති නිසා බදු ගෙවීම් සිදු කර නෑ.ඒ නිසා මේ සදහා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අවසර ගතයුතු වනවා.
**තල්ගස්ගොඩ,** තල්ගස්ගොඩ ග්‍රාම නිළධාරී කාර්යාලය පිහිටි ඉඩමේ කොටසක් මේ සදහා යොදා ගැනීමට අවසරය ලබා දෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,තල්ගස්ගොඩ ඩිපෝ එක ඉදිරිපිට ගොඩහේන පාරේ අපේ බිම් කොටසක් තිබෙනවා. පසුගිය ප්‍රජා සංවර්ධන රැස්වීමේදීත් මේ පිළිබද කතිකා කළා.මේ සදහා එම භූමිය සුදුසු යැයි මා යෝජනා කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නමුත් එතැන තිබෙන්නේ ගලක්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔව්,නමුත් ඒ ගල සහිත හිස් ඉඩම දැන් වෙනත් පුද්ගලයකු විසින් අයිති කරගෙන තිබෙනවා.ඒ නිසා එම ස්ථානය මේ සදහා යොදා ගැනීම සුදුසු යැයි මා යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ පිළිබඳ මාගේ එකගතාවය පළ කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දොළොස්මහ ඉදිරිපිට තිබෙන අප සභාව සතු භූමිය දැනට කිසිදු කාර්යයකට යොදාගෙන නොමැති නිසාත් , සියලු දෙනාටම පහසු ස්ථානයක් නිසාත් එම භූමිය මේ සදහා සුදුසු යැයි මා යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සදහා සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය පළ කරනවානම් ලබා දෙන්නම්.

**<u>ගරු නාගරික මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මෙහි කෙරමිණිය ගැන සදහන් වුයේ නෑ.ඒ නිසා කෙරමිණිය නිල සෙවන සදහා කෙරමිණිය පින්නදූව ගම් දෙකේම ජනතාවට පහසුවෙන් සමීප වියහැකි සමූපකාර භූමියේ පර්චස් 15 ක පමණ පසුපස තීරය මේ සදහා සුදුසු යැයි මා යෝජනා කරන අතර එයද අදාළ ලේඛනයට ඇතුළත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සමූපකාරය සතු ඉඩමක් ලබා ගැනීමට එම කාරක සභාවෙන් තීන්දුවක් ගත යුතු අතර එය මහ සභාවේ අනුමත විය යුතුයි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

එය අපට කර ගැනීමේ හැකියාව තිබෙනවා ගරු සභාපතිතුමනි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නමුත් එය පහසු කාර්යයක් නොවෙයි. හේතුව, අම්බලන්ගොඩ සමූපකාරයට අයත් සියදෙනා ගෝනපිනුවල කෙළවර දක්වාම සිටිනවා.ඔවුන්ට කෙරමිණිය, මහඅම්බලන්ගොඩ ගැන අවබෝධයක් නෑ.ඒ නිසා ඔවුන්ගේ කැමැත්ත ලබා ගැනීම සුලුපටු දෙයක් නොවෙයි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කෙරමිණිය, පොල්වත්ත, ඕකන්ද නිල සෙවන සදහාත් ඉඩම් අවශ්‍යයි.මා පිළිබද ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා සමග සාකච්ඡා කළ අවස්ථාවේ එතුමන්ද ප්‍රකාශ කර සිටියේ මේ සදහා අවශ්‍ය ලේඛන සකස් කොට එයට අදාල අවසරය ඔබතුමාගෙන් ලබා ගන්නා ලෙසයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ ප්‍රජා ශාලාවට යාබඩව සෑදිය හැකියි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංනී මහත්මිය කතා කරමින්</u>**

ඕකන්දේ ඥාණසීලි මහත්මියගේ නිවස අසළ ඉඩම් කොටසක් තිබෙනවා.ප්‍රජා ශාලාව යාබඩ නොකළොත් එය අපේ ප්‍රජාශාලා කටයුතු වලට ඒ විදියටම යොදා ගත හැකියි.ඥාණසීලි මහත්මියගේ නිවස අසළ තිබෙන පර්චස් 5ක පමණ කොටස මේ සදහා යොදා ගනිමු.

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

එහි ඉඩම් කොටසක් තිබෙනවා ගරු සභාපතිතුමනි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

පොල්වත්ත සදහාත් ගැටලුවක් තිබෙනවා.ඒ සදහාත් ඉඩම් කැබැල්ලක් ඉල්ලා සිටියා.ආදාහනාගාරයේ තිබෙන ඉවත් කරන ලද ගොඩනැගිල්ල මේ සදහා යොදා ගතහොත් එය ගැටලුවක් වේවිද?

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සුසාන භූමියේ පහළ විහාරගොඩ මාවතේ කෙළවරේ සෑදිය හැකියි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එතැන ප්‍රධාන පාරකුත් තිබෙන නිසා වාහන යෑම් ඒම් සදහා ගැටලුවක් වන්නේත් නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ස්ථානය ලබා දීම පිළිබද ගැටලුවක් වන්නේ නෑ.එය ලබා දිය හැකියි.

**<u>ගරු නාගරික මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,පොල්වත්ත ක්‍රීඩා පිටිය ඉදිරිපිට කොටසක් මරණාදාර සමිතිය සදහා ලැබුනු බවත් මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමන්ලාට ලබාදුන් එම කොටස අයිති වන්නේ පොල්වත්තට නොව කලුවඩුමුල්ල ප්‍රදේශයටයි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම ස්ථානය සංස්කෘතික කාර්යාලයක් ඉදිකිරීමට යෝජිත බවද දැනගන්නට ලැබුනා.ඒ නිසා ඒ පිළිබද සොයා බලා නිරවුල් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහි නිරවුල් අයිතිය රජය සතුයි.අපට අයිතිය තිබෙන්නේ මාර්ගයටයි.දැන් එම ඉඩම තිබෙන්නේ මාර්ගය තිබෙන ස්ථානයේ.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

පොල්වත්තේ මැද වගේ ස්ථානයක් මේ සදහා යොදා ගතහැකිනම් එය වඩාත් සුදුසු වනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත බුද්ධදත්ත විදුහල ඉදිරිපිට ඇති එම පාසල් භූමියේම කොටස එ සදහා ලබාගත හැකියි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එසේනම් ඒ ස්ථානය සුදුසු බව ඔබතුමන් විසින් දන්වාහරින ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ස්ථානය සදහා මුදල් ලබාදෙන බවට ප්‍රධාන අමාත්‍යතුමන් කියූ නිසා මුල් ගලක්ද තැබුවා.නමුත් ඒ සදහා මුදල් ලැබුනේ නෑ.

**<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්;</u>**

මම හිතන්නේ මුදල් ලැබුණත් එහි කටයුතු සිදු කෙරුනේ නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුදල් ලැබුනේ නෑ.මුදල් ලැබුනානම් අපි ඉදිකිරීම සිදු නොකර ඉන්නේ නෑ.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංනී මහත්මිය කතා කරමින්</u>

කලුවඩුමුල්ලේ ඉඩම් කැබැල්ල ගැන තවත් අභියෝගයක් පැමිණ තිබෙනවා, එහි අයිතිය නගර සභාව සතු නොවන බවත් ග්‍රාමීණි විදුහල සතු බැවින් ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරය ලබායුතු බවටත්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමන්ලාගේ යෝජනා පිළිබද මම කතා නොකිරීමට හේතුව වුනේ මම මහ ඇමතිතුමන් සමග අවුරුදු 20ක් කටයුතු කළා.ඒ කාලයේත් මේ ආකාරයේ යෝජනාවන් කලේත් නෑ.මුදල් ලබා දෙන්න උවමනාවක් තිබුනේත් නෑ.ඒ නිසා එතුමන් කියා සිටින්නේ මුදල් රැගෙන එන ලෙසයි.

<u>ගරු නාගරික මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්;</u>

ඒ කාලයේ ඒ ප්‍රදේශ නියෝජනය කළ අයට ඒ පිළිබද උනන්දුවක් තිබීනෑ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්;</u>

ඒ කාලයේදීත් මේ නගර සභාවේ මෙන් කොහේවත් වැඩ කළේ නෑ.මා රාහුල මන්ත්‍රීතුමන්ටත් කියා සිටින්නේ, ඔබතුමන්ද අප සමග දීර්ඝ කාලයක් මේ සභාව නියේජනය කළ අයෙක්.ඒ නිසා ඔබතුමන් එසේ කතා කරන්න එපා.අපි ලැබුනු මුදල් නැවත කාටවත් යවලා නෑ.අපි වැඩ කළා.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආ මුදල් නැවත ගියාට අපට කරන්න දෙයක් නෑ.අපි මහ ඇමතිතුමාගෙන් මුදල් ලබාගෙන ඕනෑතරම් වැඩ කර තිබෙනවා.ඒ නිසා ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමන්ටද මා කියා සිටින්නේ එවැනි ප්‍රකාශ නොකරන ලෙසයි.

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්;</u>

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආ මුදල් නැවත ගියේ නිළධාරීන්ගේ වැරදි නිසා.

<u>ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්;</u>

ගරු සභාපතිතුමනි, කලුවඩුමුල්ල නිල සෙවන සදහා නගර සභාවෙන් (පොල්වත්ත පිට්ටනිය ඉදිරිපිට)බිම් තීරුවක් ලබා දෙන බව කියා සිටියා.නමුත් එය ඉදිරියට ගෙනයාම සම්බන්ධයෙන් අපට තිබෙන නීතිමය අයිතිය පිළිබද මා දැනගන්නට කැමතියි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එම ඉඩම් කැබැල්ල නගර සභාව සතු නොවන බවත් රජය සතු බවත් මා මීට පෙරත් කාරක සභා අවස්ථාවේදී කියා සිටියා.මෙය ප්‍රාදේශීය ලේකම්තුමා සතු ඉඩමක් නිසා ඔහුට මේ පිළිබද කැමති තීරණයක් ගත හැකියි.නමුත් පොල්වත්ත පාර නගර සභාව සතුයි.

<u>ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්;</u>

ප්‍රදේශයේ ජනතාව ගොස් මෙහි වැටක් ගැසුවොත් එහි නීතිමතය ගැටලුවක් තිබෙනවාද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එහිදී රජය සතු අයිතිය අපට පාවිච්චි කළ හැකියි. ගැටලුවක් වන්නේ නෑ.

<u>ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්;</u>

එසේනම් පොල්වත්ත ජනතාවද සංවිධානය වී එහි වැටක් ගැසීමට සිදු වනවා එම දේපළ අත්පත් කර ගැනීම සඳහා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය ඔබතුමන්ලා බලහත්කාරයෙන් සිදුකළ යුතු වනනේ නෑ.එය ප්‍රාදේශීය ලේකම්තුමා මාර්ගයෙන් සිදුකර ගත හැකියි.

**ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්;**

ඔබතුමන් කියා සිටින්නේ ප්‍රාදේශීය ලේකම්තුමා හමුවීමට ගොස් එතුමන් සමග සාකච්චා කොට මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්නා ලෙසද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව්,නීත්‍යානුකූල ක්‍රමවේදය වන්නේ එයයි.අපිට මීට මැදිහත් වීමේ අයිතිය තිබෙන්නේත් පාරට පමණයි.නමුත් එහි පාර කෙලින් කිරීමේදී මේ ඉඩම උඩින් ගොස් තිබෙනවා.

**ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්;**

ගම්වාසීන්වත් නොවන පිටස්තර පුද්ගලයන් විසින් මෙවැනි රජයේ ඒ වගේම අපේ ගමේ දේපළක් අත්පත් කර ගැනීම සඳහා පැමිණෙනවානම් ඒ සඳහා ඉඩදිය නොහැකියි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමන් මහජන නියෝජිතයෙක්. මහජන දේපළ රැක ගැනීම අප කාගේත් වගකීමක්.ඒ නිසා ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවය ඉටු කිරීම ඔබතුමන් කටයුතු කරන්න.එ පිළිබඳ ගැටලුවක් මතුවන්නේ නෑ.අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්;**

ගරු සභාපතිතුමනි,මෙහි පාර තිබෙන්නේ අප සතු දේපළක.අදාල දේපළ PRDA එක සතු වනවා.ඒ නිසා එම දේපළ දෙක අපට හිලව් කරගත හැකි නේද?ඒ නිසා අපේ අයිතියක් ප්‍රාදේශීය ලේකම්තුමාටවත් කාටවත් දියයුතු නෑ.පොල්වත්ත ක්‍රීඩා පිටිය ඉදිරිපස ඇති ඉඩමේ කොටසක් අම්බලන්ගොඩ බටපොල ප්‍රධාන මාර්ගය සඳහා යොදාගෙන තිබෙනවා.ඒ අනුව එම ඉඩමට PRDA එක සතු ඉඩම හිලව් කරන ලෙස මා යේජනා කර සිටිනවා.

**ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කර සිටිනවා.ඒ වගේම නිල සෙවන සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී අපි නගර සභාවෙන් ප්‍රාදේශීය ලේකම්තුමාට නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ඉඩම් නගර සභාව හෝ රජය සතු නිරවුල් ඉඩම් විය යුතුයි.හවුලේ පවතින හෝ නීතිමය ගැටලු තිබෙන කිසිම ඉඩමක් සඳහා රජයේ මුදල් ලැබෙන්නේ නෑ.ඇමතිතුමන් පැවසුවේ මේ නිල සෙවන සඳහා ඉක්මනින් අදාළ ස්ථානයන් ලබා දෙන ලෙසයි.එහිදී (උදාහරණයක් ලෙස එකකට ලක්ෂ 20 බැගින්) එකම ආකාරයෙන් සාදන ලද නිල සෙවන ගොඩනැගිලි විය යුතයි.ඒ අනුව ඒ සඳහා නිරවුල් ඉඩම් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අනුව ඉහත කී ස්ථාන සියල්ලම නිල සෙවන සඳහා ලබාදීම වෙනුවෙන් සභා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

**නිල සෙවණ කාර්යාල ඉදිකිරිම -2019 වර්ෂය මැයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවන නිල සෙවණ වැඩසටහන යටතේ නිල සෙවණ කාර්යාල ඉදිකිරිමට අදාළව පහත සඳහන් පරිදි යෝජිත ඉඩම් පිළිබඳ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ලැයිස්තුව අතරින් පහත සඳහන් පරිදි පිළිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

| අනු අංකය | ග්‍රාමනිලධාරි කොට්ඨාශය | යෝජිත ස්ථානය | ප්‍රමාණය |
|---|---|---|---|
| **01.** | **82** මහඅම්බලන්ගොඩ | කොට්ඨාශයෙන් පිටත කොට්ඨාශයට මායිම්ව පිහිටි ඉඩමකි.ප්‍රජාශාලා ගොඩනැගිල්ල හා නගර සභා පෙරපාසල අතර හිස් බිම(මානාන ක්‍රීඩාංගනභූමිය /ක්‍රිඩා භූමියට හානියකි නොවේ.) | |
| **02.** | **83** කරිත්තකන්ද | අම්බලන්ගොඩ කන්ද මාවත පොදුළිද පිහිටි ඉඩම | පර්.**04** |
| **03.** | **84** ඒ පනියන්දුව | දැනට ග්‍රාම නිලධාරි කාර්යාලය පිහිටි ප්‍රජාශාලා ගොඩනැගිල්ල හා නගර සභා පෙර පාසල අතර හිස් බිම(මානාන ක්‍රිඩා භූමිය ) ක්‍රිඩා භූමියට හානියකි නොවේ. | |
| **04.** | **85** පටබැදිමුල්ල | දැනට ග්‍රාම නිලධාරි කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල පිහිටි වෙරළ උද්‍යානය ආශ්‍රිත ඉඩම | |
| **05.** | **86** ඒ කළුවඩුමුල්ල | ග්‍රාමනි විද්‍යාලය ක්‍රිඩා භූමිය (ක්‍රිඩා කටයුතුවලට හානි නොවන පරිදි ලබාගත හැක) | |
| **06.** | **86** සි පෝරඹ | අ.ම කරුණාරත්න ප්‍රජා ශාලාව පිහිටි ඉඩම | |
| **07.** | **84** විලේගොඩ | අම්බලන්ගොඩ මහා විහාර පාර භූමිතෙල් ගබඩාව අසල ඉඩම(මෙම භූමිය **CGR** එකට අයත් බැවින් ඔවුන්ගෙන් අවසරය ලබා ගැනිම සිදු කළ යුතුය) | |
| **08.** | හිරේවත්ත ප්‍රදේශය | දොළොස් මහ නිවස ඉදිරිපිට (ගැස් කඩය අසල ) පරණ ළමා ක්‍රිඩාංගනය භූමිය | |
| **09.** | **86**ඩි තල්ගස්ගොඩ ප්‍රදේශය | **CTB** ඩිපෝව ඉදිරිපිට ඉඩම | |
| **10.** | පොල්වත්ත | බුද්ධදත්ත පාසල ඉදිරිපිට ඉඩම් කොටස හෝ පිට්ටනිය අසල ඇති කොටස | |
| **11.** | ඕකන්ද | සුසාන භූමිය පිටුපස ( තොරණ ගසා ඇති තැන)විහාරගොඩ පාරට මුහුණලා ඇති ඉඩම් කොටස | |
| **12.** | කෙරමිණිය | සමුපකාර භූමියේ පසුපස තිරයෙහි ඉඩම් කොටස(කාරක සභාවේ තින්දුවක් ගෙන මහසභාවේ අනුමත කිරිමට යටත්ව) | |

**12.9 තීරණය -**

**පොල්වත්ත ක්‍රීඩාංගනය තුල බටපොළ- අම්බලන්ගොඩ මාර්ගය ඉදිවී ඇති අතර මෙය PRDA එකට අයිති බැවින් පොල්වත්ත ක්‍රීඩාංගනය ඉදිරිපිට ඇති PRDA එකට තිබෙන ඉඩම එමඉඩම වෙනුවෙන් හිලව් කර ගැනිම සුදුසු බවටත් මේ පිළිබඳ ලිඛිතව දන්වා යැවීම සුදුසු බවටත් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:10-** පොල්වත්ත පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගයේ එක් පසෙක ඉදිකර ඇති ශරීර සුවතා මංතීරුව සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කර ඇති 2018.09.28 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කර තිබුණි.

පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අතරමග නතර වී ඇති ශරීර සුවතා මංතීරුවේ ඉතිරි වැඩ සම්පූර්ණ කර ප්‍රජාව වෙත පරිහරණය සඳහා පැවරීමේ හැකියාව පවතින බැවින් අම්බලන්ගොඩ බටපොල ප්‍රධාන මාර්ගයට හානියක් නොවන පරිදි උක්ත ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්;</u>

ගරු සභාපතිතුමනි,හල් වතුර ඇල දිගේ විත් පනියන්දූවට එකතුවන මාර්ගය මෙම මංතීරුව සඳහා සුදුසු යැයි මා යෝජනා කරනවා. එහිදී බෝක්කු දැමීමට සිදු වන්නේ ස්ථාන දෙකක හෝ තුනක පමණයි.මෙහි බෝක්කු ඉදිකිරීම හැර වෙනත් කිසිවක් කළයුතු වන්නේ නෑ. එම නිසා මෙම මංතීරුව හල්වතුර සිට පනියන්දූව හරහා මහඅම්බලන්ගොඩ (යහලදූව) දක්වා කි.මී. තුන හතරක වටප්‍රමාණයක දිවෙනවා.ඇත්තෙන්ම ඔබතුමන්ට මෙය ක්‍රියාත්මක හැකිනම් එය ඉතා වැදගත් දෙයක් වනවා.මෙයට අදාළ ප්‍රතිපාදන වලින් දෙවන කොටසද ගරු ප්‍රධාන අමාත්‍යතුමන් එවා තිබෙනවා.ඒ සම්බන්ධයෙන් එතුමන්ට මාගේ විශේෂ ස්තුතිය පුද කර සිටිනවා.එක් කොටසක පාර ගිලාබැසීමේ ගැටලුව නිසා මෙහි ඉදි කරීම් කටයුත් නතර වී ඊට අදාළ මුදල් නැවත ගියා.ඒ අනුව මෙහි ඉතිරි කොටසද අවසන් කරමින් මෙම මංතීරුව සකස් කරන ලෙස මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

මෙහි පළල සහ දුර පිළිබඳ විස්තර ඔබතුමන්ලා සතුව තිබෙනවාද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්;</u>

මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මීට අදාළ මිනින්දෝරු සැලැස්ම එවා තිබුනා.

<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

එහි ඡායා පිටපතක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය**

**පොල්වත්ත පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගයේ එක් පසෙක ඉදිකර ඇති ශරීර සුවතා මංතිරුවේ ඉතිරිවැඩ සම්පූර්ණ කර ප්‍රජාව වෙත පරිහරණය සඳහා පැවරීමේ හැකියාව පවතින බැවින් (ඔබ අධිකාරියට අයත් අම්බලන්ගොඩ බටපොළ ප්‍රධාන මාර්ගයට හානියක් නොවන පරිදි ) උක්ත ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සම්පූර්ණ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසට ප්‍රාදේශිය ලේකම් විසින් කරන ලද ඉල්ලිම සඳහා සභාවේ එකඟතාවය ලබා දෙන ලද අතර තව දුරටත් මෙම මංතිරුව යහලදූව ප්‍රදේශය දක්වා බෝක්කු දෙකක් හෝ තුනක් දමා සකස් කිරිමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉල්ලිමක් කිරිම සුදුසු බවට ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් කරන ලද යෝජනාව සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:11** ගම්සිරි උදාන පදනම යටතේ හල්වතු ප්‍රදේශයේ ඉදි කරන එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානය **සම්බන්ධයෙන්** ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2018.08.07 සභා තීරණ අංක 5.2.1 යටතේ පීරිස් වෙද මාවත පෝරුක් ඇලට යාබද කොටසේ එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් සෑදීම අනුමත් කොට තිබෙනවා.මෙය ඉදි කෙරෙමින් පවතින අතරතුර එය නතර කරන ලෙස ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව මගින් දුරකථනයෙන් දන්වා තිබෙනවා.ඒ අනුව මෙම කොටස සභාවට පවරන ලෙස ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාවට ඉල්ලීමක් කිරීම සුදුසු බවට යෝජනා කර තිබෙනවා.

**තීරණය -**

**ගම්සිරි උදාන පදනම මගින් හල්වතුර ප්‍රෙද්ශයේ ක්‍රියාත්මක වෙමින් පවතින ඉඩම් නඩු 2746 නඩුවට අදාළ මාර්ගයට ආසන්නයේ පවතින නගර සභාව සතු ඉඩම් කොටසෙහි එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඉදිකිරිම සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව මෙම ඉඩම් කොටස නගර සභාවට පවරා දෙන ලෙස ඉඩම් ගොඩකිරිමේ අමාත්‍යාංශයෙන් ඉල්ලිමක් කිරිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:12** **පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන කරනු ලබන සංවර්ධන කටයුතු ඇස්තමේන්තු අනුමත කිරීම** සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට අදාළ විසිරි ජල පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන් මිල ගණන් ලබා ගැනීම ගැටලු සහගත බවත් අවශ්‍යතාවය අනුව පිළියෙල කරන ලද TOR අනුව සුදුසුකම්ලත් ආයතනයක් මගින් මිල ගණන් කැඳවා TEC නිර්දේශ ලබාගෙන විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීම සුදුසු බව දැනුම් දී තිබෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහිදී මිල ගණන් සැදුවේ කෙසේද යන්න දිස්ත්‍රික් මිල ගණන් කමිටුවේ වාර්තා වල සඳහන්ව නෑ.ඒ නිසා එහි ගොස් ඒ පිළිබඳ සාකාච්ඡා කිරීමෙන් අනතුරුව එය විසදා ගන්නා බවට මා දැනුවත් කොට තිබෙනවා.

**තීරණය**

**පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන කරනු ලබන සංවර්ධන කටයුතු ඇස්තමේන්තු අනුමත කර ගැනිම මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව දිස්ත්‍රික් මිළ ගණන් කමිටුව මගින් සාකච්ජා කොට විසඳිමට කටයුතු කරන ලෙසට දැනුවත් කර ඇති බව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා සභාව වෙත දැනුම් දෙනලදි.**

**12:13** **සුනාමියෙන් අවතැන් වූවන් සඳහා ඔප්පු ලබාදීම (අම්බලන්ගොඩ ටී.එච්.ඩබ්. නිවාස සංකීර්ණය)** සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද 2108.09.21 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ටී.එච්.ඩබ්. නිවාස ඉදිකර ඇති ඉඩම සඳහා සකස් කර ඇති මු.පි.ගා.3780 පිඹුරේ නම් සංශෝධනය කළ හැකිද යන්න සම්බන්ධයෙන් විමසා ඇත.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒ අනුව පුද්ගලික මිනින්දෝරු මහතකු ලවා සංශෝධනය කර ගැනීමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්;**</u>

ගරු සභාපතිතුමනි,මෙම ඉඩමේ පහළ අක්කර භාගයක පමණ කොටසක අඩි 100ක් පමණ පළල නිවාස සංකීර්ණය දිගටම දිවෙන බෑවුම සහිත මංතීරුවක් තිබෙනවා .ඊට යාබධව ඇත්තේ කුරුදු ඉඩම් නිසා කවුරුන් හෝ මෙයින් කොටසක් අල්ලා ගැනීමට ඉඩකඩ තිබෙන නිසා මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බව මා යෝජනා කර සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහි අපේ මායිම් වෙන් කොට තිබෙනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්;**</u>

මායිම් වෙන් කර තිබුණත් ගරු සභාපතිතුමනි,කවුරුත් භාවිතා නොකරන නිසා එය ගැටලුවක් වනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඉදිරියට මෙය ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමට මා යෝජනා කරනවා.

**තීරණය**

**සුනාමියෙන් අවතැන් වුවන් සඳහා ඔප්පු ලබාදීම - අම්බලන්ගොඩ THW නිවාස සංකීර්ණය මැයෙන් ප්‍රාදේශිය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව මෙය පුද්ගලික මිනින්දෝරු මහතකු ලවා සංශෝධනය කිරිම සඳහා අනුමැතිය ඉල්ලා සිටි අතර මේ සඳහා එකඟතාවය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

**12:13** **අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ජලය නොලැබීම නිසා ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උඩිස් ජල ටැංකියක් ඉදි කරමින් ජලය සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම හෝ වෙනත් විකල්පයක් යෙදීම** සම්බන්ධයෙන් ඕකන්ද ජ්‍යෂ්ඨ පුරවැසි කමිටුව මගින් ඉදිරිපත් කර ඇති 2018.09.18 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කර තිබුණි.

දැනට ඕකන්ද ප්‍රදේශයේ ප්‍රජා ශාලාවට යාබඩව පිහිටි රජයට අයත් ඉඩම් කැබැල්ලේ පවුල් 500කට පමණ ප්‍රමාණවත් වන සේ අවශ්‍ය ජල ධාරිතාවයට සාපේක්ෂව උඩිස් ජල ටැංකියක් සකසා අම්බලන්ගොඩ කලුවඩුමුල්ල ප්‍රධාන මාර්ගයේ ඇති ප්‍රධාන නළ ජල මාර්ගයට සම්බන්ධ කරමින් අදාළ නිවෙස් වලට අතිරේක ජලය එමගින් සැපයීමෙන් හෝ ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය මගින් වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් ලබා ගැනීමෙන් හෝ ප්‍රදේශයේ ජල ප්‍රශ්නයට පිළියමක් යොදන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,එය ඉතාමත් අත්‍යවශ්‍ය වූ වැදගත් යෝජනාවක් වනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,ඇත්තෙන්ම මෙය වැදගත් කටයුත්තක් වන නිසා මෙය ප්‍රධාන අමාත්‍යතුමන් මාර්ගයෙන්ද යොමුකොට තිබෙනවා.මේ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීම සම්බන්ධයෙන්ද ලිපි සකස් කොට තිබෙනවා.ඒ අනුව සභාවෙන් මේ සඳහා ලබාදිය හැකි සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

දැනටත් ජල සම්පාදන මණ්ඩලයෙන් මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතිනවා.අපිත් ඔවුනට සහයෝගයක් ලෙස මෙම ලිපියත් සමග නගර සභාව මගින් අම්බලන්ගොඩ ශාඛා කළමණාකරුට ලිපියක් ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙම ජල ප්‍රශ්නය උග්‍ර ප්‍රශ්නයක් බැවින් මේ සම්බන්ධයෙන් ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කරන්න

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

මෙම ජල ප්‍රශ්නය උග්‍ර වීමට හේතුව වන්නේ නව සම්බන්ධතා ලබා දීමයි. හොද ජල සැපයුමක් ලබා දීමටනම් කලුවඩුමුල්ලේ ජල ටැංකිය අඩි 16ක්වත් පිරි පැවතිය යුතුයි. මේ සම්බන්ධයෙන් දීර්ඝ විසඳුමකට යන තෙක් අධි පීඩන ජල ටැංකියක් ඉදිකිරීම සුදුසුයැයි මා යෝජනා කරනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් රු.බිලියන 12 ක පමණ ව්‍යාපෘතියක් සූදානම් කොට තිබෙනවා.එය ළඟදීම ක්‍රියාත්මක කිරීමට සූදානමින් සිටිනවා.

**තීරණය**

**අම්බලන්ගොඩ - ඕකන්ද ප්‍රෙද්ශයේ ප්‍රමාණවත් ජලය නොලැබීම නිසා ප්‍රමාණවත් ධාරිතාවක් ඇතිඋඩින් ජල ටැංකියක් ඉදිකරමින් ජලය සැපයිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම හෝ වෙනත් විකල්පයක් යෙදිම සම්බන්ධයෙන් ඕකන්ද ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව ජල ප්‍රශ්නය උග්‍ර ප්‍රශ්නයක් බැවින් මෙය විසඳිම සම්බන්ධව ජලසම්පාදන මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12:14** තණකොළ කපන අත් ට්‍රැක්ටර් යන්ත්‍රයේ සේවය වෙනුවෙන් දිරි දීමනාවක් ලබා ගැනීම සම්බන්ධයෙන් එස්.එච්.ඉන්දික කුමාර (වැඩ ක්ෂේත්‍ර කම්කරු) විසින් 2018.09.28 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කර තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ තණකොළ කපන අත් ට්‍රැක්ටර් යන්ත්‍රයේ ක්‍රියාකරු වශයෙන් සේවය කිරීම වෙනුවෙන් එස්.එච්.ඉන්දික කුමාර මහතා හට රු.100/= ක දෛනික දිරි දීමනාවක් ලබාදීම නිර්දේශ කොට තිබෙනවා.ඒ අනුව ඒ සඳහා අනුමැතිය ලබා දෙනවා.

**තීරණය :**

**අම්බලන්ගොඩ නගර සභාවේ තණකොළ කපන අත්ට්‍රැක්ටර් යන්ත්‍රයේ ක්‍රියාකරු වශයෙන් සේවය කිරිම වෙනුවෙන් එස්.එච්.කුමාර මහතා හට සේවය කරනු ලබන දිනයක් වෙනුවෙන් රු.100. 00 ක දිරිදිමනාවක් ලබාදිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**12 :15** මන්ත්‍රීවරු **4**ක් එක්ව ඉදිරිපත් කළ **2018.10.01** දිනැති තෙල් මිල වැඩි කිරීමට එරෙහි යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

ආණ්ඩුව විසින් මිල සූත්‍රය අනුව ගෑස් ඇතුලු අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිල ඩහළ දැමීම පිළිබද බල ප්‍රදේශයේ ජනතාවගේ විරෝදය ප්‍රකාශ කර ඇති අතර භාණ්ඩ වල මිල අඩු කිරීමට වහා පියවර ගන්නා ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>

මා මේ යෝජනාව සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී සභාවේ බල ප්‍රදේශය තුළ ඊට ඇති අදාළත්වය පිළිබද සැලකිලිමත් වන ලෙස මා ඉල්ලා සිටිනවා

<u>ගරු නාගරික මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කරනවා. ඒ අනුව මේ සම්බන්ධව පළාත් සභාවට හා පාර්ලිමේන්තුවට දැනුම් දෙන ලෙසත් , ඒ පිළිබදව සහනයක් ලැබේවි කියාත් මා බලාපොරොත්තු වනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මේ යෝජනාව අප වෙත ඉදිරිපත් කළේ අද උදෑසන.මේ පිළිබඳ අපගේ පෙර සූදානමක් නැතිව තමයි අප මෙයට අත්සන් කළේ මෙය සභාවට ඉදිරිපත් කිරීම සඳහා.නමුත් මෙතුමන් ඉදිරිපත් කරන සරල නෑ.ගමට පමණක් නොව මුලු ශ්‍රී ලාංකාවාසී ජනතාවටම පැන නැගී ඇති ගැටලුවක් තමයි එතුමන් ඉදිරිපත් කළේ.ගෑස් මිල, ඉන්ධන මිල,විදුලිය මිල ආදී සියල්ලම ඉතාම වේගයෙන් ඉහළ යන තත්වයක් තුළ රජය විසින් මිල සූත්‍රයක් ඉදිරිපත් කර තිබෙනවා.එය කුමක්ද කියා ඉදිරිපත් කරන්න යන්න තමයි එතුමන්ගේ මූලික යෝජනාව.මුදල් අමාත්‍යාංශය හෝ ඒ අදාළ රජයේ ආයතන මගින් මේ පිළිබඳ විමසා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමු.ඒ වගේම මේ සම්බන්ධයෙන් මගේ අදහස වනුයේ මේ තෙල් මිල හෝ ගෑස් මිල වැඩි වීම ක්ෂණිකව සිදුවිය හැකිද යන ගැටලුව පැන නගිනවා.ලෝක වෙළඳ පොළේ අද තෙල් මිල වැඩිවනවිට මෙරට මිලත් වැඩි වනවානම් එයින් අදහස් වන්නේ අප සතුව තෙල් හෝ ගෑස් තිබී නොමැති බවයි.අඩුම වශයෙන් අද වැඩිවන මිලට තව මාසයකින් හෝ එකහමාරකින් මේ මිල වැඩි වනවානම් අපට එය විශ්වාස කළ හැකියි.මොකද තෙල් නැවක් හෝ ගෑස් නැවක් එන්න සති දෙකක් ගත වනවා.රජයක් විසින් ගබඩාකොට තබා ගන්නේ සතියකට හෝ සති දෙකකට ප්‍රමාණවත් ඉන්ධන හෝ ගෑස් පමණක් නොවෙයි.අඩුම වශයෙන් මාස දෙකකට අවශ්‍ය ප්‍රමාණය තිබෙනවා.දැන් රජය සතුව තිබෙන්නේ මාස දෙකකට පමණ පෙර තිබූ මිල ගණන්වලට ඇමරිකානු ඩොලරය 152 ට, 153 ට තිබූ කාලයේ ඇණවුම් කරන ලද තෙල් සංචිත .අද වනවිට ඇමරිකානු ඩොලරය 174 ක් වනවා.ඒ නිසා තෙල් බැරලය 82 ක් වී තිබෙනවා.ඒ අනුව අප සතුව තිබිය යුත්තේ ඇමරිකානු ඩොලරය 56 ට, 58 ට තිබියදී ඇණවුම් කරන ලද තෙල් සංචිත.ඒවා තමයි දැන් ලැබෙමින් පවතින්නේ.ඒ නිසා ඒවා ජනතාවට අඩු මිලට සැපයිය හැකියි.ඒ නිසා රජයක් විසින් ලෝක වෙළඳ පොළේ වර්තමාන මිල අනුව තෙල් මිල ඉහළ දමනවා.නමුත් මාගේ තර්කය වන්නේ පෙර සංචිත තිබියදී ලෝක වෙළඳ පොළේ මිල වැඩිවන විට අද පවතින මිල වැඩිවන්නේ කෙසේද යන්නයි.ඒ නිසා මේ මිල සූත්‍රය පිළිබඳ දැනුවත් කිරීමක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා කළ අදහසට පිළිතුරු සැපයිය යුතුයි.තෙල් මිල පාලනය කිරීම සම්බන්ධව විමසා සිටියා.තෙල් මිල ගියේ ඇමරිකානු ඩොලරය ලෝකයේ තිබෙන අනෙකුත් රටවල් සමග හුවමාරු කිරීමේදී තිබුණු ස්ථාවරභාවය නිසා.අනෙක් පැත්තෙන් ඉරානයේත් වෙනිසියුලාවේත් ඇමරිකාව යම් යම් සම්බාධක දැමූ නිසා ලෝක තෙල් තොග තත්වයට අදාළ රටවල් වල තෙල් එකතු වෙවී අඩ් වීමක් සිදු වුනා.ඒ අතරතුර 2015 ජනවාරි මස 09 වැනිදා සිට මේ තෙල් මිල වැඩි කරන තෙක් ස්ථාවර මිලකට ජනතාවට තෙල් ලබා දුන්නා.ඒ වගේම මා ඔබතුමන්ට මතක් කර දීමට කැමතියි , අසල්වැසි ඉන්දියාව ආර්ථික ශක්තිය අතින් අපට වඩා බොහෝ ඉහළින් සිටිනවා.නමුත් ඉන්දියාවේ රුපියල අවප්‍රමාණය වුනා ලංකාවේ රුපියලට වඩා රුපියල් දෙකක් වැඩියෙන්.ඒ නිසා අප රුපියල් හතකට අවප්‍රමාණය වනවිට ඉන්දියාව රුපියල් නවයකට අවප්‍රමාණය වී තිබෙනවා.ලෝකයේ ඇමරිකානු ඩොලරය ස්ථාවර වෙද්දී මේ අවප්‍රමාණයවීම් සිදුවුනා.තෙල් සැපයීම අඩුවුනා.එවිට කුමන ජනාධිපතිවරයකු යටතේ පවතින රජයකට වුවත් මේ මිල ඉහළ යාම දරන්නට නොහැකියි.ඒ නිසා රජයට අකමැත්තෙන් වුවත් තෙල් මිල වැඩිකිරීමට සිදුවී තිබෙනවා.අපිත් එකග නෑ. නමුත් රජයට ඒ මුදල දැරිය නොහැකියි.ඒ නිසා තෙල් මිල ඉහළ දැමීමට සිදු වී තිබෙනවා.අනෙක් පැත්තෙන් ඔබතුමන්ට පිළිතුරු සැපයිය යුතුයි, ඔබතුමන් කියා සිටියා නාස්තිකාර වියදම් අඩු කරන්න කියා. 2015 ජනවාරි මස 09 දින සිට මම මේ මැතිවරණ කොට්ඨාශයේ විවිධ ව්‍යාපෘති සඳහා බොහෝ නිහඬව මිලියන 3000 කට වැඩි මුදලක් මෙම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් වැය කොට තිබෙනවා. ඒ කාලය තුල ලක්ෂ 100 කවත් ලක්ෂ 200 ලක්ෂ 50කවත් ලක්ෂ 10 කවත් සැණකෙළි පැවැත්වූයේ නැති බව මා වගකීමෙන් යුතුව පවසා සිටිනවා. ඒ අනුව අපි නාස්තිකාර වියදම් සිදු නොකළ බව බෙහෝ පැහැදිලිව කියා සිටිනවා. උදාහරණයක් ලෙස ලක්ෂ දෙසියයක වියදමින් ප්‍රජාපති ගෝතමී බාලිකා විදුහලේ ගොඩනැගිල්ලක් විවෘත කළ අවස්ථාවේ එහි ජනෙල් සවි කළේ මාගේ වියදමින්. අපි කිසිසෙත් එවැනි නාස්තිකාර වියදම් දරන්නේ නෑ . ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු ආමාත්‍යාංශයේ වෙන්කරපු මුදල් මගේ නමට ලැබෙනවා. ඒ වගේම මෙම මුදලම මහා ඇමතිතුමටත් ලැබෙනවා. ඒ ලැබෙන ලක්ෂ 1000 ක මුදලින් රුපියල් 100ක් වත් නාස්තිකාර ලෙස වියදම් නොකරන බවත් ඒවා අම්බලන්ගොඩ සංවර්ධන කටයුතු සඳහා යොදවනු ලබන බවත් මා පවසා සිටිනවා. රජය තෙල් මිල වැඩිවීම සම්බන්ධව අපිත් විරුද්ධයි . නමුත් කරන්න දෙයක් නෑ. ලෝක වෙළඳපොළේ තෙල් මිල වැඩිවන විට පවතින රජයට තෙල් මිල වැඩි කිරීමට සිදු වෙනවා .

<u>ගරු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ ගරු නාගරික මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා කළ යෝජනාවට අනුව අදට පවතින තත්වය තුල එතුමා පවසන කරුණ නිවැරදි විය හැකිය. නමුත් පාලන තන්ත්‍රයක් ගෙන යන විට නීති ක්‍රමවේද පනවනු ලබන්නේ පාර්ලිමේන්තුව මගින්. පාර්ලිමේන්තුවේත් ඒ සම්බන්ධව කටයුතු කිරිමට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් සිටිනවා. නමුත් තෙල් සම්බන්ධව මේ මිල සුත්‍රය කියන සංකල්පය ඇවිත් තියෙන්නේ පාර්ලිමේන්තුව හරහාමයි. ඒ නිසා මෙය නගර සභාවට අදාල කරුණක් නොවේ. නමුත් මහජනතාව සම්බන්ධ කටයුත්තක් නිසා එතුමන්ගේ ඉදිරිපත් කිරීම සාධාරණයි. කුමන රජයක් පත් වුවත් රජයන් මාරු වුවත් රට පාලනය කිරීමට සිදු වන්නේ ජාත්‍යාන්තරයට විවෘතවයි. ඒ නිසා එම රටවල් වල ගනු ලබන තීන්දු තීරණ අනුව අපේ පාලන තන්ත්‍රය තුළ තීන්දු තීරණ ගැනීමට සිදු වනවා. තෙල් මිල එකසිය හැට ගණනට තිබී එකසිය තිස් ගණනක් වී තිබෙනවා. ඒ නිසා ජාත්‍යාන්තර මිල තත්වය අනුව අපේ මිල වෙනස් වෙනවා .මෙම මිල සුත්‍රය තුල මිල අඩු විමටත් මිල වැඩිවිමටත් ඉඩ තිබෙනවා. රාජ්‍ය සේවකයින් විශාල සංඛ්‍යාවක් වැඩිවිම තුල රජයට විශාල වියදමක් දැරිමට සිදු වෙනවා .ඒ වගේම පොදු යටිතල පහසුකම් සපයන්න සිදු වෙනවා . නොයෙකුත් ව්‍යවසනයන්ට මුහුණ පාන්න සිදු වෙනවා. ඉදිරියේදි මිල අඩු වෙනවා නම් අපිත් කැමතියි. මේ යෝජනාව දැම්ම තුල පාර්ලිමේන්තුවෙන් ගනු ලබන ක්‍රියා මාර්ග අපිට වෙනස් කළ නොහැකියි. කුමන පාලන තන්ත්‍රයක් පැවතියත් එහි ඉහල මන්ත්‍රීවරු සකච්ඡා කොට නිසි තීන්දු තීරණ ගතයුතුයි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කුමන පක්ෂයේ කුමන භේද තිබුණත් තෙල් මිල යාමත් ඊට සාපේක්ෂව සිදුවන බඩු මිල ඉහළ යාම නිසා ජනතාවට සිදුව තිබෙන ගැටලු අනුව මෙතුමන් ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත් කාලෝචිත වනවා.මෙය හදිසි යෝජනාවක් වුනත් මේ පිළිබද සාකච්ඡා කළ යුතුයි.අපේ විපක්ෂ නායකතුමන් ප්‍රකාශ කළා එතුමන් මිලියන 3000 කට අධික මුදලක් නොයෙකුත් ව්‍යාපෘති සදහා වියදම් කළ බව.නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වකවානුවේ මහින්දෝදය වැනි ව්‍යාපෘති මගින් ප්‍රජාපති විදුහල වැනි ගොඩනැගිලි සිය ගණනක් පාසල් වල ඉදිකළා.ඒ නිසා එතුමන් ඉදිරිපත් කළ දේ වගේ දහස් ගණනක් දේවල් අපට ඉදිරිපත් කළ හැකියි.මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන් යටතේ එවකට අපි සංවිධායකධූරය දැරූ අවධියේත් ඒ වාගේම සෑම රජයකින්ම පාසලට, සෞඛ්‍යයට ජනතාවට පහසුකම් දිය හැකි සෑම අවස්ථාකම ඒ පහසුකම් ලබා දී තිබෙනවා. එතුමන් පැවසුවා ඒ කාලයේ සංදර්ශන පැවැත්වූයේ නැති බව.අපේ කාලෙත් සංදර්ශන පැවැත්වූයේ නෑ.අද අපි පාරක ගියත් ඒවා මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් කෝටි ගණනක් වියදම් කර ඉදි කරන ලද කාපට් පාරවල්.ඒ වගේම රාහුල මන්ත්‍රීතුමා, ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමා ඇතුලු අපි සෑම මන්ත්‍රීවරයෙක්ම ගමන් කරන්නේත් මේ පාරවල් වලමයි.අම්බලන්ගොඩ සිට බටපොල දක්වාත්, කෙරමිණිය පාරේ පින්නදූව හන්දිය දක්වාත් කාපට් කළා.ප්‍රධාන අමාත්‍යතුමන් එක් අවුරුද්දකට කිලෝ මීටර 40 ක් පමණ කාපට් කර තිබෙනවා.මේවා පාසල් වෙනුවෙන්, සෞඛ්‍ය වෙනුවෙන් සෑම රජයක් විසින්ම ඉටු කළයුතු වගකීම් වනවා.මිල සූත්‍රය අනුව මේ මස 10 වනදා වනවිට තෙල් මිල තවත් ඉහළ යාවි.මේ විදියට මාසෙන් මාසෙට සිදුවන තෙල් මිල වැඩිවීම ජනතාවට දරාගත නොහැකියි.තව මාසයක් දෙකක් යනවිට ඩොලරයත් තෙල් මිලත් එකට යාවි.එතුමන් ගෙන යෝජනාව හැල්ලුවට ලක් කරීම සුදුසු නෑ.එය ජනතාව වෙනුවෙන් එතුමන් විසින් ඉදිරිපත් කරන ලද හොද යෝජනාවක්.එය අපට කළ හැකියි. අපි විපක්ෂනායකතුමන්ට දොස් පවරනවා නොවෙයි.රජයකට ජනතාව වෙනුවෙන් දියහැකි ලොකුම දෙය වන්නේ මේ බරෙන් ඔවුනට සහනයක් ලබා දීමයි.සියලු පාලකයන් පත්ව සිටින්නේ ජනතාවගේ ඡන්දයෙන්.රජයක වගකීම වන්නේ ජනතාවට කොකා පෙන්නලා මාසෙන් මාසෙට තෙල් මිල ඉහළ දමන එක නොවෙයි.ජනතාවගේ බර හැල්ලු කරන එකයි.අපි ගරු ජනාධිපතිතුමන්ට කියා සිටින්නේ , ඒ වගේම ගරු අගමැතිතුමන්ට කියා සිටින්නේ මේ බරෙන් ජනතාව හැල්ලු කරන්න කියා.ඒ නිසා එතුමන් ඉදිරිපත් කළ යෝජනාවට අපගේ සහයෝගය දක්වන බව මා ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමාත් සරත් මන්ත්‍රීතුමාත් පැවසූ අදහස් සම්බන්ධයෙන් සාකාච්ඡා කිරීමේදී , පැවති රජයන්හි ජනාධිපතිවරු අගමැතිවරු අතරින් මහින්ද රාජපක්ෂ මැතිතුමන් ගැන ආඩම්බරයෙන් කතා කළා වගේම ඉතාම අවධාරනයෙන් කිව යුතුයි එම වකවානුවේ විදුලි බිල අඩු කිරීම සඳහා අධිකරණ නියෝගයක් ලබා දුන්නද විදුලි බිල අඩු කළේ නෑ.මිනිසුන් පාරේ වැටී, මැරී උද්ඝෝෂන පැවැත්වූවා.නමුත් එතුමාත් දිනෙන් දින තෙල් මිල වැඩි කළා.ඒ දවස්වල ඔබතුමන්ලා දැන් වගේ මේ තෙල් මිල ගැන කතා කළේ නැද්ද? මොකද තෙල් මිල වැඩි කළේ මේ රජයෙන් විතරක්

නොවෙයි.තෙල් මිල වැඩි වන හැම අවස්ථාවකම සෑම රජයක්ම මේ තෙල් මිල වැඩි කළා.ගෑස් මිල වැඩි කිරීම එතුමන් තමයි වැඩි වශයෙන් කළේ.ගෑස් සිලින්ඩරය රු.2500/= දක්වා වැඩි කළා.නමුත් දැන් පවතින ආණ්ඩුවෙන් ගෑස් මිල අඩුකොට සහනයක් ලබා දුන්නා.භාණ්ඩ මිල ගැන කතා කිරීමේදී කිරිපිටි පැකට් එකක මිල දරුවෝ වඩලා වඩලා තමයි ඉහල දැම්මේ. මේවා අමතක කරන්න එපා. අපි නායකයින් ගැන විවේචනය කිරීමක් සිදු නොකළත්, තෙල් සූත්‍රය ගැන අවතක්සේරුවෙන් කර කථා කරන්න එපා. අපගේ විපක්ෂනායකතුමා පැහැදිලි කර දෙනු ලැබුවා තෙල් මිල වැඩි වීමට හේතුව. සමහර විට තෙල් මිල අඩු වුනොත් මිල අඩුවෙන් ලබා දෙයි. ආණ්ඩුව පත්වුනු ගමන් මහින්ද රාජපක්ෂ මහත්තයාගේ යුගයේ තිබුණ තෙල් මිල අඩු කළා.අපි ඒවත් කතා කළ යුතුයි. ඒකෙන් වැඩි කළා මේකෙන් වැඩි කළා යැයි ආණ්ඩුවලට දොස් පැවැරීමක් අවශ්‍ය වන්නේ නෑ. රජයේ සේවකයන්ට රු.10000/= ක් වැඩි කළා . මෙය වැඩි කලේ මේ අපේ ආණ්ඩුවෙන්. රජයේ සේවකයෝ විදියට අපිත් රු.10000/= මුදලක් ලබා ගන්නවා. පවුලේ හතර දෙනෙක් වුණොත් රු. 40000/= ක මුදලක් ලැබෙනවා. තෙල් මිලේ රු.10/= ,15/= නෙමෙයි ගෑස් එකේ රු.100/= නෙමෙයි ගෙදරට එන ආදායම තත්වය ගැන සිතිය යුතුයි. අධිවේගී මාර්ගය ඉදිකරන වියදමට වඩා වැඩි මුදලක් එය විවෘත කිරීමට වැය වුනා. මමත් වැඩ කලේ අධිවේගී මාර්ගයේ . මේවා අනවශ්‍ය වියදම් ලෙස කතා කළ යුතුයි. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලය තුළ පොඩි උත්සවයක් තිබුණත් ඒ සඳහා අනවශ්‍ය ලෙස වියදම් වුනා. මේවට වගකීම භාර ගත යුත්තේ එතුමා වටා සිටි පිරිසයි. මෙම ක්‍රමය නැතිවිය යුතුයි. හැම නායකයෙක්ම බලයට පත්වෙන්නේ ජනතාවට සේවය කිරීම සඳහායි. හැබැයි ඒ අතින් ගත්තොත් අහසයි පොළවයි වගේ වියදම් කළේ. අපි සෑම වසරකම නිදහස් උත්සවය සමරනවා . හැම උත්සවයකටම මම ගියා. මට පුදුම හිතුනා අඩු වියදම් දැරීම සම්බන්ධයෙන්. ඒ අවස්ථාවේ අපට ලැබුණේ වතුර බෝතලයයි කිරි පැකට් එකක් පමණයි. අන්න ඒ ආකාරයෙන් වියදම් අඩු කිරීම සම්බන්ධයෙන් අපි සතුටු විය යුතුයි. සෑම නායකයෙකුම රටේ ජනතාවගේ මුදල් සමග සෙල්ලම් කරනවා. එහෙත් තෙල් මිල ගැන අවධානයෙන් කතා කිරීම පලක් වන්නේ නෑ. . මොකද පසුගිය රජයේත් මෙය සිදු වුණා. මහින්ද මහත්තයා හොඳ නායකයෙක්. දැනටත් ගෑස් මිල අඩුයි එතුමාගේ කාලයට වඩා. මහින්ද රාජපක්ෂ මහතාගේ කාලයේත් මෙම තෙල් මිල වැඩි විය . අපි ඒ කලයේ මොකුත් පැවසුවේ නෑ. පඩි ගෙවලා මගේ ආයතනයේ මගේ සේවකයෙක් අරන් ගියා විදුලි බිල වැඩි කිරීම නිවැරදි බව පවසන උද්ඝෝෂණයට. එහෙම යුගයක් තිබු බව අමතක කරන්න එපා. අපේ ආයතනයේ අපේ සේවකයින් විසින් බෝඩ් අල්ලන් සිටියා. උසාවි නියෝගයක් දීලාත් විදුලි බිල අඩු නොකර, ඒ සම්බන්ධව අපේ සමහර අය කියනවා විදුලි බිල වැඩි කිරීම නිවැරදි බව. ලංකාවේ එහෙම අයත් හිටියා.

<u>ගරු නාගරික මන්ත්‍රී ධර්මදාස මහතා කතා කරමින්</u>

මහින්ද රාජපක්ෂ මැතිතුමා තෙල් මිල වැඩි කලේ ඒ කලේ බරපතල යුද්ධයක් පැවතුන නිසා. එම යුද්ධයට මුදල් වියදම් කළා. ඒ වගේම රටට සුනාමි තත්වයත් බලපෑවා. ඉන් විපතට පත් ජනතාවට සහනාධාර ලබා දීමට සිදු වුනා. මෙවැනි කාරණා නිසා තෙල් මිල ටිකක් ඉහල දැම්මට සිදුවුනා.තෙල් මිල ඉහල යාම නිසා ජනතාවට විවිධ ආර්ථික අපහසුතාවලට මුහුණ පෑමට සිදු වූවා. මෙතුමා ගෙන එන ලද යෝජනාව රටටම ගෙනෙන ලද යෝජනාවක්. අද දුම්රිය ගාස්තු 15% කින් වැඩි වන ලෙස පවසා සිටියත් එය 45% ක් දක්වා වැඩි වී තිබෙනවා. දුම්රිය වාර ප්‍රවේශපත්‍රයක ගාස්තු රු.600/= සිට රු.900/= දක්වා වැඩි වී තිබෙනවා. රු.3300/= ගාස්තුව රු.4200/= දක්වා වැඩි කර තිබෙනවා. හිටපු ජනාධිපතිතුමා යුද්ධයකට මුහුණ දීගෙන , සුනාමියත් පැමිණි කාලයක ජනතාවට දීමනා ලබා දී තමයි මේ කටයුතු සිදු කරනු ලැබුවේ. එහෙත් අද එවැනි තත්වයක් නෑ. අද ජනාධිපතිතුමා ප්‍රකාශ කරනු ලබන්නේ අවසාන සති දෙක තුල පමණක් යුද්ධය නිම කළ බවයි. අද යුද්ධය නැති නිසා නිදහස් රටක් තිබෙනවා. මෙතුමන්ලාට ජනතාවට කිසිදු කරදයක් නොමැතිව සහන දීමට හැකියාව තිබියදිත් සහන ලබා දෙන්නේ නෑ. මාධ්‍යවලින් ප්‍රසිද්ධ කලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාහන ගෙන්වීම නතර කල බව. නමුත් එය නතර කරනු ලැබුවේ එකී වාහන ගෙන්වීමෙන් පසුවයි. එවැනි තත්වයක් අද උදා වී තිබෙනවා. අද කටයුතු සිදු කරනු ලබන්නේ ජනතාවට බරක් වන ලෙස බව මා ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. හිටපු ජනාධිපතිතුමා අතිගරු මහින්ද රාජපක්ෂ මහතාගේ කාලයෙත් තෙල් මිල වැඩි වූ බව ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ප්‍රකාශ කළා. නමුත් තිස්වසරක පැවති දැවැන්ත යුද්ධයක් එතුමාත් ආරක්ෂක ලේකම්තුමාත් එක්ව අවසන් කළා. වරාය, ගුවන් තොටුපොළ ඉදි කළා.සියලු ප්‍රධාන මාර්ග කාපට් කළා.අධිවේගී මාර්ග ඉදි කළා. ඉස්සර කටුනායක ගුවන්තොටුපොළට ගුවන් ගමනකට කෙනෙකුට යාමට අවශ්‍ය වුවහොත් බත්මුල් බැදගෙන වතුර බෝතල් අරගෙන උදේන්ම ගුවන්තොටුපොළට

[redacted] ගමන් කල හැකිය. එතුමාට ස්තුති වන්ත විය යුතුයි. [redacted]යාව ඇත. යුද්ධය නිම කළයුතු බව පැවසුවත් එය නිම කලේ නෑ. එය නිම කරනු ලැබුවේ මෙතුමා විසිනි. අපිත් ඒ දිනවල ගමන් කළේ ප්‍රධාන මාර්ගයේ . මට මතකයි යුද්ධය පවතින වකවානුවේ එක් දිනක් ලංගම සේවයේ බස් රථයක බෝම්බයක් තිබී මිනිසුන් මැරී සිටියා. ඒ දිනවලදී මෙතුමන්ලා යුද්ධය නිම කිරීම ගැන ජනාධිපතිතුමාට පිං දුන්නා. එතුමාරජ කෙනෙක් කිවුවා . එම වකවනුවල මේ අය පෙළපාලි ගියේ අප සමගයි. සෑම මසකම තෙල් මිල වැඩි වනවා. වැඩිවන එක සම්බන්ධව නෙමේ ඇහුවේ.වැඩිවන සූත්‍රය පිළිබඳව එතුමන්ලා ගම්වාසී ජනතාවට පිළිතුරු සැපයි යුතුයි. මෙතුමන්ලා මෙය ඩොලරය මිල වැඩිවීමත් සමග පටලවා ගෙන තිබෙනවා. හිටපු ජනාධිපතිතුමා අධිවේගී මාර්ගය මේ පැත්තෙන් කඩවතට සහ අනෙක් පසින් ගාල්ල දක්වා නිම කළා. වසර තුනක් ඉක්ම ගියද තවමත් ඉන් එහාට ඉතිරි ටික නිම කර ගැනීමට නොහැකි වුණා. දුම්රිය මාර්ගවලද කිසිදු සංවර්ධන කටයුත්තක් මේ වනතුරු සිදු කොට නෑ. තෙල් මිල අඩු කරනවා, රැකියා ලබා දෙනවා යැයි පැවසුවා . නමුත් අපගේ මේ සභාවේ පුස්තකාල සහායක තනතුර සඳහා අයදුම්පත්‍ර 3000ක් පමණ ඉදිරිපත් විය. මේ රටේ එතරම් පිරිසකට රැකියාවල් නොමැති බව ඉන් පැහැදිලි වනවා. එක තනතුරක් සඳහා අයදුම්පත්‍ර 3000ක් අයදුම්පත්‍ර ලද වෙනත් රටවල් ලෝකයේ නැත. පවතින්නේ එවැනි රජයකි. මෙම රට ණය කරනු ලැබුවේ මෙම බැදුම්කරය විසින්. ඒ බැදුම්කර සිද්ධිය නිසා රට අවුරුදු 10කින් ආපස්සට ඇද දැම්මක් සිදුවුණා. මහින්ද මහත්තයා සිටි කාලයේ හොරා හොරායි පවසන ලදි.නමුත් මෙහි තමයි හොරු ඉන්නේ .බැදුම්කරයේ ඉන්න හොරුන්ට දඬුවම් ලබා දිය යුතුයි. රට ණය වී ඇත්තේ බැදුම්කර සිද්ධිය නිසාය.

- පෙ.ව. 1.10ට පමණ සභාව පැය ½ කට කල් දමන ලදී.
- ප. ව. 1.45 ට සභාව නැවත ආරම්භ කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>

මා පවසමින් සිටියේ අපේ නගර සභා පුස්තකාලයේ පුරප්පාඩුව ගැනයි.පවතින එක් පුරප්පාඩුවට අයදුම්පත් 3000 ක් පමණ ඉදිරිපත් වී තිබෙනවා. අපේ අයිරාංගනි මන්ත්‍රීතුමිය ප්‍රකාශ කලා මහින්ද මහත්තයාගේ කාලයේ තිබූ උද්ඝෝෂණයක් සඳහා කිරි පැකට් එකයි වඩේයි ලබා දුන් බව . පසුගිය කාලයේ අපි සහභාගි වූ පෙළපාලිය සඳහා සහාගිවූවන් සඳහා දෙන ලද කිරි පැකට් වලට මෙතුමන්ලා විසින් විෂ මුසු කරනු ලැබුවා . ඉන් බොහෝ දෙනා අසනීප වුවා .

<u>ගරු නාගරික මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමනි මා එසේ ප්‍රකාශ කළේ නෑ. ඒ නිසා එය වෙනස් කළ යුතුයි.මම පැවසුවේ අපේ නිදහස් උත්සවය සඳහා ලබා දුන්නේ කිරි පැකට් එකයි වතුර බෝතලයයි පමණයි කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>

මට වැරදීමක් වුනානම් මා එය ඉල්ලා අස්කර ගන්නවා.එවැනි තත්වයක් තමයි මේ රජයේ තිබෙන්නේ. මා සමග ගිය තුන්දෙනකුද අසනීප වුවා. මෙතුමන්ලා මහින්ද මහතාට දෝෂාරෝපනය කලත් අපේ නිවෙස්වල අපේ තාත්තලා අපේ දරුවන් පවා අද නිදහසේ ඉන්නේ එතුමා නිසායි. අපේ තාත්තලා හදිස්සියකට කොළඹ ගියත් අපි බියට පැයෙන් පැයට දුරකථන ඇමතුම් දෙනවා. එවැනි තත්වයක් තමයි එතුමා රටේ නැති කලේ. එතුමා රජෙක් කියා මුලු ලංකාවේම ජනතාව එතුමාට දීර්ඝායුෂ පැතුවා. දැන් හොරා හොරා කියමින් දොස් පවරනවා . එතුමා ජනාධිපතිතුමන්ව සිටින කාලයේ මම මන්ත්‍රීවරයෙක් ව සිටියදී රුපියල් ලක්ෂ සියයක් පමණ ප්‍රතිපාදන මටත් ලැබුණා. එකල රටේ දැවැන්ත යුද්ධයක් පැවතුනා.ඒනිසා එවැනි නායකයෙකුට අපහාස කිරීම ගැන මම මාගේ බලවත් කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මේ සම්බන්ධව මධ්‍යස්ථව සිට කතා කිරීමට මා අවසර ඉල්ලා සිටිනවා. එතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට දොස් නැගුවොත් එම පාක්ෂිකයන්ට කේන්ති යනවා. අපේ නායකතුමාට දොස් නැගුවොත් අපිට කේන්ති යනවා . ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකතුමන් වන මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට මොනවා හරි කිවොත් කේන්ති යනවා . ඒ නිසා අපි

අතර ප්‍රශ්න ඇති නොකර ගනිමු. තෙල් ප්‍රශ්නය සම්බන්ධවයි අපි කතාව ආරම්භ කරනු ලැබුවේ. නමුත් සභාවේ සිද්ධවුනේ පක්ෂවල නායකයන් ගැන මත ඉදිරිපත් කිරිමක්. මෙය ප්‍රශ්නයට පිළිතුරක් නොවෙයි.ඒ නිසා මෙවැනි පොඩි පොඩි දේවල් වලට ගැටලු ඇති කර ගන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.මීට වඩා දේවල් තිබෙනවා අපිට කරන්න.අපි අම්බලන්ගොඩ නගරයේ පුරවැසියෝ.ජනතාව ඡන්දය දීලා ඔවුන් සතු අයිතිවාසිකම් අපට ලබා දී තිබෙනවා.අපි සියලුදෙනාම එක්ව සමගියෙන් මේ සභාව ඉදිරියට ගෙනයමු කියා මා නැවතත් ඉල්ලා සිටිනවා.මහින්ද රාජපක්ෂ මහතා හොද නායකයෙක්.අපි මහින්ද රාජපක්ෂ මහතා අගය කරනවා වගේම අනෙක් අයත් එතුමන්ලාගේ නායකයන්ට ආදරෙයි.අපේ නිලානි මන්ත්‍රීතුමිය, රාහුල මන්ත්‍රීතුමා, ධනසිරි මාදුවගේ මන්ත්‍රීතුමා මෛත්‍රීපාල සිරිසේන මහතා අගය කරනවා.ඒ වගේම වෙන සභාවක සභාපතිවරයකුට වඩා අපි ඔබතුමන්ව අගය කරනවා.ඒ නිසා මෙවැනි පොඩි දේවල් වලට හිත් අමනාපකම් ඇති කර ගන්නේ නැතිව අපි සියලුදෙනාම සමගියෙන් කටයුතු කරමු කියා මා නැවතත් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ඇත්ත වශයෙන්ම මෙම මන්ත්‍රීතුමිය සභාවේ තිබෙන එකමුතුකම ගැන , අපි ක්‍රියාකළයුතු ආකාරය ගැන පැවසුවා.මෙහිදී අපේ මන්ත්‍රීතුමන් ඉදිරිපත් කළ යෝජනාව සඳහා තමයි ප්‍රශ්නයක් පැන නැගුනේ.තෙල් මිල,ගෑස් මිල, භාණ්ඩ මිල අඩු වැඩි වීම සම්බන්ධව තමයි සියලු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළේ.නමුත් යුද්ධය අවසන් කිරීම සඳහා මහින්ද රාජපක්ෂ මැතිතුමන් කළ සේවය අපි අගය කරනවා.එතැනදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, මහජන පක්ෂය ආදී සියලු පක්ෂ කිසිම පක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබා දුන්නා.ඒ අවස්ථාවේ කරු ජයසූරිය මහතා එක්සත් ජාතික පක්ෂයේ සිට ඇවිත් එතුමන්ට සහයෝගය ලබා දුන්නා.ඒ සමයේ ආරක්ෂක අංශ භාරව සිටියේ මෛත්‍රීපාල සිරිසේන මහතා.එතුමන් වගකීමෙන් ප්‍රකාශ කළා යුද්ධය අවසන් වීමට පෙර අවසන් වන සතියේ ජනාධිපතිතුමන්ද ආරක්ෂක ඇමතිතුමන්ද ආරක්ෂක ලේකම්තුමන්ද මෙරට නොසිටි බව.ඒ යුධ වකවානුවේ ඇමතිවරයෙක්ව සිටි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ට සැහෙන ප්‍රශ්න වලට මුහුණ පෑමට සිදුවුවා.එතුමන් ඒ අවස්ථාවේ රටට වියයුතු යුතුකම් ඉටුකිරීමක් ලෙස එම ගැටලු භාරගෙන කටයුතු කළා.ඇත්තෙන්ම අපි මෙතැනදී වැඩි වශයෙන් කතා කළ යුත්තේ අපේ නගර ප්‍රශ්න පිළිබඳවයි.ජගත් කුමාර මන්ත්‍රීතුමන් පැවසුවා අධිවේගී මාර්ග ඉදිකළ ඒවා ගැන. සභාපතිවරයකු ලෙස ඔබතුමන්ද මන්ත්‍රීවරු ලෙස අපද නගරය දියුණු කිරීමට කටයුතු කරනවා.ඒ වගේම ඕනෑම රජයක් අමාත්‍ය මණ්ඩල රටේ ජනතාගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා කටයුතු කරනවා.එක වරම අධිවේගී මාර්ග හැදෙන්නේ නෑ.ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සඳහා සිරිමාවෝ මැතිනියගෙන් පසු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය පත්වූවා.අධිවේගී මාර්ගයට මූලික වූයේ එතුමියයි.ඒ අනුව එතුමන්ට එය කළ හැකි වූවා.ඒ නිසා මහජන නියෝජිතයන් ලෙස අපට කළ හැකි සියලු දේ අපි කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මේ පිළිබඳ විවාද කළයුතු නෑ.නමුත් සරත් මන්ත්‍රීතුමන් කළ යෝජනාව කාලෝචිත යෝජනාවක් වනවා.පවතින රජයේ වැරදි තිබෙනවානම් ඒවා කිව යුතුයි.එහිදි නිලානි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ කරුණක් පිළිබඳ පැහැදිලි කළ යුතු වනවා.එතුමිය කියා සිටියා යුධ වකවානුවේ අවසන් සතියේ ජනාධිපතිතුමන් මෙරට නොසිටි බව.එකල සිටි හමුදාපති සරත් ෆොන්සේකා මහතා මාධ්‍යයට ප්‍රකාශ කළේ යුද්ධය අවසන් කොට සාජන්ලට කෝප්‍රල්ලට භාරදී ගිය බවයි.ඒ පිලිබඳ මා වෙනත් කිසිවක් ප්‍රකාශ කරන්නේ නෑ. සරත් මන්ත්‍රීතුමන්ගේ යෝජනාවට මාගේ එකගතාවය පළකර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,හදිසියේ ගෙන ආ මේ යෝජනාවට අත්සන් කොට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් මම එම මන්ත්‍රීවරුන් තිදෙනාට මාගේ ස්තුතිය පුද කර සිටිනවා. මෙහිදී සභාව තුළ ව්‍යාකූල තත්වයක් ඇති කිරීමට මා බලාපොරොත්තු වුයේ නෑ.මොකද මෙය ඉතාම විනයානුකූල සාමකාමී සභාවක් ලෙස තමයි ලංකාවේ ප්‍රසිද්ධ වී තිබෙන්නේ. මේ යෝජනාව නිසා එම තත්වය මදකට හෝ වෙනස් වූවානම් ඒ පිළිබඳ මා සමාව ඉල්ලා සිටිනවා.මේ කරුණේදී පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් කළ සියලු සහෝදර මන්ත්‍රීවරුන්ට මා ස්තුතිවන්ත වනවා.අපි මහින්ද රාජපක්ෂ මහතාටත් සහයෝගය ලබා දුන්නා.ඉන්පසු මෛත්‍රීපාල සිරිසේන මහතාටත් සහයෝගය ලබා දුන්නා.අපි එසේ සහයෝගය ලබාදුන්නේ යම් යම් වෙනස්කම් බලාපොරොත්තුවෙන්.ඩෙනට් මන්ත්‍රීතුමන් කියූ පරිදි එතුමන් මේ රජය හරහා මිලියන තුන්දහසක් ගමට ගෙනැවිත්

තිබෙනවා.ඇත්තෙන්ම එය හොද දෙයක්.ඒ වගේම විධායක බලය සහිත ජනාධිපතිවරයෙක් සතු අසීමිත බලයක් තිබෙනවා.අපි එදා සිටම කිවුවේ ඒ බලය වෙනස් කරන්න කියා.එවැනි කාරණා නිසා මේ ආකාරයෙන් තෙල් මිල බඩු මිල වෙනස් වනවා.රනිල් වික්‍රමසිංහ මහතාද කැමතියි බඩු මිල අඩු කිරීමට.නමුත් කර ගන්නට බෑ.එය තමයි සැබෑ තත්වය.ඔහුට පිට රටවලින් ණය නොගෙන මේ පාලනය ගෙන යාමට නොහැකියි.පිටරට වලින් ණය ගත් පසු අපි ඔවුන් කියන දේවල් කළ යුතුයි.මේ රටේ ධනපතීන් සිටින්නේ අතලොස්සක් පමණයි.ඔවුන් නිසා තමයි අපි දුක් විදිනනේ.බඩු මිල යන්නේ ඔවුන්ගේ උවමනාව මත.පිටරට සමාගම් වල අවශ්‍යතාවයන් මත.ධනපති රටවල් අපේ රටවල් වලට ණය දෙනවා.ඒත් සමගම උපාය උපක්‍රම ලෙස අසාර්ථක ව්‍යාපෘතිද අපට ලබා දෙනවා.ඒ ව්‍යාපෘති හරහා තමයි අප ණය වන්නේ.පාලකයින් සම්බන්ධ කරගෙන අසාර්ථක වාපෘති හරහා මිලියන ගණන් ණය දෙනවා.ඒ නිසා මෙතෙක් පාලනය කරන ලද පාලකයන් එවැනි අසාර්ථක ව්‍යාපෘති වලට හසුවී තිබෙනවා.මේ වන විටත් අපේ රටේ විශාල භූමි ප්‍රමාණයන් පිටරට වලට අවුරුදු ගණන් වලට ලබා දෙනවා.ඒ නිසා මෙවැනි තත්වයක් ඇති වීම රටට අවධානමක්.මීට අමතරව මෑත කාලයේ සිදුවුන බැදුම්කර වංචාවත් තවත් විනාශකාරී තත්වයක් වනවා.අපි කවුරුන් කැමති වුවත් නැතත් අපේ රටේ එවැනි දෙයක් සිදු වී තිබෙනවා.එයට යම් යම් අය වගකිව යුතුයි.ඒවායේ ප්‍රතිඵල විදින්නේ රටේ ජනතාව.බඩු මිල වැඩි වීමට මේවාද බලපානවා.අපේ අයිරාංගනී මන්ත්‍රීතුමිය කියා සිටියා පවුලේ හතර දෙනකු රජයේ රැකියාවක් කළොත් රු.40000/= ක් වැඩි වන බව.නමුත් එක් අයෙක්වත් රැකියාවක් නොකරන පවුල් ඕනෑතරම් තිබෙනවා.ඔවුන්ද සෑම භාණ්ඩයක් සදහාම බදු ගෙවනවා.ඔවුන්ට ඒවා බෙදී යන ක්‍රමයක් නෑ.සමව එකතු කරනවා.අසමානව බෙදනවා.එය තමයි මේ විනාශයට මුල.වහල් සමාජය විනාශ වී ධනපති ක්‍රමයට පරිවර්තනය වන වකවානුවේදී සමහර වහල්ලු කියා තිබෙනවා අපි වහල් හිමියකු නැතිව ජීවත් වන්නේ කෙසේද කියා.ඒ කියන්නේ ඔවුන් වහල් භාවයෙන් මිදෙන්න කැමති නෑ. අපේ රටේ මිනිස්සුත් සමහර වේලාවට ඒ වගේද කියා මට හිතෙනවා.ඒ අනුව රටේ මෙවැනි ප්‍රශ්න ඇති වී තිබෙන්නේ අතලොස්සකගේ උවමනාව මත.මේ සිටින පාලකයන්ද ඇමති මණ්ඩලයද කැමතියි මේ බඩු මිල අඩු කරන්න.නමුත් කර ගන්න නොහැකියි.අපේ පැත්තෙන් අපට අයිතියක් තිබෙනවා පාර්ලිමේන්තුවට බල කරන්න මේවා අඩු කොට ජනතාවට සහනයක් ලබා දෙන්න කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ යෝජනාව සදහා විරුද්ධ අය සිටිනවා නම් අත ඔසවන්න.
ඒ අනුව විපක්ෂව මන්ත්‍රීවරු නව දෙනෙක්ද, පක්ෂව මන්ත්‍රීවරු දස දෙනෙක්ද වශයෙන් යෝජනාව සම්මත කර සිටිනවා.

**තීරණය :**

**ඉන්ධන මිළ ,ගෑස් මිල ඇතුලු අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් ජනතාව මත මහත් ජීවන බරක් පැටවී ඇති බැවින් මේ සම්බන්ධයෙන් ආණ්ඩුවට මෙම ඉන්ධන , ගෑස් ඇතුලු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිළ අඩුකිරිමට වහා පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා විසින් කරන ලද යෝජනාව සදහා පක්ෂව ගරු මන්ත්‍රීතුමන්ලා 10 දෙනෙකු සහ මෙම යෝජනාවට විපක්ෂව මන්ත්‍රීමන්ලා 09 දෙනෙකු ජන්දය ලබා දී ඇති බැවින් වැඩි ජන්ද 01 කින් මෙම යෝජනාව සභා සම්මත විය.**

**12 :17** නගර සභාවට ඉඩමක් පවරා දීම සම්බන්ධයෙන් තල්ගස්ගොඩ එක්සත් සුභ සාධක සමිතියේ සභාපති එම්.ඩබ්.කුලසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018.08.21 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

එක්සත් සුභ සාධක සමිතිය නමට ඇති ඩිපෝ භූමිය අසළ බුදු මැදුර හා ප්‍රජා ශාලාව පිහිටි ඉඩම නගර සභාවට පැවරීමට එකගතාවය පළ කර ඇති අතර, නගර සභාවට පැවරීමෙන් පසු මෙම ඉඩම කිසිදු පෞද්ගලික පරිහරණයක් සදහා භාවිතා නොකොට හුදෙක් පොදු කටයුතු සදහා භාවිතා කිරීමට එකගතාවය පළ කරන ලෙසද ඉල්ලා තිබෙනවා.මෙම ඉඩමේ ඇති බුදු මැදුරත් ප්‍රජා ශාලාවත් එ ආකාරයෙන් ම පවත්වාගෙන යාමට නව ඉදි කිරීමක් කළහොත් එය ගම්වාසීන්ගේ අනු දැනුම මත ඔවුන්ගේ යහපත උදෙසා කිරීමට එකගතාවය පළ කරන ලෙසද වැඩිදුරටත් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් ඔප්පුවක් මගින් පවරා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව ආදායම් පරීක්ෂක මහතා සභාවට වාර්තා කොට තිබෙනවා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙහි සඳහන්ව තිබෙන්නේ දැනට සමිතියකට ඇති තල්ගස්ගොඩ ඩිපෝ එක ඉදිරිපිට තිබෙන ඉඩම පිළිබඳවයි.එම සමිතිය එකගතාවය පළ කොට තිබෙනවා මෙය නගර සභාවට පැවරීමට.නමුත් මෙම සමිතියට වත්කමක් නෑ මේ සඳහා යන මැනුම් ගාස්තු ආදී වියදම් දැරීමට.මේ සභාවට පැවරීමට සූදානම් වන්නේ විශාල වත්කමක්.ඒ නිසා එහි මැනුම් කටයුතු සඳහා යන වියදම් සභාවෙන් දැරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මෙහි එක් ඉඩම් කැබැල්ලක් ග්‍රාම සංවර්ධන සමිතිය සතුයි. ඒ නිසා මිනුම් කටයුතු සිදු කොට අපට අදාල කොටස වෙන්කර ගැනීම සඳහා යන වියදම සභාව මගින් සිදු කරන ලෙස මා නැවතත් ඉල්ලා සිටිනවා. ඔය සමිතිය සඳහා අපට මෙම ඉඩම ලබා දුන්නේ දැනට වැල්ලවත්තේ පදිංචි එවකට අම්බලන්ගොඩ පෝරඹ පදිංචිකරුවෙක් ඒ නිසා ඒ පරිත්‍යාග කළ පුද්ගලයාගේ නාමය තැබිය යුතුයි. දැනට වැල්ලවත්තේ රන්මුතු ජුවලර්ස් ආයතනයේ අයිතිකරු වන සරණපාල නම් වූ එම පරිත්‍යාගකරුගේ නාමයද සභාවට පරිත්‍යාග කිරීමේදී අපි රැක ගත යුතුයි. ඒ නිසා ඒ මිනුම් කටයුතු සිදුකොට එය සභාවට පවරා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අක්කරයක පමණ ඉඩමක් නගර සභාවට පරිත්‍යාග කිරීම සම්බන්ධව සතුටු වනවා. කුමන හෝ ක්‍රමයකින් එම ඉඩම පිළිබඳ ඒ පවුලේ අයෙකුට ආරංචි වී මට දුරකථනයෙන් කතා කළ අවස්ථාවේ කියා සිටියේ ඔවුන් අම්බලන්ගොඩ අක්කර 07 ක භූමි ප්‍රමාණයක් අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් පරිත්‍යාග කර ඇති බවයි.එම ලබාදුන් ඉඩමේ ඔප්පුවේ පිටපතක් නගර සභාවට ලබාදෙන ලෙස මා ඉල්ලීමක් කරනවා.ඒ පවුලේ සහෝදරයකු වන්නේ ඔබතුමන්ලා දන්නා හඳුනන ඩෙන්ටි එක අයිතිකරු වන ධම්මික ගුණරත්න මහතාගේ ඥාතිවරයෙක්.මෙය ඔහුගේ සීයාගේ ඉඩමක් නිසා ඔහු මට කතා කරල මේ ගැන විස්තර ඇහුවා.ඒ නිසා අපි මේ ස්ථානයේ ක්‍රීඩා භූමියක් ඉදි කරනවානම් උප සභාපතිතුමන් කියූ පරිදි අනිවාර්යයෙන්ම එය පරිත්‍යාග කළ පුද්ගලයාගේ නමින් පළ කළ යුතුයි.මොකද ඒ අය අපිට පරිත්‍යාග කොට තිබෙන්නේ බොහෝ වටිනා දේපළක්.ඒ දීපු සමිතිය මගින් සභාවට ඔප්පුවේ පිටපතක් ලබා ගන්නා ලෙස මා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.මා සමග එම පුද්ගලයා කියා සිටියේ මෙය ඔහුගේ සීයාගේ පරම්පරාවට අයිති ඉඩමක් බවත් මෙය අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා පරිත්‍යාග කළ බවත්ය.ඇත්තෙන්ම මෙය මුලින්ම පවරා තිබෙන්නේ නගර සභාවටයි.නමුත් ඒ අවස්ථාවේ සභාවෙන් එය අරගෙන නෑ.ඒ නිසා මෙහි ක්‍රීඩා පිටියක් ඉදි කරන්නේනම් එහි පරිත්‍යාගකරුගේ නමින් එය නම් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එහිදී ඔප්පුවේ පිටපතක් නගර සභාවට භාර දී මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න.මොකද එහි යම් යම් කොන්දේසි මාලාවක් සඳහන් බව ඔහු කියා සිටියා.එය ඔහුගේ මුතුන් මිත්තන් කියූ ආකාරයට ක්‍රියාත්මක විය යුතු බව පැවසුවා.ඔය ඉඩම ගැන සොයා බලන විට මට විස්තර ලැබුනේ ඩිපෝ ඉඩම පිළිබඳ විස්තරයි.මෙම ඉඩම අයිතිකරු පවසන්නේ ඔවුන් ඉඩම ජනතා සුභ සිද්ධිය වෙනුවෙන් ලබා දුන්නද දැන් එය විවිධ පුද්ගලයන් විසින් භාවිතා කරන බවයි.එසේනම් එය ගැටලුවක් වනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එසේනම් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මා කියන්නේ අක්කර 6 ඩිපෝ ඉඩම පිළිබඳව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙහි ඩිපෝව සඳහා අක්කර 06 ක් පවරා ගෙන තිබෙනවා.ඉතිරි කොටස තමයි සමිතිය සඳහා ලබා දී තිබෙන්නේ.ඔබතුමන් කියන්නේ වෙනත් ඉඩමක් සම්බන්ධවයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මීට අදාළව පවරන ලද ඔප්පුවක් අප වෙත ලබා දී තිබෙනවා. මීට අදාළ පිඹුරුපතද ඉදිරිපත් කොට තිබෙනවා.එහි අංක 01 සිට 05 දක්වා කැබලි පෙන්වා තිබෙනවා.එහි ලොට් අංක 05 යටතේ තිබෙනවා අක්කරයයි රූඩ් 20.8ක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මේ අක්කර 07 ක ඉඩමෙන් අක්කර 06 ක් එවකට සිටි දිසාපතිතුමන් 1979 වර්ෂයේ එවකට සිටි ඩිපෝ කළමණාකරුට ඔප්පුවකින් පවරා දී තිබෙනවා.එවිඑට අක්කරයයි රූඩ් දෙකක් තමයි අදාළ සමිතියට පවරා දී තිබෙන්නේ.අපි එහි ක්‍රීඩා පිටියක් හදනවානම් පරිත්‍යාගකරුගේ නමින් සැදිය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

එම ස්ථානයේ ක්‍රීඩා පිටියක් හදන්න බැරි වේවි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ඒත් දැනට ළමුන් මෙම ස්ථානයේ ක්‍රීඩා කරනවා.මම හිතනවා 2019 ප්‍රතිපාදන වලින් මේ සඳහා මටත් මහ ඇමතිතුමාටත් උදවු කරන්න පුලුවන් වේවි.අක්කර 07 ක් අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් පරිත්‍යාග කළ මිනිසුන් නිසා ක්‍රීඩා පිටිය සාදා ඒ නමින් නම් කිරීම සඳහා කවුරුත් විරුද්ධ වන එකක් නෑ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි මැනුම් කටයුතු සිදුකොට තිබෙන නිසා නැවතත් මැනිය යුතු වන්නේ නෑ.මැනිය යුතු වන්නේ අක්කරයයි පර්චස් 20 ක ප්‍රමාණයක් පමණයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ඒ භූමියේ අක්කරයක් තිබෙනවාද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අක්කරයක් තිබෙනවා.නමුත් මෙහි කොටසක් වෙල.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි සම්පූර්ණ ඉඩම අක්කරයයි රූඩ් 05 ක් තිබෙනවා.එයින් කැබලි 04 ක් ඉවත් කර තිබෙනවා.ඉතිරි කොටස ලෙස අක්කරයයි පර්චස් 20.8 ක් තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ඇත්තෙන්ම මෙය හොඳ යෝජනාවක්.ඒ නිසා ඒ ඉඩම් කැබැල්ලේ හරියට මැනුම් තිබෙනවානම් මායිම් ගසා එය වෙන් කර ගනිමු.ඉන්පසු ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම හරහා 2019 වසරේදී වෙන් කරන ප්‍රතිපාදන මගින් මටද දිය හැකි උපරිම සහයෝගය මා ලබා දෙන්නම්. ඒ වාගේම මහ ඇමතිතුමාගෙන්ද උපකාර අරගෙන ක්‍රීඩා පිටිය හදමු.මොකද ඒ පැත්තට ක්‍රීඩා පිටියක් නෑ.ඒ නිසා ඒ භූමි භාගය පවරා ගෙන පිත්‍යාගකරුගේ නම යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඔය ඉඩම මැද්දෙන් පාරක් තිබුනා.මමයි ඒ නඩුව සිදුකළේ.එහිදී අපි ස්ථානීය පරීක්ෂණයක් ඉල්ලූ අවස්ථාවේ අනෙක් පාර්ශවය ඒ සඳහා එකග වූයේ නෑ.එවිට අපි ඔවුනකට කියා සිටියා විකල්ප මාර්ගයක් සොයා අධිකරණයට කරුණු ඉදිරිපත් කරන ලෙස.අනෙක් පාර්ශය මේ ඉඩම මැද්දේ පාරෙන් බලෙන් ගමන් කරන නිසා ගම් වාසීන් මගෙන් මේ සඳහා විකල්පයක් අසනු ලැබුවා.එහිදී මා පැවසුයේ මෙය නගර සභාවට පවරන ලෙසයි.එහිදී මා කියා සිටියා මැනුම් කටයුතු සිදුකොට නගර සභාවට පවරන ලෙස.නඩුවෙහි මෙය පිට්ටනියක් කියා කියන විට මහේස්ත්‍රාත්තුමන් අසා සිටියේ මෙය නගර සභාව සතු පිට්ටනියක්ද කියා.නමුත් එය ඔප්පු කිරීමට සාධක මා සතු වූයේ

නෑ.මෙය භුක්තිය සම්බන්ධ නඩුවක් නිසා අපට භුක්තිය ලැබුනා.ඒ නිසා මෙය මේ අවස්ථාවේ සභාවට පවරා නොගතහොත් පරිත්‍යාගශීලීන්ගේ අභිමථාර්තය ඉටු කිරීමට හැකි වන්නේ නෑ.

**තීරණය**

**තල්ගස්ගොඩ 86 ඒ ග්‍රාම සේවා වසමේ එක්සත් සුභ සාධක සමිතියේ සභාපති එම්.කුලසිරි මහතා විසින් එම සමිතිය සතුව පවතින ඉඩම නගර සභාවට පවරා ගැනිමට කටයුතු කරන ලෙසට කරන ලද ඉල්ලිම සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව මෙම ඉඩමේ මැනුම් කටයුතු සභාව මගින් මුදල් ගෙවා සිදු කිරිමෙන් අනතුරුව ඔප්පුවක් මගින් පවරාගැනිමට කටයුතු කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය .**

**12.18 ප්‍රධාන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දක්ෂිණ නවෝදය වැඩ සටහනට අනුව අම්බලන්ගොඩ නගර සභාව සතු ඉඩම් පිළිබඳ තොරතුරු ලබා දීම** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද 2018.02.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත කී වැඩසටහන සඳහා අම්බලන්ගොඩ නගර සභාව සතු ඉඩම් පිළිබඳ තොරතුරු (ඉඩමේ ප්‍රමාණ, ග්‍රාම නිළධාරී වසම්, ඔප්පු පිළිබඳ, භාවිතය කුමටද යන්න, මායිම් පිළිබඳ , අනවසර කරුවන් විසින් අල්ලාගෙන ඇත්ද....) ඉල්ලා ඇති බැවින් එම තොරතුරු ලබා ගැනීම සඳහා අප සතු ඉඩම් වල වසර 35ක පිඹුරුපත් හා ඔප්පු ලබා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා තිබෙනවා.

**තීරණය**

**ප්‍රධාන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දක්ෂිණ නවෝදය වැඩසටහනට අනුව අම්බලන්ගොඩ නගර සභාව සතු ඉඩම් පිළිබඳ තොරතුරු අවශයව ඇති බැවින් මෙම තොරතුරු ලබා දිම සඳහා සභාව සතු සියලු ඉඩම්වල වසර 35 ක පිඹුරු පත් සහ ඔප්පු පිටපත් ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

➢ **ප.ව' 2.40ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

බී. ඒ. ධම්මිකා,<br>ලේකම්,<br>අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,<br>සභාපති,<br>අම්බලන්ගොඩ නගර සභාව.

**2018 -10–02** වන දින,<br>අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.